වාර්ෂික වාර්තාව 2017

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

පටුන....

පිටුව

අප ගැන..... 01
දැක්ම
මෙහෙවර
ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය..... 2
2017 වර්ෂයේ කැපී පෙනෙන සිදුවීම්..... 3-4
සභාපතිතුමාගේ පණිවුඩය..... 5
විධායක අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය..... 6-9
2017 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය..... 10
ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ
තිරසාර සංවර්ධනය සඳහා මානව සම්පත්..... 11-20
ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ තරගකාරීත්වය..... 21-25
පරිසරය ස්වභාවික සම්පත් සහ කෘෂිකර්මය..... 26-30
දරිද්‍රතාවය සහ අවදානම් සහගත භාවය..... 31-33
සංක්‍රමණය සහ නාගරීකකරණය..... 34-36
පෞද්ගලික අංශයේ සංවර්ධනය..... 37-39
TTI අරමුදල් සැපයීම යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්..... 40
පර්යේෂණ කණ්ඩායමේ නායකයින්..... 41
පර්යේෂණ කාර්ය මණ්ඩලය..... 42
ආචාර්ය සමන් කැලේගම මහතාගේ කාලරේඛාව..... 43-44
අන්තර්ජාතික ග්‍රන්ථ..... 45
දේශීය ග්‍රන්ථ..... 46
සහාය සේවා..... 47
මූල්‍ය සහ පරිපාලන
සන්නිවේදන සහ විහිදුම්
තොරතුරු පද්ධති
පුස්තකාලය
ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රකාශන..... 54
ප්‍රරතිපත්ති අධ්‍යයන ආයතනයේ සීමාවාසික සම්මන්ත්‍රණ..... 55-56
දේශීය ඉඳිරිපත්කිරීම්..... 57-60
විදේශ රටවල සිදුකළ ඉඳිරිපත්කිරීම්..... 61-62
පර්යේෂණ වලින් ඔබ්බට..... 63
මූල්‍ය වාර්තා..... 64

අප ගැන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය යනු ශ්‍රී ලංකාවේ ඇති ඉහළ ම ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ බුද්ධි මණ්ඩලය යි රට තුළ ප්‍රතිපත්ති කෙරෙහි යොමු වූ ආර්ථික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂණය ශක්තිමත් කිරීම මෙම ආයතනයෙහි අරමුණ වේ ස්වාධීන ආයතනයක් වන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආරම්භයේ සිට ම රජය, පෞද්ගලික අංශය, ශාස්ත්‍රඥයින් සහ සිවිල් සමාජය සමග සමීපව ක්‍රියාකරමින්, ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණයෙහි අධිකාරීත්වය සහිත ස්වාධීන හඬක් ලෙස සුවිශේෂී ස්ථානයක් හිමි කර ගෙන ඇති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආරම්භයේ සිට ම එහි කාර්ය මණ්ඩලය ක්‍රමානුකූලව ශක්තිමත් කරමින්, ඔවුන්ගේ හැකියාවන් සංවර්ධනය කරමින් එහි පර්යේෂණ ක්‍රියාකාරකම් විශාල වශයෙන් පුළුල් කර ඇති සමස්ත මූල්‍ය සහ පරිපාලන කළමනාකරණයෙහි සහ ආයතනයට ම අයත් පුස්තකාලය, ප්‍රකාශන, සන්නිවේදන සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් සහ තොරතුරු සන්නිවේදන පද්ධති ඒකක හරහා තොරතුරු සහ සම්පත් සම්පාදනය කිරීමෙහි ව්‍යක්තීය, සීමාවාසික උපකාරක සේවා පුළුල් කිරීම තුළින් ආයතනයෙහි පර්යේෂණ ප්‍රතිදානය ඌණපූරණය වී තිබේ

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික පරිණාමය සඳහා උත්ප්‍රේරකයක්යක් වන, ගෝලීය වශයෙන් පිළිගත් පර්යේෂණ ආයතනය බවට පත්වීම්

මෙහෙවර

සමාජ-ආර්ථික ගැටළු පිළිබඳ විශ්වාසනීය, තියුණු දැක්මක් සපයා දෙන, ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම මගින් අපගේ පාර්ශවකරුවන් දැනුවත් කිරීම සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර හැඩගැසීම සහ එමගින් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කිරීම

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය

ආචාර්ය රසින් සාලි මහතා,
සභාපති

ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක, සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලයේ ලී ක්වාන් යූ මහජන ප්‍රතිපත්ති පාසලේ බාහිර මහාචාර්ය

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා,
පාලක මණ්ඩලයේ සාමාජික

අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
(නිල බලයෙන්)

එම්.අයි.එම්. රෆීක් මහතා,
පාලක මණ්ඩලයේ සාමාජික

ලේකම්, ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යංශය (නිල බලයෙන්)

එස්.එස්. මුදලිගේ මහතා,
පාලක මණ්ඩලයේ සාමාජික

අධ්‍යක්ෂ ජෙනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
(නිල බලයෙන්)

ආචාර්ය සරත් රාජපතිරණ මහතා,
පාලක මණ්ඩලයේ සාමාජික

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ ආර්ථික උපදේශක

ආචාර්ය ගිහාන් දිසානායක මහතා,
පාලක මණ්ඩලයේ සාමාජික

එක්සත් රාජධානියේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ආයතනික පාලනය පිළිබඳ ඇඩම් ස්මිත් මහාචාර්ය

ආචාර්ය සමන් කැලේගම මහතා, විධායක අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
1995 - 2017

ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය, විධායක අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
2017 සිට (මේ දක්වා)

2017 වර්ෂයේ කැපී පෙනෙන සිදුවීම්

"දකුණු ආසියාවේ මානව ප්‍රාග්ධනය, ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික සංවර්ධනය" පිළිබඳ අන්තර්ජාතික සමුළුව

ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයෙහි සංවර්ධන ආර්ථික විද්‍යාව සහ තිරසරභාව මධ්‍යස්ථානය සහ දකුණු ආසියානු පර්යේෂණ ජාලය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජනවාරි **11 - 12** යන දිනවල කොළඹදී "දකුණු ආසියාවේ මානව ප්‍රාග්ධනය, ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික සංවර්ධනය" පිළිබඳ සමුළුවක් සංවිධානය කරන ලදී.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි විධායක අධ්‍යක්ෂ ආර්ථික ආදර්ශකරණය පිළිබඳ දකුණු ආසියානු ජාලයෙහි **2017** වර්ෂයේ ආර්ථික විද්‍යාඥයින්ගේ වාර්ෂික සමුළුවට සහභාගී වෙයි.

පෙබරවාරි **18-19** යන දිනවල බංග්ලාදේශයෙහි ධකා නුවර මොහකාලි නගරයේ BRAC Centre හෝටල් ශ්‍රවණාගාරයේදී "සමාජ අන්තර්කරණය සඳහා වර්ධනය කළමානාකරණය කිරීම" යන තේමාව යටතේ පවත්වන ලද ආර්ථික ආදර්ශකරණය පිළිබඳ දකුණු ආසියා ජාලයේ ආර්ථික විද්‍යාඥයින්ගේ දෙවැනි වාර්ෂික සමුළුවට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා සහභාගී විය.

ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දින සංසදය

ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දිනය සැමරීම පිණිස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ, ඩිජිටල් පාරිභෝගිකයින්ගේ, ව්‍යවසායකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව මාර්තු මස **15** වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයේදී 'ඩිජිටල් යුගයේ පාරිභෝගික අයිතිවාසිකම්' යන තේමාව කේන්ද්‍ර කර ගනිමින් සංසදයක් පවත්වන ලදී.

පන්ජාබ් ආර්ථික සංසදය

අප්‍රේල් මස **3 - 4** යන දිනවල පකිස්ථානයේ ලාහෝර් නුවර පවත්වන ලද පන්ජාබ් ආර්ථික සංසදයෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ආචාර්ය අතුල සෙනාරත්න මහතා සහභාගී විය. ක්‍රමසම්පාදන සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, පන්ජාබ් ආර්ථික පර්යේෂණ ආයතනය සහ ලාහෝර් නාගරික ඒකකය විසින් මෙම සංසදය සංවිධානය කරන ලදී.

දකුණු ආසියාවේ වර්ධනය වෙමින් පවතින ආහාර සුරක්ෂිතතාවය සහ ගුණාත්මක භාවය සම්බන්ධ අවදානම් පිළිබඳ වැඩමුළුව

අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සමග එක්ව ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් 'දකුණු ආසියාවේ වර්ධනය වෙමින් පවතින ආහාර සුරක්ෂිතතාවය සහ ගුණාත්මක භාවය සම්බන්ධ අවදානම්: ශ්‍රී ලංකාව සඳහා ඇති අභියෝග සහ අවස්ථා' යන මාතෘකාව යටතේ සංවිධානය කරන ලද වැඩමුළුවක් මැයි මස **8** සහ **9** යන දිනවල බත්තරමුල්ල වෝටර්ස් එජ් හිදී පවත්වන ලදී.

BRICS රටවල දේශපාලන පක්ෂ, බුද්ධි මණ්ඩල සහ රාජ්‍ය නොවන සංවිධාන සංසද

චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කමිටුවේ අන්තර්ජාතික දෙපාර්තමේන්තුව, රුසෘෂ්ඨ රටවල බුද්ධි මණ්ඩල සහයෝගීත්වය සඳහා වන චීන සභාව සහ අන්තර්ජාතික හුවමාරු සඳහා වන චීන රාජ්‍ය නොවන සංවිධාන ජාලය ඒකාබද්ධව සංවිධානය කර, 'පොදු සංවර්ධනය සහ දීප්තිමත් අනාගතයක් උදෙසා ඥානය සහ ප්‍රයත්නයන් බෙදාගැනීම්' යන මාතෘකාව යටතේ ජූනි **10 - 12** යන දිනවල දී චීනයේ හූෂූ නගරයේ පවත්වන ලද BRICS රටවල දේශපාලන පක්ෂ, බුද්ධි මණ්ඩල, සහ රාජ්‍ය නොවන සංවිධාන සංසදය සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය ගංගා තිලකරත්න මහත්මිය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූවාය.

ව්‍යාකූල තත්වයන් යටතේ වඩාත් කාර්යක්ෂම වෙළඳ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකා ආර්ථික සමුළුව **2017**

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වැඩබලන විධායක අධ්‍යක්ෂ ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය ජූලි මස **25 - 27** යන දිනවල කොළඹදී පවත්වන ලද '**2017** ශ්‍රී ලංකා ආර්ථික සමුළුවෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහභාගී වූවාය.

සංක්‍රමණය පිලිබඳ ගෝලීය ගිවිසුම: ශ්‍රී ලංකාව සඳහා ඉදිරි මග

සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානය විසින් සංවිධානය කර අගෝස්තු මස **8** වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ දී පවත්වන ලද සුරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම වැඩමුළුවේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය බිලේෂා විරරත්න මහත්මිය 'සංක්‍රමණය පිලිබඳ ගෝලීය ගිවිසුම: ශ්‍රී ලංකාව සඳහා ඉදිරි මගි යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය.

2017 ADB-ATTN සංවර්ධන සංසදයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික දෘෂ්ටිකෝණය අවධාරණය කරන ලදී

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වැඩබලන විධායක අධ්‍යක්ෂ ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය සැප්තැම්බර් **20 - 21** යන දිනවල කොළඹදී පවත්වන ලද **2017** ADB-ATTN සංවර්ධන සංසදය ඇමතුවාය. මෙම සංසදය පැවැත්වීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම සංවිධායකත්වය දැරුහ.

දකුණු ආසියාවේ අන්තර්කරණය වූ තිරසර සංවර්ධනයක් උදෙසා ආර්ථික ඒකාබද්ධතාවය පුළුල් කිරීම

'දකුණු ආසියාවේ අන්තර්කරණය වූ තිරසර සංවර්ධනයක් උදෙසා ආර්ථික ඒකාබද්ධතාවය පුළුල් කිරීම් යන්න නොවැම්බර් **14 - 16** යන දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවර පවත්වන ලද දහවැනි දකුණු ආසියා ආර්ථික සමුළුවේ තේමාව විය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂක විසින් දකුණු ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා ඇති පොදු අභියෝග අවධාරණය කරයි

දෙසැම්බර් මස **5 - 7** යන දිනවල පකිස්ථානයේ ඉස්ලමාබාද් නුවර දී පවත්වන ලද තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනයෙහි විසිවෙනි තිරසර සංවර්ධන සමුළුවෙහිදී ප්‍රරතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ නිලධාරි සමන්ති බණ්ඩාර මහත්මිය 'තිරසර සංවර්ධන ඉලක්ක: ප්‍රතිඥාව බලාත්මකව පවත්වා ගැනීම් නැමැති මාතෘකාව යටතේ පැවති සාකච්ඡා මණ්ඩලයේ දී ඉදිරිපත් කිරීමක් සිදු කළාය.

ආචාර්ය වීරකෝන් මහත්මිය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබුවාය

ආචාර්ය වීරකෝන් මහත්මිය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබුවාය. ඇය එම තනතුරට පත් වූයේ මෙම වර්ෂයේ ජූනි මාසයේදී අභාවප්‍රාප්ත වූ ගිටපු කීර්තිමත් ආර්ථික විද්‍යාඥයෙකු වූ ආචාර්ය සමන් කැලේගම මහතාගෙන් පසුව ය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාව: ආර්ථිකයේ තත්වය 2017 නැමැති ග්‍රන්ථය එළිදක්වයි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එහි ප්‍රධානතම වාර්තා වන ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය **2017** නැමැති ග්‍රන්ථය ඔක්තෝබර් මස **10** වැනි දින ආචාර්ය සමන් කැලේගම ශ්‍රවණාගාරයේදී එළි දක්වන ලදී. 'ජනවිකාශය, ශ්‍රම වෙළෙඳ පොළ සහ වර්ධනයි එම වාර්තාවෙහි ප්‍රධාන තේමාගත අවධානය විය.

නිෂා අරුණතිලක මහත්මිය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබුවාය

2018 ජනවාරි මස **01** වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආචාර්ය නිෂා අරුණතිලක මහත්මිය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ අධ්‍යක්ෂ ලෙස පත්වීම් ලැබුවා ය.

සභාපතිතුමාගේ පණිවුඩය

ආචාර්ය රසීන් සාලි
සභාපති

මෙම වර්ෂය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට සංක්‍රාන්ති වර්ෂයක් විය. අපගේ හිටපු කෘතහස්ත විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා අපට දායාද කළ දේ තවමත් නොවෙනස්ව පවතී. ආචාර්ය කැලේගම මහතා 2017 ජූනි මාසයේදී අභාවප්‍රාප්ත විය. එතුමා සිහිපත් කිරීම පිණිස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සැමරුම් ගණනාවක් පවත්වන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් පවත්වන ලද ප්‍රසිද්ධ දේශනය සහ 2018 ජූනි මාසයේ දී පවත්වන ලද දෙ දින සමුළුව ඒ අතරින් ඉතාමත් වැදගත් අවස්ථා විය. මෙම සමුළුවෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ ඉතා වැදගත් ප්‍රකාශනයක් එළි දැක්වෙනු ඇත.

ශ්‍රී ලංකාව මුහුණ දෙන කෙටි කාලීන දැඩි ආර්ථික ගැටළු සම්බන්ධයෙන් ස්වකීය කාර්ය භාරය ඉටු කිරීමට අමතරව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින විවිධ වූ සහ අධෛර්යමත් කරවන ස්භාවයේ මධ්‍ය කාලීන සිට දීර්ඝ කාලීන දක්වා වූ ව්‍යූහාත්මක ආර්ථික අභියෝගයන් පිළිබඳව ද අවධානය යොමු කරයි.

2017 වර්ෂය අගභාගයේ දී ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි විධායක අධ්‍යක්ෂ වශයෙන්ද, ආචාර්ය නිෂා අරුණාතිලක මහත්මිය පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් ද පත්වීම් ලැබූහ. එම දෙදෙනා සහ එම දෙදෙනාගේ සහෝදර කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති, ආයතන සහ කාර්ය සාධනය පිළිබඳ ගුණාත්මක, අපක්ෂපාතී විශ්ලේෂණ සපයා දීමට අඛණ්ඩව කටයුතු කරති.

ශ්‍රී ලංකාව මුහුණ දෙන කෙටි කාලීන දැඩි ආර්ථික ගැටළු සම්බන්ධයෙන් ස්වකීය කාර්ය භාරය ඉටු කිරීමට අමතරව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින විවිධ වූ සහ අධෛර්යමත් කරවන ස්භාවයේ මධ්‍ය කාලීන සිට දීර්ඝ කාලීන දක්වා වූ ව්‍යූහාත්මක ආර්ථික අභියෝගයන් පිළිබඳව ද අවධානය යොමු කරයි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සහ ශ්‍රී ලංකාවට මෙන්ම පුළුල් වශයෙන් මෙම කලාපයට ද එමගින් අත්කර දෙන ප්‍රතිඵල අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ වැඩි දියුණු කිරීමට මම ද, ආයතනයේ පාලක මණ්ඩලයේ මගේ සහෝදර සාමාජිකයින් ද ආචාර්ය වීරකෝන් මහත්මියට සහ ඇගේ කණ්ඩායමට අඛණ්ඩව පූර්ණ සහයෝගය ලබා දෙන්නෙමු.

විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව

ආචාර්ය දුෂ්නි වීරකෝන්

ආචාර්ය සමන් කැලේගම මහතා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ ලෙස සේවය කරමින් සිටියදී 2017 ජූනි 23 වැනි දින හදිසියේ අභාවප්‍රාප්ත වීම අපිට බරපතළ සංවේගය දනවන කරුණක් විය. ඒ මහතා තායිලන්තයේ බැංකොක් නුවර ඔහ-ෆික්ෂ හි පැවති සමුළුවකට සහභාගී වෙමින් සිටියදී හදිසියේ සහ අකාලයේ මිය යෑම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සියලු දෙනාට ඉතාමත් වේදනාකාරී සහ බරපතළ පාඩුවක් විය. කැලේගම මහතා ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හි ද සිටින එතුමාගේ මිතුරන්ගේ සහ සගයින්ගේ කෙතරම් ගෞරවයට සහ ආදරයට පාත්‍ර වී සිටියේද යන්න එතුමාගේ වියෝවත් සමග ගලා ආ අතිමහත් ශෝක පණිවිඩ සංඛ්‍යාවෙන් මනාව පැහැදිලි විය.

ආචාර්ය කැලේගම මහතාගේ දීර්ඝ සහ අග්‍රගණ්‍ය වූ වෘත්තීය සේවාව ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හා සම්බන්ධ වී තිබුණ ද, ඒ මහතාගේ වෘත්තීය සේවාව තුළින් ලබා දුන් ඉතා වැදගත් දායකත්වය රාජ්‍ය අංශයට පමණක් නොව පෞද්ගලික අංශයට පවා විහිදී ගියේය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ න්‍යාය පත්‍රයෙහි කොටසක් ලෙස 2017 වර්ෂයෙහිදී වැදගත් ප්‍රකාශන ගණනාවක් එළිදක්වනු ලැබිය. මෙම වසරේදී ❑ජනවිකාශය, ශ්‍රම වෙළඳ පොළ සහ වර්ධනය“ යන තේමාව යටතේ පළ කරන ලද, මෙම ආයතනයෙහි ප්‍රධානතම ප්‍රකාශනය වන ❑ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය“ නැමති ප්‍රකාශනය ද ඒ අතර විය.

එතුමාගේ අකල් වියෝව සිදුවන අවස්ථා වන විට පවා ඒ මහතා සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අන්තර්ජාතික වෙළඳාම සඳහා වන නියෝජිතායතනයෙහි සභාපති (නම් කළ) වශයෙන් ඉන්දියාව, චීනය සහ සිංගප්පූරුව සමග ශ්‍රී ලංකාව එළඹෙන නිදහස් වෙළඳ ගිවිසුම් වල ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ප්‍රධාන සාකච්ඡාකරු වශයෙන් ද කටයුතු කළේය. එපමණක් නොව, එතුමා මෑත කාලීනව ජාතික ආර්ථික සභාවේ සාමාජිකයෙකු වශයෙන් ද ජනාධිපති බදු කොමිසමෙහි සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරමින් එතුමාගේ දායකත්වය ලබාදුන්නේය. තවද පෞද්ගලික අංශයට ද තම දායකත්වය ලබා දුන් කැලේගම මහතා, එතුමාගේ වියෝව සිදුවන අවස්ථාව වන විට ද සිංගර් ශ්‍රී ලංකා සමාගමේ සභාපති ධූරය ඇතුළුව

සංස්ථාපිත ආයතන ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩලවල විවිධ තනතුරු දැරුවේය. ශාස්ත්‍රඥයෙකු වශයෙන් ද කටයුතු කළ එතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය සහ සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ පර්යේෂණ මධ්‍යස්ථානය, සහ සංවර්ධන සහ පාරිසරික ආර්ථික විද්‍යාව සඳහා වන දකුණු ආසියානු ජාලය වැනි පර්යේෂණ සහ ශික්ෂණ ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද සේවය කළේය. ආචාර්ය සමන් කැලේගම මහතාගේ නාමය හා බැඳී පවතින ඉහත සඳහන් කළ සියලු ගෞරවාන්විත සම්බන්ධකම් තිබුණ ද, එතුමා වඩාත්ම ප්‍රසිද්ධියක් ලබා සිටියේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා වශයෙනි. 1995 වර්ෂයේදී ඒ මහතාට බාර වූ ආරම්භක අවධියේ තිබූ අර්ධ රාජ්‍ය ආයතනයක් එතැන් පසුව එළඹි කාලය තුළදී ජාතික වශයෙන් කීර්තියට පත් සහ ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක් වූ ස්වාධීන පර්යේෂණ ආයතනයක් බවට පරිවර්තනය කිරීමට හැකි වීම එතුමා ලැබූ විශිෂ්ඨතම ජයග්‍රහණය විය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය අත්කර ගත් එම දියුණුව සඳහා අඩිතාලම දමනු ලැබුවේ ආචාර්ය කැලේගම මහතා යි. ඒ මහතා පර්යේෂණ සඳහා අවශ්‍ය කෞශල්‍යය ආකර්ෂණය කර ගැනීම පිණිස ස්වාධීන පර්යේෂණ සඳහා අවශ්‍ය නිදහස් මතධාරී පරිසරයක් ස්ථාපනය කර පවත්වාගෙන ගියේය; එමෙන්ම, පරිත්‍යාග අරමුදලක් පිහිටුවා, සුභ පතන්නන්ගේ මූල්‍ය සහයෝගය ලබා ගනිමින් ප්‍රතිපත්ති අධ්‍යන ආයතනය සඳහා මූල්‍ය ස්වාධීනත්වයක් සුරක්ෂිත කර දුන් ඒ මහතා, ආයතනය තව දුරටත් පුළුල් කිරීමේ ක්‍රියාකාරකම් වලට සහාය විය හැකි පරිදි, ආයතනයෙහි ම අවශ්‍යතායන්ට අනුව ගොඩනගන ලද කාර්යාල පරිශ්‍රයක් තුළ ආයතනය ස්ථාපනය කරමින් ආයතනයේ දීර්ඝ කාලීන ස්වශක්තතාව සහතික කළේය. ආචාර්ය සමන් කැලේගම මහතා ප්‍රතිපත්ති අධ්‍යාපන ආයතනය වෙත ලබා දුන් විශිෂ්ඨ නායකත්වය තුළින් සහ එතුමා තුළ තිබූ දැඩි කැපවීම මත අප වෙත මෙවැනි වරප්‍රසාද පිරිනමා දීම වෙනුවෙන් මම සමස්ත සමස්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් එතුමාට අප තුළ ඇති ණය ගැති භාවය සහ දැඩි කෘතවේදීත්වය පළ කිරීමට කැමැත්තෙමි. එතුමාගේ වියෝව අපට පිරිමැසිය නොහැකි අඩුවක් වන නමුත් අපි එතුමාගේ පරමාදර්ශ සහ විශ්වාස අඛණ්ඩව ම ඉදිරියට ගෙන යාමට කැප වෙමින්, එතුමා සැමවිටම ප්‍රාර්ථනා කළ පරිදි ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඉහළින්ම වැජඹෙන ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට අපි කැපවී සිටින්නෙමු.



2017 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විවිධ ආකාරවලින් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති ක්ෂේත්‍රයට ඉතා වැදගත් දායකත්වයක් ලබා දී ඇත. සකස් කෙරෙමින් පවතින ඉහළ මට්ටමේ ජාතික ප්‍රතිපත්ති රාමු දෙක ම කෙටුම්පත් කිරීමේ කාර්යයන් සඳහා දායකත්වය ලබා දීම පිණිස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඉතාමත් සුවිශේෂී ස්ථානයක තබා තිබේ. එම ඉහළ මට්ටමේ ජාතික ප්‍රතිපත්ති රාමු දෙක වන්නේ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ සැලසුම් කෙරෙන '2025 දැක්ම - පොහොසත් රටකී නැමති මෙරට සඳහා වන මධ්‍ය කාලීන ආර්ථික දැක්ම සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ මෙහෙයවීම යටතේ සැලසුම් කෙරෙන 'තිරසර ශ්‍රීලංකාවක්: 2030 දැක්ම' නැමති දීර්ඝ කාලීන සමාජ-දේශපාලනික සහ ආර්ථික දැක්ම වේ. මෙම වැදගත් ලියවිලි දෙකෙන් ම ආවරණය කෙරෙන විවිධ ක්ෂේත්‍ර හරහා පැතිරුණු ප්‍රතිපත්ති ගැටළු පරාසයක් සඳහා අවශ්‍ය යෙදවුම් සපයා දීමේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ වැඩසටහන්වල පුළුල් බව සහ ගැඹුරු බව අතිශය ප්‍රයෝජනවත් වන බව පැහැදිලිව තහවුරු වී තිබේ.

එයට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රම බලකාය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය පිළිබඳව කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සඳහා ද, තෝරාගත් අග්නිදිග ආසියානු රටවල් කීපයක් සමග නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ ශක්‍යතා තක්සේරු සම්බන්ධයෙන් සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සඳහා ද, තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය සඳහා ද, විදේශ ප්‍රේෂණ ලබන ගෘහයන්ගේ ඉතිරි කිරීමේ සහ ණය ගැනීමේ රටාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහා ද ඇතුළුව විවිධ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සඳහා පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම හෝ සංක්ෂිප්ත වාර්තා සකස් කර දීම සිදු කරන ලදී.

ප්‍රතිපත්ති සංවර්ධන කමිටුවලට සිය පර්යේෂකයින් සහභාගී කරවීම තුළින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සපයා දුන් සෘජු ආදානයන් මගින් ආයතනය ශ්‍රී ලංකා රජයට සපයා දුන් දායකත්වය තව දුරටත් වර්ධනය කර තිබේ. මෙම ආයතනයෙහි වැදගත් සහ ක්‍රියාකාරී නියැළීම් සමහරක් පහත සඳහන් වේ: (1) ශ්‍රම බලකායෙහි සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා වන කාර්ය සාධක බලකාය, ජාතික මානව සම්පත් සංවර්ධන සභාව; (2) ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුව, විදේශ රැකියා අමාත්‍යාංශය; (3) උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිසම: (4) සමාජ-ආර්ථික විද්‍යාව සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ ජාතික කමිටුව, කෘෂිකර්ම අමාත්‍යාංශය; (5) ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුව, ජනාධිපති ලේකම් කාර්යාලය; (6) තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදේශක කමිටුව, තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය; සහ (7) දේශගුණික විපර්යාස බලපෑම් සඳහා ජාතික අනුවර්තන

සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව, පරිසර අමාත්‍යාංශය.

2017 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන හවුල් කරුවන් සමග එහි ඒකාබද්ධ පර්යේෂණ ජාලයන් ගොඩනැඟීමට අඛණ්ඩව කටයුතු කළේය. දේශගුණික විපර්යාස පිළිබඳව සහ කෘෂිකර්ම ක්ෂේත්‍ර අදාළව ආපදා අවදානම් අඩුකිරීම සම්බන්ධයෙන් මෙන්ම දේශගුණික විපර්යාසවල බලපෑම නාගරික ප්‍රතිපත්තිවලට සංකලනය කළ හැකි ආකාර පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ද විශේෂයෙන් සැලසුම් කළ පර්යේෂණ සිදු කිරීම භාර ගැනීම හරහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ඔහ-ජ්ඉසඒඑ වැනි එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමග පවතින හවුල්කාරිත්වයන් තවදුරටත් ශක්තිමත් කර ගන්නා ලදී. සංක්‍රමණය සම්බන්ධ ක්ෂේත්‍රය සලකා බැලීමේදී, සංක්‍රමණය පිලිබඳ ගෝලීය ගිවිසුමක් සකස් කිරීම සම්බන්ධයෙන් මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කර්මාන්තයෙහි නියැළී සිටින බඳවා ගැනීමේ අතරමැදියන්ගේ කාර්යභාරය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ද වූ පර්යේෂණ සිදු කිරීම මගින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානය සමග එක් ව කටයුතු කළේය. එමෙන්ම, යුනිසෙෆ් සංවිධානය සමග එක්ව මෙම ආයතනය වයස්ගත වූවන්ගේ සේවා නියුක්තිය, ජීවන තත්වයන් සහ ශුභසාධන කාර්යයන් සම්බන්ධයෙන් ද පර්යේෂණ කටයුතු සිදු කරන ලදී.

ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි බහුපාර්ශ්වික නියෝජිතායතන සමග ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යයන ගණනාවක් සිදු කරන ලදී. ලෝක බැංකුව සමග එක්ව, බදු ක්‍රමය වෙනස් වීම මගින් ගෘහයන්ට ඇතිවන බලපෑම පිළිබඳව දැනට ක්‍රියාත්මක කරමින් තිබෙන අධ්‍යයනය මෙන්ම ශ්‍රී ලංකාවේ වෙළඳ හැඩගැසීම් මගින් දේශීය සේවකයන් මත ඇති කෙරෙන බලපෑම් වැනි නව ගැටළු පිළිබඳව ද අධ්‍යයන සිදු කරන ලදී. එයට අමතරව, ආසියානු සංවර්ධන බැංකුව සමග එක්ව තවත් පර්යේෂණ අධ්‍යයන ගණනාවක් ද සිදු කරන ලදී. ද්විත්ව භිගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඓතිහාසිකව පවතින ගැටළුව පිළිබඳ සාර්ව ආර්ථික විශ්ලේෂණයක් මෙන්ම නිපුණතා සහ උසස් අධ්‍යාපනයට අදාළව මානව සම්පත් සංවර්ධන ක්ෂේත්‍රය පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොළ පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් වැනි අනෙකුත් පර්යේෂණ ගණනාවක් ද මෙම අධ්‍යයනවලට ඇතුළත් විය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි අධ්‍යයනවල විෂය පථය 2017 වර්ෂයෙහි දී ද පෞද්ගලික අංශය කෙරෙහි ප්‍රබල ලෙස යොමුවී පැවතුණි. විවිධ සංස්ථාපිත ආයතන වල ඉල්ලීම මත ආයතන වල අවශ්‍යතාවය අනුව සැලසුම් කළ පර්යේෂණ අධ්‍යයන අතර විශ්‍රාම පහසුකම් සඳහා ශ්‍රී ලංකාවේ වර්ධනය වෙමින් පවතින ඉල්ලීම සපුරාලීම සඳහා ශ්‍රී ලංකාව සතු විභවතාවය, ආහාර ක්ෂේත්‍රයේ පාඳිය අධ්‍යයන සිදු කිරීම මෙන්ම මෙරට කිරි නිෂ්පාදන අංශය සඳහා උපාය මාර්ග ික සැලැස්මක් සකස් කිරීම ආදී නව ක්ෂේත්‍රවල අධ්‍යයන් ද ඇතුළත් විය. එමෙන්ම, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයෙහි ආර්ථික ප්‍රතිපත්ති මෙහෙයුම් කමිටුවේ සාමාජිකත්වය සහ එහි වෙළඳ ලිහිල්කරණ මෙහෙයුම් කමිටුවේ සාමාජිකත්වය තුළින් ප්‍රතිපත්ති යෙදවුම් සපයා දෙන ලදී. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද '2017 ශ්‍රී ලංකා ආර්ථික සමුළුව' ද ඇතුළුව විවිධ ඉහළ මට්ටමේ පෞද්ගලික අංශ සංසද සඳහා සම්පත් පුද්ගලයින් ලෙස සහභාගී වීම අනිකුත් ආකාරවල ඒකාබද්ධ කටයුතුවලට ඇතුළත් විය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ න්‍යාය පත්‍රයෙහි කොටසක් ලෙස, 2017 වර්ෂයේදී වැදගත් ප්‍රකාශන ගණනාවක් එළිදක්වන ලදී. මෙම ආයතනයෙහි ප්‍රධානතම වාර්ෂික වාර්තාව වන, 'ජනවිකාශය, ශ්‍රම වෙළෙඳ පොළ සහ වර්ධනයී යන තේමාව යටතේ ප්‍රකාශයට පත් කළ 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වයී නැමැති වාර්ෂික වාර්තාව ද එයට ඇතුළත් විය. එමෙන්ම ආචාර්ය සමන් කැලේගම මහතා විසින් සංස්කරණය කරන ලද 'ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිපත්තිය: ආර්ථික දෘෂ්ඨි කෝණයනී නැමැති ග්‍රන්ථය ද එතුමාගේ අභාවයෙන් පසුව පළ කරන ලදී. එයට අමතරව, **'Talking Economics Digest'** නැමැති සඟරාවේ නිකුතු දෙකක් ද සමග, නොවිධිමත් අංශවල සේවා නියුක්තිය, පාසල් අධ්‍යාපනය සහ සාමාන්‍ය පෙළ ප්‍රතිඵල, අධ්‍යාපනයෙහි ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය, සහ කාන්තාවන් හිමිකාරිත්වය දරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යන ක්ෂේත්‍රවල ගැටළුවලට ආමන්ත්‍රණය කෙරෙන පර්යේෂණ පත්‍රිකා හතරක් ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන විසින් පළ කරන ලදී. එමෙන්ම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් 2017 වර්ෂයේ දී බාහිර ආයතන වලට ලබා දුන් ප්‍රකාශන අතර සහෝදර ආයතන විසින් පළ කරනු ලබන අන්තර්ජාතික සඟරා සඳහා ලිපි හතරක් ද, පොත් සඳහා පරිච්ඡේද නවයක් ද, කාර්ය පත්‍රිකා තුනක් ද ඇතුළත් විය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සංනිවේදන සහ ප්‍රතිපත්ති විහිදුම් ක්‍රියාකාරකම් තුළින් ආයතනයෙහි පර්යේෂණ පිළිබඳ අවබෝධය ශක්තිමත් කිරීම සඳහා දරන ලද ප්‍රයත්නයන් 2017 වර්ෂයේදී තවදුරටත් වර්ධනය විය. එම ක්‍රියාවලිය කාර්යක්ෂම සහ අනුකූල කරන ලද අතර, විහිදුම් ක්‍රියාකාරකම් අදාළ පාර්ශවකරුවන් වෙත ළඟා වෙන පරිදි වඩා හොඳින් ඉලක්ක කරන ලදී. පර්යේෂණ තුළින් සොයාගත් ප්‍රධාන කරුණු පිළිබඳව මාධ්‍ය දැනුවත් කිරීමේ සාකච්ඡා පැවැත්වීම, මාධ්‍ය සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට පර්යේෂණ සාක්ෂි ඉදිරිපත් කිරීම, සහ සම්මුඛ සාකච්ඡා සහ සාකච්ඡා මණ්ඩල සඳහා සහභාගී වීම තුළින් විද්‍යුත් මාධ්‍යවල පෙනීසිටීම වැඩි කිරීම ආදිය නව ක්‍රියාකාරකම් වලට ඇතුළත් විය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ම ක්‍රියාත්මක කිරීමට නියමිත ක්‍රියාකාරකම් වලට සමගාමීව ඕකනසබට ඍජුබදපසපි වෙබ් අඩවියෙහි පළ කරන තොරතුරු සහ ජාතික සහ

අන්තර්ජාතික මට්ටමේ සමුළුවලදී ඉදිරිපත් කරනු ලබන ඉදිරිපත් කිරීම් ආදිය හරහා ක්‍රියාත්මක කෙරෙමින් පවතින විහිදුම් වැඩසටහන් තුළින් මෙම ක්‍රියාකාරකම් හඳුන්වා දෙන ලදී. 'ආසියා පැසිෆික් කලාපයේ තිරසර නාගරිකකරණය සඳහා අරමුදල් යෙදවීම් යන මාතෘකාව යටතේ පවත්වන ලද පස් වැනි ආසියානු සංවර්ධන බැංකු - ආසියානු බුද්ධි මණ්ඩල ජාල සංවර්ධන සංසදය 2017 සහ ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලය ඒකාබද්ධව සත්කාරකත්වය දරන ලද 'දකුණු ආසියාවේ මානව ප්‍රාග්ධනය, ආහාර සුරක්ෂිතතාවය සහ ආර්ථික සංවර්ධනයී යන තේමාව යටතේ පවත්වන ලද අන්තර්ජාතික සමුළුව එවැනි අන්තර්ජාතික සමුළුවලට අයත් විය.

පෙර වර්ෂවලදී මෙන් ම 2017 වර්ෂයේ දී ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි බොහෝ ක්‍රියාකාරකම් වලට සහාය වීම පිණිස තින්ක් ටැන්ක් ඉනිෂටිව් (ඔඔෂ) සංවිධානයෙන් ලැබුණු ප්‍රධාන අරමුදල් සැපයීම ආයතනයට බොහෝ සෙයින් ප්‍රයෝජනවත් විය.

අධ්‍යාපනය, සේවා නියුක්තිය සහ සෘජු විදේශ ආයෝජන යන ක්ෂේත්‍රයන්හි ඇති ගැටළු සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා සිදුකරන ලද වැදගත් පර්යේෂණ අධ්‍යයනයන්ගෙන් කිහිපයක් ඔඔෂ අරමුදල් සැපයීම යටතේ සිදු කරන ලදී. 2017 වර්ෂයේදී දියත් කරන ලද නව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන වෙබ් අඩවියක් සහ පර්යේෂණ සහ සහායක කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් ද ඇතුළත් සන්නිවේදන කාර්යයවලින් බොහොමයක් ඔඔෂ කාර්ය සැලැස්ම යටතේ ක්‍රියාත්මක කරන ලදී. 2018 වර්ෂයේ සිට ක්‍රමයෙන් ඔඔෂ අරමුදල් සැපයීම අවසන් වීමත් සමග ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙම ක්‍රියාකාරකම් ආයතනයෙහි සම්පත් සහ අමතර පර්යේෂණ ආදායම් යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීමට සූදානම්ව සිටියි. 2017 වර්ෂයේ දී පර්යේෂණ අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ව්‍යාපෘති ආදායම ඉහළ යාමත් සමගම මූල්‍ය කාර්ය සාධනය ද වැඩි දියුණු වූ අතර එමගින් ආයතනයට රුපියල් මිලියන 14.6 ක සමස්ත අතිරික්තයක් වාර්තා කර ගැනීමට හැකි විය.

ආයතනයට සිදු වූ වේදනාකාරී සහ අනපේක්ෂිත අහිමි වීම හමුවේ වුව ද ආයතන කාර්ය මණ්ඩලයෙහි කැපවීම තුළින් 2017 වර්ෂය පුරාවට අපගේ කාර්ය වැඩසටහනෙහි හරය සාර්ථකව ක්‍රියාත්මක කර ඇති බවට මෙය සාක්ෂියක් වේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන කාර්ය මණ්ඩලය තනි තනිව මෙන්ම කණ්ඩායමක් වශයෙන් ද ආයතනයෙහි දියුණුව වෙනුවෙන් දායකත්වය ලබා දුන්නේ කෙසේද යන්න පිළිබඳ උදාහරණ ගණනාවක් මෙම වර්ෂයේ වාර්ෂික වාර්තාවේ අඩංගු වේ. මෙසේ අත්කර ගෙන ඇති ජයග්‍රහණ පිළිබඳව සලකා බැලීමේදී අපිට ආඩම්බර විය හැකි බොහෝ දේ තිබේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි 2017 වර්ෂයේ සිදුවූ අනපේක්ෂිත පරිවර්තනය හමුවේ වුව ද නොමද සහයෝගය ලබා දුන් ආයතනයෙහි කැපවීමෙන් කටයුතු කරන කාර්ය මණ්ඩලය සහ පාලක මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය මෙයින් පිරිනමමි. එමෙන්ම ආචාර්ය සමන් කැලේගම මහතාගෙන් පසුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි විධායක අධ්‍යක්ෂ ධූරය භාර ගැනීමට ලැබීම මහත් භාග්‍යයක් කොට සලකමි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සංවාදයෙහි ස්වාධීන හඬක් ලෙස ශක්තිමත් කිරීම සඳහා ඒ මහතා තුළ තිබූ ළැදියාවට සහ භක්තියට අපි මහත් සේ ගෞරව කරන්නෙමු.



දුෂ්නි වීරකෝන්
විධායක අධ්‍යක්ෂ

2017 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය:

සහභාගී වූ සමූළු/සම්මන්ත්‍රණ

163

සමූළු/සම්මන්ත්‍රණවලදී සිදු කරන ලද ඉදිරිපත් කිරීම්

129

සම්පූර්ණ කරන ලද පර්යේෂණ අධ්‍යයන

25

භාර දෙන ලද නව පර්යේෂණ යෝජනා

34

සහෝදර ආයතනවලින් පළ කරන සඟරා සඳහා ලබා දුන් ලිපි

13

පොත් සඳහා රචනා කළ පරිච්ඡේද

07

ජනප්‍රිය පුවත්වල පළ කළ ලිපි

327

සංවිධානය කළ සමූළු

11

අපගේ පර්යේෂණ

සාධාරණත්වය සහ දිළිඳුකම තුරන් කිරීම යන තිරසර වර්ධනයෙහි මූලික ප්‍රතිපත්ති අරමුණු ඉටු කර ගැනීම පිණිස ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින මධ්‍ය කාලීන සිට දීර්ඝ කාලීන දක්වා වූ සංවර්ධන අභියෝගයන් පිළිබඳ ඒකාබද්ධ විශ්ලේෂණයක් සපයා දීම අපගේ පර්යේෂණවල ප්‍රධාන අවධානය වේ. මෙම පර්යේෂණ වැඩසටහන් පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ විහිදී තිබේ: (1) සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය, (2) අන්තර්ජාතික ආර්ථික ප්‍රතිපත්තිය, (3) ශ්‍රමය, රැකියා නියුක්තිය සහ මානව සම්පත් සංවර්ධනප්‍රතිපත්තිය, (4) කර්මාන්ත, තරඟකාරීත්වය සහ නියාමන ප්‍රතිපත්තිය, (5) දරිද්‍රතාවය සහ සමාජ සුබසාධන ප්‍රතිපත්තිය, (6) කෘෂිකාර්මික ආර්ථික ප්‍රතිපත්තිය, (7) පාරිසරික ආර්ථික ප්‍රතිපත්තිය, සහ (8) සෞඛ්‍ය ආර්ථික ප්‍රතිපත්තිය. මෙම ප්‍රතිපත්ති ගැටළු තේමාගත පර්යේෂණ ක්ෂේත්‍ර 6 ක් යටතේ පරීක්ෂා කරනු ලැබේ:

ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය සහ තරගකාරීත්වය

සංක්‍රමණය සහ නාගරිකකරණය

තිරසර සංවර්ධනය සහ මානව සම්පත්

පෞද්ගලික අංශයේ සංවර්ධනය

දරිද්‍රතාවය සහ අවදානම් සහගත බව

පරිසරය, ස්වාභාවික සම්පත් සහ කෘෂිකර්මය

තිරසර සංවර්ධනය සහ මානව සම්පත්

තිරසර සංවර්ධනය සඳහා මානව සම්පත්

කුඩා ආර්ථිකයක් වන ශ්‍රී ලංකාවට ශක්තිමත්ව පවත්වා ගත හැකි ඉහළ සාමාන්‍ය වර්ධන අනුපාතයක් අත්කර ගැනීම පිණිස ගෝලීය වෙළඳ පොළෙහි තරගකාරීව සිටීම අවශ්‍ය වේ. වැටුප් ඉහළ යමින් පවතින තත්වයක ලාභදායී ශ්‍රමය පිළිබඳ අඛණ්ඩව තරඟ කිරීම ශ්‍රී ලංකාවට තවදුරටත් ප්‍රායෝගික විකල්පයක් නොවේ. ඒ වෙනුවට, ආර්ථිකයේ ඵලදායීත්වය සහ තරගකාරීත්වය වැඩි දියුණු කිරීම පිණිස වෙළෙඳ පොළ තාක්ෂණික දියුණුව සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා පහසුකම් සැලසීම සිදු කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, උසස් පුහුණුවක් සහිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා සහ ශ්‍රම වෙළඳ පොළ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා සමාජ ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීම ඉතාමත් වැදගත් වේ. තවද, සියලු දෙනා සඳහා වඩා උසස් සෞඛ්‍ය පහසුකම් සහ ආර්ථික සම්පත් සඳහා ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම වර්ධනය දිරිමත් කිරීම සඳහා උපකාරී වනු ඇත. අධ්‍යාපනය, සෞඛ්‍යය, ශ්‍රමය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය යන ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති හරහා මෙරට තරගකාරීත්වය වැඩි දියුණු කිරීමට උපකාරී වන දැනුම නිර්මාණය කිරීම පිළිබඳව මෙම පර්යේෂණය ක්ෂේත්‍රය මගින් අවධානය යොමු කෙරෙයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික නිෂා අරුණතිලක සහ පර්යේෂණ නිලධාරී අෂානි අබයසේකර යන මහත්මීන් 'සුදුසුකම් ලත් සහ පළපුරුදු ගුරුවරුන්ගේ හිඟයි යන මාතෘකාව යටතේ නොවැම්බර් 28 වැනි දින ප්‍රතිපත්ති අධ්‍යන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහනෙහිදී.

පර්යේෂණාවල අවධානය

ශ්‍රම වෙළඳපොළ

2016 - 2017 ගෝලීය තරඟකාරීත්වය පිළිබඳ වාර්තාව අනුව, කාර්යක්ෂම ශ්‍රම වෙළඳ පොළ යනු ආර්ථිකයක තරඟකාරීත්වය ප්‍රවර්ධනය කරන කුළුණු දොළහෙන් එකක් වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළෙහි ව්‍යූහය අවිධිමත් අංශය කෙරෙහි වැඩියෙන් නැඹුරු වී තිබෙන අතර, එම අංශයෙහි සේවා නියුක්තිය 60% ට ආසන්න වේ. වෙළඳ පොළ බලවේගයන්ට හැඩ ගැසීම සඳහා නම්‍යශීලී භාවයක් නොමැති වීම, පුහුණු රැකියා නිර්මාණය වීමක් නොමැති වීම සහ පුහුණුව රැකියාවලට නොගැළපීම ආදිය වර්ධනය සීමා කරන සාධක ලෙස හඳුනා ගෙන ඇත. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ මගින් ශ්‍රම වෙළඳ පොළෙහි කාර්යක්ෂමතාවය සීමා කරන සාධක පිළිබඳව සොයා බලනු ලැබේ.

අධ්‍යාපනය

රැකියා වෙළඳ පොළෙහි ඉල්ලුම පවතින රැකියා සඳහා අවශ්‍ය සේවකයින් බිහි කිරීමට හැකි වන පරිදි මෙරට වර්තමාන අධ්‍යාපන ක්‍රමය නවීකරණය කිරීම සහ වඩාත් කාර්යක්ෂම කිරීම අවශ්‍ය වේ. මෙරට ජනගහනයෙන් සියයට අසූ හතක් පමණ දෙනා තෘතීයික මට්ටමේ කිසිදු අධ්‍යාපන සුදුසුකමක් ලබා නොමැති බව 2012 සංගණන දත්ත මගින් පෙන්වා දෙයි. රජය විසින් අපේක්ෂා කරනු ලබන නවීන, කාර්යක්ෂම ආර්ථිකයක් සාක්ෂාත් කර ගැනීම පිණිස විශ්වවිද්‍යාල මෙන්ම වෘත්තීය මට්ටමේ පුහුණු අපේක්ෂා කරන්නන් සඳහා තෘතියික අධ්‍යාපන අවශ්‍යතා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කළ යුතු වේ. මේ පාසල් මට්ටමේ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම මගින් මේ සඳහා පදනම දැමිය යුතු වේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ මගින් සියලු දෙනා සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් යන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සීමා කරවන සාධක පිළිබඳ සොයා බලනු ලැබේ.

සෞඛ්‍යය සහ වයස්ගත වීම

පසු ගිය දශක කිහිපය මුළුල්ලෙහි ම ශ්‍රී ලංකාව සෞඛ්‍යාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා කැපවී කටයුතු කර ඇත. කෙසේ වෙතත්, අනෙකුත් කරුණු අතර, මන්දපෝෂණය අධික ලෙස පැවතීම, පාලනය නොකළ වසංගත සහ බෝ නොවන රෝග මෙම ක්ෂේත්‍රයට බරක් වී තිබේ. එමෙන්ම, ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනයෙහි වැඩි වීම බෝ නොවන රෝග පැවතීමේ ප්‍රශ්නය සහ දීර්ඝ කාලීන රැකවරණය සැපයීමේ අවශ්‍යතාවය තව දුරටත් උග්‍ර කර තිබේ. එමෙන්ම, තිරසර සංවර්ධන ඉලක්කවල තුන්වැනි ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා පමණක් නොව, රටෙහි ආර්ථික, සමාජයීය, පාරිසරික සහ මානව සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ද සියලු දෙනාගේ සෞඛ්‍යය සහ සුභසාධනය ඉතාමත් වැදගත් වේ. මෙම සන්දර්භය තුළ, බෝ නොවන රෝග සහ දීර්ඝ කාලීන රැකවරණය අවශ්‍යතා සම්බන්ධ අභියෝගවලට ආමන්ත්‍රණය කිරීම සහ සෞඛ්‍යය සම්බන්ධ තිරසර සංවර්ධනය ඉලක්ක ශ්‍රී ලංකාව

තුල ක්‍රියාත්මක කිරීම සඳහා ඇති සූදානම ඇගයීම මෙම වර්ෂයෙහි ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණවල ප්‍රධාන අවධානයන් වී ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය

'අපගේ ලෝකය පරිවර්තනය කිරීම: තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයී නැමති පශ්චාත් 2015 සංවර්ධන න්‍යාය පත්‍රය යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සවි බල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සාක්ෂාත් කරගැනීම ගෝලීය අරමුණක් ලෙස පිළිගෙන තිබේ. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව හොඳින් කටයුතු කර නැත. දේශපාලන සවිබල ගැන්වීමෙහි සහ ආර්ථික සහභාගිත්වයෙහි ඇති අඩු කාර්ය සාධනය ප්‍රධාන වශයෙන්ම මෙයට හේතු වන බව පවතින දත්ත මගින් පෙන්වා දෙයි. මෙම සන්දර්භයෙහි දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ පර්යේෂණ මගින් ප්‍රධාන වශයෙන්ම කාන්තාවන් ආර්ථික කටයුතු වලට සහභාගී වීම සවිබල ගැන්වීම සහ ඒ ආශ්‍රිත ගැටලු කෙරෙහි අවධානය යොමු කරයි.

පර්යේෂණ අධ්‍යයන

ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සැපයීම යටතේ නිෂා අරුණතිලක, සුනිමාලි මදුරාවල, ප්‍රියංකා ජයවර්ධන සහ නෙලූකා ගුණසේකර විසින් "ශ්‍රම වෙළෙඳ පොළ විශ්ලේෂණය" යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනය ශ්‍රී ලංකාවේ මධ්‍යකාලීන ක්‍රම සම්පාදන ක්‍රියාවලිය සඳහා හවුල්කාරිත්ව උපාය මාර්ගයක් සකස් කිරීමට සහාය වීම පිණිස පවත්වන ලද ආසියානු සංවර්ධන බැංකුවේ වර්ධන හඳුනා ගැනීමේ අධ්‍යයනවලින් එකකි. මෙරට ශ්‍රම වෙළඳ පොළ පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම සහ අන්තර්කරණය වූ ආර්ථික වර්ධනයක් සඳහා බැඳීම් ඇතිකරවන බාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙහි අරමුණ විය. ශ්‍රම බලකායෙහි වර්ධනය දුර්වල වීම වැළැක්වීම සඳහා කාන්තාවන්, තරුණයින් සහ වයස්ගත පුද්ගලයින් ශ්‍රම බලකායට සහභාගී වීම වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව ක්‍රියාමාර්ග ගත යුතු බව මෙම පර්යේෂණය මගින් සොයා ගන්නා ලදී. එමෙන්ම, ශ්‍රී ලංකාව පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම සඳහා, විශේෂයෙන්ම විධිමත් පෞද්ගලික අංශය සඳහා පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීමට පහසුකම් සැලසීම පිළිබඳව විමසා බැලිය යුතුය.

"ජීවත් වීමට සරිලන වැටුපක් ලැබීම පිළිබඳ අධ්‍යනය - වැවිලි ක්ෂේත්‍රය තුළ ජීවත් වීමට සරිලන වැටුපක් ලැබීම සම්බන්ධ ඇස්තමේන්තුව" යනු ජීවන චේතනය පිළිබඳ ගෝලීය සංධානයෙහි අරමුදල් සැපයීම යටතේ සිදු කරන ලද අධ්‍යයනයකි. නිෂා අරුණතිලක, මනෝජ් තිබ්බටුවාව, ප්‍රියංකා ජයවර්ධන සහ නෙලූකා ගුණසේකර යන මහත්ම මහත්මීන් විසින් මෙම අධ්‍යනය සිදු කරන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ අධ්‍යයනය මගින් ඇන්කර් ක්‍රමවේදය යොදා ගනිමින් 2015 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ තේ වතු ආශ්‍රිත ප්‍රදේශවල වතු කම්කරුවන් සඳහා ජීවත් වීමට සරිලන වැටුපක් ඇස්තමේන්තු කරන ලදී. මෙම ක්‍රමවේදය අනුව ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් සහ පාවහන් සෞඛ්‍යය සහ අධ්‍යාපනය, අනෙකුත් අත්‍යාවශ්‍ය වියදම් සහ අනපේක්ෂිත සිදුවීම් ආදිය සඳහා වියදම් ද ඇතුළුව මූලික, එහෙත් සෑහෙන මට්ටමක ජීවන රටාවක් සඳහා වන ඒක පුද්ගල වියදම ඇස්තමේන්තු කරන ලදී. මෙම මිණුම් දණ්ඩ තේ කර්මාන්තයේ දැනට පවතින අවම වැටුප සමග සංසන්දනය කරන ලදී. වතු කම්කරුවන් ලබන වැටුප එලෙස තක්සේරු කරන ලද ජීවත් වීමට සරිලන වැටුපට වඩා තරමක් පහළ බව මෙම අධ්‍යයනය මගින් සොයා ගන්නා ලදී. කෙසේ වෙතත්, මෙම අධ්‍යනය සිදු කරන අවස්ථාව වන විට වතු ක්ෂේත්‍රයේ වැටුප් සංශෝධනය කිරීම සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පැවතුණි.

ප්‍රියංකා ජයවර්ධන මහත්මිය විසින් "ජනතාව විධිමත් නොවන ක්ෂේත්‍රයේ රැකියා වලට සහභාගී වීමට තෝරා ගන්නේ මන්ද" (ඔඹෂ අරමුදල් සැපයීම යටතේ සිදු කළ ව්‍යාපෘතියකි) යන මාතෘකාව යටතේ සිදුකරන ලද පර්යේෂණය මගින් අස්ථිර රැකියා අංශයෙහි පවතින ප්‍රවණතා සහ අස්ථිර රැකියා සේවක සුභසාධනය කෙරෙහි බලපාන්නේ කෙසේද යන්න පිළිබඳ විමර්ශනය කෙරෙයි. අනෙකුත් රටවල මෙන්, අනියම් සේවකයින් බඳවා ගැනීම සහ බාහිරින් සේවා ලබාගැනීම (අස්ථිර රැකියා) ශ්‍රී ලංකාවේ ද බොහෝ දුරට පවතින තත්ත්වයක් බවට පත්වී තිබේ. තවද, සේවකයින්ගෙන් විශාල ප්‍රමාණයක් අස්ථිර රැකියාවල නියැළීම තෝරා ගන්නේ මන්ද යන්න ද එමගින් විමර්ශනය කෙරෙයි. අවිධිමත් රැකියාවල නියැළීම අස්ථාවර සේවා නියුක්තිය, අඩු වැටුප් සහ දුර්වල සමාජ ආරක්ෂණ තත්ත්වයන් ඇති වීමට හේතු වන බව මෙම අධ්‍යනය මගින් සොයාගන්නා ලදී. මෑත කාලීනව පෞද්ගලික අංශයෙහි රැකියාවල වර්ධනය වඩාත්ම සිදුවී ඇත්තේ තාවකාලික සහ අනියම් රැකියා සඳහා බව ද මෙම පර්යේෂණය මගින් තව දුරටත් සොයා ගෙන තිබේ. අඩු උගත්කමක් සහිත නුපුහුණු සේවකයින් සහ ශ්‍රම වෙළඳ පොළට අලුතින් එකතු වන පුද්ගලයින් අස්ථිර ස්වභාවයෙහි රැකියාවල නියැළීමෙහි වැඩි ප්‍රවණතාවයක් තිබන බව ද මෙම අධ්‍යයනය මගින් සොයා ගෙන ඇත.

"ප්‍රමුඛ ආර්ථික සහ සමාජයීය ඉලක්ක වලට සහාය වීම පිණිස ආර්ථික පර්යේෂණ සංවර්ධනය කිරීම - ශ්‍රී ලංකාව" (TTI/ඔස්ට්‍රලියානු තිළිණ අධිශාස්ත්‍රීය සාමාජිකත්ව වැඩසටහන යටතේ අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද) 'ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශයේ ශ්‍රම හිගය පිළිබඳ ආනුභාවික විමර්ශනයකී නැමති අධ්‍යයනය ලෝක බැංකුව විසින් සිදු කරන ලද දීපව්‍යාප්ත නියැදි සමීක්ෂණයක් යොදා ගනිමින් සුනිමාලි මදුරාවල මහත්මිය විසින් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශයෙහි පවතින ශ්‍රම හිගයෙහි ස්වභාවය සහ එයට හේතු

හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙහි අරමුණ විය. රැකියා සඳහා ඇති ඉහළ ඉල්ලුම එහි සැපයුම හා නොගැළපීම, රැකියා සඳහා බොහෝ දුරක් ගමන් කිරීමට කාන්තාවන් තුළ ඇති අකමැත්ත, නිදහස් වෙළඳ කළාපවල සේවය කිරීම හා සම්බන්ධව පවතින සමාජ අපකීර්තිය මෙන්ම තරුණ කාන්තාවන්ගේ අපේක්ෂාවන් වෙනස් වෙමින් පැවතීම ආදිය මෙරට නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි පවතින ශ්‍රම හිඟයට බලපා ඇති ප්‍රධාන හේතු බව මෙම අධ්‍යනය මගින් සොයා ගෙන තිබේ.

ලෝක බැංකු අරමුදල් සැපයීම මත නිෂා අරුණතිලක මහත්මිය විසින් "ශ්‍රී ලංකාවේ වෙළඳ කම්පනයන්ට සේවකයින්ගේ හැඩගැසීම්" යන මාතෘකාව යටතේ සිදු කරන ලද පර්යේෂණය, කලාපයෙහි වෙළඳ කම්පනයන් සඳහා ශ්‍රම වෙළෙඳ පොළෙහි හැඩගැසීම් තක්සේරු කිරීම පිණිස සිදු කරන ලද දකුණු ආසියානු කලාපීය පර්යේෂණයක කොටසක් විය. මෙම පර්යේෂණය. එමගින් 1990 දශකයේ සිට වර්තමානය දක්වා වෙළඳ කම්පනයන් ශ්‍රම වෙළඳ පොළට බලපා ඇති ආකාරය පිළිබඳව ඇති මත වලින් පාඩම් ලබා ගත්තේය. එමෙන්ම, මෙරට සේවා නියුක්තිය කෙරෙහි ගෝලීය ආර්ථික පසුබෑම මගින් ඇති කෙරෙන බලපෑම සම්බන්ධයෙන් තිබෙන සාහිත්‍ය ඉතා සීමිත බව ද මෙම අධ්‍යනය මගින් සොයා ගන්නා ලදී. ගෝලීය ආර්ථික පසුබෑම නිසා ප්‍රධාන වශයෙන්ම නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියා අහිමි වීම සිදුවන බව මෙම අධ්‍යනය මගින් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, ශ්‍රම සැපයුම කෘෂිකර්මය සහ තොග හා සිල්ලර වෙළඳාම වැනි අවිධිමත් ක්ෂේත්‍රවල රැකියා වෙත මාරු වීම නිසා මෙරට විරැකියාව කෙරෙහි එම පසුබෑමෙන් ඇති කෙරෙන බලපෑම ඉතා සීමිත වේ.

එක්සත් ජාතීන්ගේ කාන්තාවෝ සංවිධානයෙහි, ජාතික කම්කරු අධ්‍යයන ආයතනයෙහි සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි අරමුදල් සැපයීම මත සිදුකරන ලද "කාන්තා ශ්‍රමිකයන් සඳහා ආයතන වලින් ඇති ඉල්ලුම" පිළිබඳ අධ්‍යයනය මගින් කාන්තා ශ්‍රම බලකායෙහි අඩු සහභාගීත්වය පිළිබඳව අවධානය යොමු කරන අතර ඒ සම්බන්ධයෙන් මෑත කාලීනව මෙරට ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සැළකිලිමත් වීම විමසා බැලෙයි. නිෂා අරුණතිලක මහත්මිය (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය), ඒ. විමලවීර මහතා (කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය), ඊ. එල්. කේ. දිසානායක මහතා (මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුව) සහ එච්. ආර්. එස්. එල්. රණතුංග මහතා (ජන සංඛ්‍යා හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) විසින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම ගැටළුවට ආමන්ත්‍රණය කෙරෙන බොහෝ අධ්‍යයන සැපයුම සම්බන්ධ දෘෂ්ටි කෝණයකින්ම මෙම ගැටළුව විමසා බලන අතර, ඒ සම්බන්ධයෙන් ඉල්ලුම පැත්තෙන් ප්‍රමාණවත්ව දත්ත නොතිබීම එයට ප්‍රධාන හේතුව වේ. මෙම අධ්‍යයනයෙහිදී මෙම ගැටළුව දෙස ආයතන වල දෘෂ්ටි කෝණයෙන් බලනු ලැබීය.

මහාචාර්ය මිලන් වොදොපිවෙක්, ස්ලොවේනියාවේ ප්‍රිමෝර්ස්කා විශ්වවිද්‍යාලයේ සහ සමාජ සහ ව්‍යාපාර අධ්‍යයනය සඳහා වන අන්තර්ජාතික පාසලහි මහාචාර්ය, සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ අධ්‍යක්ෂ නිෂා අරුණතිලක ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවෙහිදී

කාන්තාවන් විශේෂිත කර්මාන්ත සහ යම් යම් රැකියාවන් ස්ව කැමැත්තෙන් තෝරා ගන්නා බව මෙම අධ්‍යයනයෙහි දී සොයා ගෙන ඇත. දීර්ඝ වැඩ කරන පැය ගණන සහ වැඩ මුර ක්‍රමය වැනි යම් යම් සේවා කොන්දේසි නිසා සමහර රැකියාවන්ට කාන්තාවන් ආකර්ෂණය නොවෙති. අවශ්‍ය පුහුණුවට අමතරව පවුල් ප්‍රතිබාධන, ආරක්ෂාව පිළිබඳ ගැටළු, සේවා ස්ථානවල පිහිටීම සහ මාතෘ ප්‍රතිලාභ ආදිය සේවායෝජකයින් විසින් කාන්තාවන් සේවයෙහි යෙදවීම පිළිබඳ ගනු ලබන තීරණවලට බලපා ඇති ප්‍රධාන සාධක වී තිබේ.

ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සංවිධානයෙහි අරමුදල් සැපයීම යටතේ "නායකත්වය සඳහා ශ්‍රී ලාංකික ගැහැණු ළමයින් සහ තරුණ කාන්තාවන් ආර්ථිකමය සහ සමාජමය වශයෙන් සවිබල ගැන්වීම" යන මාතෘකාව යටතේ පවත්වන ලද අධ්‍යයනය නිෂා කරුණාතිලක සහ සුනිමලී මදුරාවල යන මහත්මීන් විසින් සිදු කරන ලදී. දේශපාලනයට සහ කළමනාකරණ තනතුරු සඳහා කාන්තා සහභාගීත්වය නොතිබීමට හේතු සහ ශ්‍රම වෙළෙඳ පොළ සඳහා කාන්තාවන් සහභාගී වීම අඩු මට්ටමක තිබීමට හේතු ශ්‍රී ලංකාවේ ගැහැණු ළමයින් සහ තරුණ කාන්තාවන් දේශපාලනික, ආර්ථික සහ සමාජමය වශයෙන් සවිබල ගැන්වීමේ කෝණයකින් මෙතෙක් විශ්ලේෂණය කර නැත. මෙවන් පසුබිමක් තුළ විවිධ මට්ටම්වලදී කාන්තාවන් නායිකාවන් ලෙස ඉස්මතු වීමේ දී මුහුණ දෙනු ලබන ප්‍රධාන බාධක හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය තුළින් උත්සාහ දරා ඇත. ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික අවස්ථා නොතිබීම, නාගරික ප්‍රදේශවල තිබෙන ආර්ථික අවස්ථාවන්හි නම්‍යශීලී භාවයක් නොතිබීම, අවශ්‍ය පුහුණුව නොතිබීම, මූල්‍ය සාක්ෂරතාව නොතිබීම සහ ගිවිස ගැනීමේ කුසලතා නොතිබීම ආදිය කාන්තාවන් ආර්ථික ක්‍රියා සඳහා සහභාගී වීමට බාධා ඇති කරවන සාධක ලෙස මෙම අධ්‍යනය මගින් සොයා ගෙන තිබේ. තවද, යොවුන් පුද්ගලයින් සඳහා වඩාත් පරිපූර්ණ ප්‍රජනන සෞඛ්‍ය දැනුමක් සපයා දීම, දෙමාපියන්ගේ වඩා

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ප්‍රියංකා ජයවර්ධන මහත්මිය අගෝස්තු 24 වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයෙහි පැවති පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවෙහිදී

හොඳ අධීක්ෂණයක් තිබීම, නීතිය බලාත්මක කිරීමේ ආයතන ප්‍රජා මට්ටමේදී වැඩි වශයෙන් සම්බන්ධ වීම, සහ ගැහුණු ළමා සහ කාන්තා ආදර්ශ චරිත ප්‍රවර්ධනය කිරීම ආදිය සමාජ සවිබල ගැන්වීම සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු ක්ෂේත්‍ර ලෙස ද මෙම අධ්‍යනය මගින් සොයාගෙන තිබේ.

"ආර්ථිකයෙහි තත්වය 2017" සඳහා IPS Core පර්යේෂණ පහසුකම / TTI අරමුදල් සැපයීම යටතේ සිදු කරන ලද " පෞද්ගලික අමතර ඉගැන්වීම්" පිළිබඳ ප්‍රතිපත්ති සංක්ෂිප්තය මගින් අතිරේක පෞද්ගලික ඉගැන්වීම් රටා සහ ධාවක පිළිබඳ විමසා බැලීමට, එහි ධනාත්මක සහ සෘණාත්මක මානයන් පිළිබඳ අවබෝධ කර ගැනීමට සහ එහි ඇති පුළුල් ගම්‍යමානයන් කෙරෙහි ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු කරවීමට අපේක්ෂා කෙරුණි. පෞද්ගලික අමතර අධ්‍යාපනය ලබාදීම ලෝකයේ බොහෝ රටවල ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින තත්ත්වයක් බව ද, අධ්‍යාපනය සඳහා වැඩි වැඩියෙන් ආයෝජන සිදු කිරීම මගින් ප්‍රධාන විභාග වලදී ඉතා ඉහළ ප්‍රතිඵල අත්කර ගැනීමට සහ වරප්‍රසාද ලත් යැයි සැලකෙන ද්විතියික පාසල් සහ විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් වීමට අවස්ථාව සැලසෙන බව විශ්වාස කිරීම එයට ප්‍රධාන හේතුව වී ඇති බව ද මෙම විශ්ලේෂණය මගින් හෙළි වී තිබේ. පෞද්ගලික අමතර අධ්‍යාපනය ලබාදීමෙහි තිබෙන සුබවාදී සහ අසුබවාදී බලපෑම් යන ප්‍රතිඵල දෙකම හඳුනාගෙන තිබේ. පෞද්ගලික අමතර අධ්‍යාපනය ලබාදීමෙහි ප්‍රවණතා පිළිබඳ පරිපූර්ණ දත්ත ලබා ගැනීම, අධ්‍යාපන විෂයමාලාව සහ ඇගයීම් ක්‍රමවේදය ප්‍රතිසංස්කරණය කිරීම සහ පෞද්ගලික අමතර ඉගැන්වීම් කර්මාන්තය නිසි පරිදි නියාමනය කිරීම ආදිය සඳහා ඇති අවශ්‍යතාවය ප්‍රතිපත්ති ගම්‍යමානයන්ට ඇතුළත් වේ. අෂානි අබේසේකර විසින් මෙම අධ්‍යනය සිදු කරන ලදී.

TTI/ අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයෙහි අරමුදල් සැපයීම යටතේ නිෂා අරුණතිලක සහ ශානි අබේසේකර විසින් සිදු කරන ලද "ශ්‍රී ලංකාවේ පාසල්වල ලක්ෂණ සහ ශිෂ්‍ය කාර්ය සාධනය" නැමති අධ්‍යනය ශ්‍රී ලංකාව පුරා ඇති පාසල්වල පාසල් මට්ටමෙන් තිබෙන සම්පත් සහ ද්විතියික මට්ටමේ අධ්‍යාපන ප්‍රතිඵල අතර සම්බන්ධයක් තිබේද යන්න පිළිබඳව විමසා බැලීම සහ ශිෂ්‍ය කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා වඩාත්ම බලපාන සම්පත් මොනවාද යන්න හඳුනා ගැනීම යන අරමුණු ඇතිව සිදු කරන ලදී. පාසලෙහි සිටින සුදුසුකම් ලත් සහ පළපුරුදු ගුරුවරුන් හා විදුහල්පතිවරුන් ප්‍රමාණය, ගුරුවරුන්ගේ නිවාඩු, පාසලේ විශාලත්වය සහ පාසල වරප්‍රසාද සහිත වීමේ මට්ටම ද ඇතුළු පාසල් මට්ටමේ විවිධ සාධක ගණනාවක් අධ්‍යාපන ප්‍රතිඵල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන බව මෙම අධ්‍යනයෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරයි. කුඩා සහ අඩු වරප්‍රසාද ලත් පාසල් සඳහා වැඩි වැඩියෙන් සම්පත් සපයා දීමේ අවශ්‍යතාවය, ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ ගුණාත්මක භාවය වැඩි කර ඔවුන් පාසල් අතර සමසේ බෙදී යන සේ වෙන් කර දීම සහ ගුරුවරුන්ගේ නොපැමිණීම අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ආදී අවශ්‍යතාවයන් ප්‍රතිපත්ති ගම්‍යමානයන්ට ඇතුළත් වේ.

නිෂා අරුණතිලක සහ අශානි අබේසේකර විසින් සිදු කරන ලද ශ්‍රී ලංකාවේ සියලුම පන්ති කාමර සඳහා ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු ගුරුවරුන් සපයා දීමේ අභියෝගය නැමැති අධ්‍යයනය මගින් පළාත් පුරා විවිධ පාසල් කාණ්ඩ තුළ ද්විතියික මට්ටමේදී ගණිතය, ඉංග්‍රීසි සහ විද්‍යාව යන විෂයන් ඉගැන්වීම සඳහා සිටින ගුරුවරුන්ගේ ප්‍රමාණාත්මක බව පිළිබඳ විමසා බලන ලදී. එමෙන්ම විවිධ කාණ්ඩවලට අයත් පාසල් සඳහා ගුරු වැටුප් වෙනුවෙන් රජය විසින් දරනු ලබන වියදම බෙදී යන ආකාරය ද මෙම පර්යේෂණය මගින් විශ්ලේෂණය කරයි. විවිධ විෂයයන් ඉගැන්වීම සඳහා සිටින ගුරුවරුන් සංඛ්‍යාව ජාතික මට්ටමෙන් ප්‍රමාණවත්

වන නමුත් ක්ෂේත්‍රයේ සිටින පළපුරුදු ගුරුවරුන් සංඛ්‍යාව එම ගුරුවරුන් සඳහා දැනට තිබෙන ඉල්ලුමට ප්‍රමාණවත් නොවන බව මෙම අධ්‍යයනය මගින් සොයා ගෙන තිබේ. එමෙන්ම ගුරුවරුන් ස්ථානගත කිරීම සහ සුදුසුකම් ලත් ගුරුවරුන් සඳහා වැටුප් වෙනුවෙන් රජය දරනු ලබන වියදම විවිධ පාසල් කාණ්ඩ අතර සම සේ බෙදී නොයන බවද මෙම පර්යේෂණය මගින් තවදුරටත් සොයා ගෙන තිබේ.

ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සැපයීම යටතේ සේවා නියුක්ති අනාවරණ අධ්‍යයනය සඳහා ප්‍රියංකා ජයවර්ධන සහ සුනිමලී මදුරාවල විසින් "ලංකාවේ නිපුණතා සහ උසස් අධ්‍යාපනය" යන මාතෘකාව යටතේ සිදුකරන ලද අධ්‍යයනය මගින් උසස් අධ්‍යාපනය පිළිබඳව මෙන්ම පද්ධති, ආයතන, පාලන සහ ප්‍රතිපත්ති රාමු පිළිබඳව ද අවධානය යොමු කරමින් අධ්‍යාපන අංශයේ ව්‍යූහය ආවරණය කරන ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය පිළිබඳ ඇගයීමක් සිදු කරයි. ශ්‍රී ලංකාව තුළ උසස් අධ්‍යාපන සහ පුහුණු අවස්ථා සඳහා ඇති ප්‍රවේශය එමගින් විමර්ශනය කරනු ලබන අතර, දැනට තිබෙන උසස් අධ්‍යාපන පද්ධතියෙහි ශක්තීන් සහ දුර්වලතා මෙන්ම ඒ සඳහා ඇති බාධක වලට හේතු වී ඇති කරුණු ද එමගින් සාකච්ඡා කරයි. විශේෂයෙන්ම තරුණ තරුණියන් ශ්‍රම වෙළෙඳ පොළ සඳහා සූදානම් කිරීම පණිස උසස් අධ්‍යාපනයෙහි ඇති අදාළත්වය, සාධාරණත්වය, ගුණාත්මකභාවය සහ කළමනාකරණය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව බාධකවලට ආමන්ත්‍රණය කිරීම සඳහා මෙම අධ්‍යනය මගින් ප්‍රතිපත්ති නිර්දේශ සපයා දෙයි.

"ආර්ථිකයෙහි තත්ත්වය 2017" වාර්තාවෙහි "ශ්‍රී ලංකාවේ නිපුණතා අතර තිබෙන පරතයන් පියවීම" නැමැති පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවේ නිපුණතා සංවර්ධන අංශයෙහි දැනට පවතින ගැටළු සහ තරගකාරී ගෝලීය පරිසරයක් තුළ ගතික සහ නිපුණතා සපිරි ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා ආමන්ත්‍රණය කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර විශ්ලේෂණය කරයි. ප්‍රියංකා ජයවර්ධන මහත්මිය සිදු කළ එම අධ්‍යයනය සඳහා ෂී ඤරු සෂ්ැරජය / ඔඔෂ විසින් අරමුදල් සපයනු ලැබිය. ශ්‍රී ලංකාව නූතන ආර්ථිකයක් වෙත පරිවර්තනය වීම කෙරෙහි යළි අලුත් වූ අවධාරණයක් සහිතව වැඩි වැඩියෙන් තරගකාරී වූ ජාත්‍යන්තර පරිසරයකට පිවිසෙමින් සිටින බැවින් මෙරට ගෝලීය තරගකාරීත්වය අඛණ්ඩව පවත්වා ගනිමින් වැඩි දියුණු කිරීම පිණිස විද්‍යාව සහ තාක්ෂණික දැනුම සහිත ඉහළ ගුණාත්මක බවකින් යුත් මානව සම්පත් සහ පුහුණු ශ්‍රම බලකායක් අවශ්‍ය වේ.

ආර්ථිකයෙහි තත්වය 2017 වාර්තාවෙහි සුනිමලී මදුරාවල විසින් ලියන ලද "බෝ නොවන රෝග සඳහා නිවාරණ ක්‍රියාමාර්ග" නැමැති පරිච්ඡේදයෙහි ප්‍රධාන අරමුණ වන්නේ බෝ නොවන රෝග මගින් ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරවන වර්ධනය වෙමින් පවතින බලපෑම පරීක්ෂා කර බැලීමයි. මෙම පරිච්ඡේදය මගින් බෝ නොවන රෝගවල අවදානම් සාධක පිළිබඳව ද, බෝ නොවන රෝග හේතුවෙන් සිදු වන ආර්ථික පාඩුව, බෝ නොවන රෝග මගින් ඇති කරන

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ නිලධාරි සුනිමලී මදුරාවල මහත්මිය ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු හා වෙළෙඳ දෙපාර්තමේන්තුව විසින් පිරිනමන ලද් ප්‍රමුඛ ආර්ථික සහ සමාජයීය ඉලක්ක වලට සහාය වීම පටස ආර්ථික පර්යේෂණ සංවර්ධනය කිරීම - (ශ්‍රී ලංකාව)» පිළිබඳ ඔස්ට්‍රේලියානු තිළිණ අධිශාස්ත්‍රීය සාමාජිකත්ව සම්පූර්ණ කළාය. 2016 දෙසැම්බර් මස 5 වැනි දින සිට ජනවාරි 14 වැනි දින දක්වා පවත්වන මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිට් විශ්වවිද්‍යාලය විසින් සත්කාරකත්වය සපයන ලදී.

අභියෝග වලට ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග මෙන්ම අනෙකුත් නව්‍ය ක්‍රියාමාර්ග ද ඇතුළු බෝ නොවන රෝග වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳව ද සාකච්ඡා කෙරෙයි.

තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනයෙහි අරමුදල් සැපයීම යටතේ "දකුණු ආසියානු කලාපයේ ගම්‍යතාව ගොඩනගන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සහ සෞඛ්‍යය තිරසර සංවර්ධන ඉලක්ක" නැමති මාතෘකාව යටතේ යොලන්තිකා ඇල්ලෙපොල විසින් සිදු කරන ලද මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකාවේ සෞඛ්‍යය තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ පාර්ශවකරුවන් සහ සෞඛ්‍ය ප්‍රතිපත්ති පර්යේෂණ ආයතන අනුරූපණය කිරීම වේ. ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, භූතානය, නේපාලය සහ ඇෆ්ග නිස්ථානය යන රටවල ද මේ හා සමාන අධ්‍යයන සිදු කර ඇති බව සඳහන් කිරීම වැදගත් වේ. සෞඛ්‍යය සම්බන්ධ තිරසර සංවර්ධන ඉලක්ක කඩිනම් කිරීමේදී පාර්ශවකරුවන් අතර තිබෙන සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම සහ සෞඛ්‍ය සම්බන්ධ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේදී ප්‍රතිපත්ති පර්යේෂණ ආයතන ආයතනවල වර්තමාන කාර්යභාරය සහ ඉදිරියේදී සිදු කළ හැකි කාර්ය භාරයන් විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයෙහි අනෙකුත් අරමුණු විය.

එල්.ටී.එල්. හෝල්ඩිංග්ස් ආයතනයෙහි අරමුදල් සැපයීම යටතේ සිදු කරන ලද "ශ්‍රී ලංකාව තුල සුවිශේෂී විශ්‍රාම පහසුකමක් ස්ථාපිත කිරීම" පිළිබඳ අධ්‍යයනය මගින් දේශීය මෙන්ම විදේශීය ජාතිකයන් සඳහා ද විශ්‍රාම සහාධිපත්‍ය ඉදිකිරීම සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ ව්‍යාපාරික අවස්ථාවක් සඳහා ඇති විභවයන් තීරණය කිරීම සඳහා වයස්ගත වූවන් රැකබලා ගැනීම සඳහා දැනට තිබෙන පහසුකම් වල තත්වය පිළිබඳ විමර්ශනය කිරීමට යෝජනා කරයි. දැඩි වෙළෙඳ පොළ තරගකාරීත්වයක් තිබුණ ද වයස අවුරුදු 50 - 60 සහ ඉන් ඉහළ වයස් කාණ්ඩයෙහි විශ්‍රාමිකයින්ගේ අවශ්‍යතාවය සපුරා දීම පිණිස අලුතෙන් ව්‍යාපාර ආරම්භ කරන්නන් සඳහා සැලකිය යුතු අවස්ථාවක් තිබෙන බව පැහැදිලිව පෙනී යයි.

කෙසේ වෙතත්, ශ්‍රම හිඟය, සමාජ සංස්කෘතික සාධක, නිලධාරිවාදී අවහිරතා සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතාවයන් මගින් මෙම කර්මාන්තය විදේශීය සේවාදායකයන්ට සේවා සැපයීම දක්වා පුළුල් කිරීමට ඇති හැකියාව සීමා කර තිබේ. සමන්ත බණ්ඩාර, කිත්මින හේවගේ සහ යොලන්තිකා ඇල්ලෙපොල විසින් මෙම අධ්‍යනය සිදු කරන ලදී. පවුල තුළ සහ සමාජමය වශයෙන් වැඩිහිටියන් සඳහා තිබෙන ගරුත්වය සහතික කිරීම ශ්‍රී ලාංකීය සංස්කෘතියෙහි ඇති වැදගත් සාරධර්මයක් වේ. කෙසේ වෙතත්, පවුලෙන් ලැබෙන සහයෝගය නොමැති අවස්ථාවලදී (දරුවන් ගෙන් හෝ පවුලේ අනෙකුත් සාමාජිකයින් ගෙන්) වැඩිහිටි පුද්ගලයින්ට සිය ජීවිත පවත්වා ගෙන යාම පිණිස අත්‍යාවශ්‍යයෙන් ම වෙනත් ආකාරයක සහයෝගයක් ලබා ගැනීමට සිදුවේ. එහෙයින් අනුක්‍රමයෙන් පැවති රජයයන් විසින් පසුගිය කාලය පුරා වැඩිහිටියන්ට සුබසාධනය සැපයීම පිණිස වැඩිහිටි නිවාස පහසුකම් සපයාදීම වැනි විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

"ආර්ථිකයෙහි තත්වය 2017" ප්‍රතිපත්ති සටහන මගින් ශ්‍රී ලංකාවේ ජනගහනයෙහි මධ්‍යන්‍ය වයස ඉහළ යාමේ වේගය, එහි ප්‍රධාන ආර්ථික අවධානයන් සහ සෞඛ්‍ය පිරිවැය සහ ප්‍රතිපත්ති ප්‍රතිචාරයන් පිළිබඳව වන "වැඩිහිටි රැකවරණ ප්‍රතිපත්තීන්" සම්බන්ධයෙන් සාකච්ඡා කරයි. සමන්ති බණ්ඩාර විසින් ලියන ලද මෙම ප්‍රතිපත්ති සටහන මගින් වයස්ගත වීමෙහි සෞඛ්‍ය පිරිවැයට පාදකවූ ගැටලු තුනක් තිබෙන බව සොයාගෙන තිබේ - දීර්ඝ කාලීන රැකවරණ අවශ්‍යතා පැන නගින අතර ම රෝගාතුර වීමෙහි සහ මර්ත්‍යතා රටා වෙනස් වීම එම ගැටළු වේ.

වයස්ගත වීම මගින් විශේෂයෙන් ම බෝ නොවන රෝග සහ අක්‍රමිකතා වැනි බොහෝ රෝගී තත්වයන් ඇති වීමේ අවදානම වැඩි කරයි. තවද, වයස්ගත වීම එකවර නිදන්ගත රෝග තත්ත්වයන් එකකට වඩා වැඩි ගණනක් (බහුවිධ නිදන්ගත රෝග හෝ බහු රෝගී තත්ත්වය) අත්විඳීමට සිදු වීමේ වදානම වැඩි කිරීමේ ප්‍රවණතාවක් ද තිබේ. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවෙහි වැඩිහිටි රැකවරණය සම්බන්ධ ප්‍රතිපත්ති විධිවිධාන සකස් කර තිබෙන නමුත් වැඩිහිටි රැකවරණ ගැටළු සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා පද්ධතිය ප්‍රමාණවත් පරිදි පෙර සූදානම් ව නැත. එසේ හෙයින්, අනෙකුත් අංශවල සහයෝගය ඇතිව, එනම් බහු ආංශික ප්‍රවේශයක් සහිතව, වැඩිහිටි පුද්ගලයන් කේන්ද්‍ර කර ගත් පරිපූර්ණ සෞඛ්‍ය සේවා පැකේජයක් සකස් කිරීම අත්‍යාවශ්‍ය වේ.

ආසියානු සංවර්ධන බැංකුවේ සෞඛ්‍ය අංශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ "තාක්ෂණික සහාය" සෞඛ්‍ය සෞඛ්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීම සූදානම් කිරීම" නැමති ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ අවදානම් සහගත ප්‍රදේශවල ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණය ශක්තිමත් කිරීමට, පරිපූර්ණ සේවා පැකේජයක් සපයා දීමට, ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණ සේවා පරිහරණය වැඩිදියුණු කිරීමට සහ මහජන සෞඛ්‍ය ධාරිතාවයන්හි තෝරාගත් අඩුපාඩු සඳහා ආමන්ත්‍රණය කිරීමට අරමුණු කරයි. මෙම ව්‍යාපෘතිය උතුරු මැද, මධ්‍යම, ඌව සහ සබරගමුව යන පළාත්වල ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රතිපත්ති නියැළීම

- ආසියානු සංවර්ධන බැංකුව විසින් සංවිධානය කර හිල්ටන් හෝටලයේදී පවත්වන ලද 1 වැනි හා 2 වැනි උපදේශන වැඩමුළු වලදී නිෂා අරුණතිලක "ශ්‍රම වෙළඳපොළ විශ්ලේෂණය" නැමති අධ්‍යයනය මගින් සොයා ගත් කරුණු ඉදිරිපත් කළාය.

- නිෂා අරුණතිලක මහත්මිය 2017 ජනවාරි මාසයේදී අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා "ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළෙහි කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම" පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් කෙටුම්පත් කිරීම සඳහා දායකත්වය ලබා දුන්නාය. (රමණි ගුණතිලක, අනිල ඩයස් බණ්ඩාරනායක, නිෂා අරුණතිලක, අමල ද සිල්වා, දිලෙනි ගුණවර්ධන සහ චාන්දනී විජේබණ්ඩාර සමග)

- නිෂා අරුණතිලක මහත්මිය ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් සංවිධානය කරන ලද "කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය වැඩි දියුණු කිරීම" සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකාවක විය (ජා.මා.ස.සං.ස, 2017 පෙබරවාරි - මාර්තු)

- නිෂා අරුණතිලක මහත්මිය අගෝස්තු 11 වැනි දින අරලියගහ මන්දිරයේ අග්‍රාමාත්‍ය කාර්යාලයෙහි සංවිධානය කරන ලද "අනාගතය සඳහා පුහුණු ශ්‍රම බලකාය විවර කිරීම" පිළිබඳ වටමේස සාකච්ඡාවට සහභාගී වූවාය.

- නිෂා අරුණතිලක මහත්මිය සැප්තැම්බර් 5 වැනි දින SLINTEC විද්‍යාපීඨය විසින් සංවිධානය කරන ලද "තාක්ෂණ සහ ව්‍යාපාර නවෝත්පාදනය පිළිබඳ

යෝජිත උසස් කළමනාකරණ වැඩසටහන (එඅ)" පිළිබඳ සාකච්ඡාවට සහභාගී වූවාට.

- නිෂා අරුණතිලක මහත්මිය ඔක්තෝබර් 12 වැනි දින කොළඹ ග්ලෝබල් ටවර්ස් හෝටලයෙහි පැවති "ඇඩ්වොකාටා ආර්ථික නිදහස සමුළුව" වැඩසටහනෙහි "ශ්‍රම වෙළඳ පොළ ප්‍රතිසංස්කරණ" පිළිබඳ සැසියෙහි මුලසුන දැරුවාය.

- නිෂා අරුණතිලක මහත්මිය ඔක්තෝබර් 27 වැනි දින ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරයෙහි පැවති "ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොළ ගැටළු" පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයකට සහභාගී වූවාය.

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් (ජීවන චේතනය පිළිබඳ ගෝලීය සංධානය සහ ෆෙයාර්ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් සංවිධානය සමග ඒකාබද්ධව) වතු ක්ෂේත්‍රය සඳහා පවත්වන ලද ජීවත් වීමට සරිලන වැටුපක් ලැබීම පිළිබඳ අධ්‍යයනය පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් අගෝස්තු 24 වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මනෝජ් තිබ්බොටුවාව, නිෂා අරුණතිලක සහ ප්‍රියංකා ජයවර්ධන විසින් සංවිධානය කරන ලද මෙම වැඩමුළුවට ප්‍රාදේශීය වැවිලි සමාගම්වල නියෝජිතයින්, වතු අංශයේ වෘත්තීය සමිති සහ ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු විවිධ පාර්ශවකරුවන් සහභාගී වූහ.

- ශ්‍රී ලංකාවෙහි පවතින "අස්ථාවර රැකියා පරිචයන්" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට මානව සම්පත් හා රැකියා දෙපාර්තමේන්තුව විසින් ප්‍රියංකා ජයවර්ධන මහත්මියට ආරාධනා කරන ලදී, සැප්තැම්බර් 12 වැනි දින.

- ඇඩ්වොකාටා ආයතනය විසින් කැනඩාවේ ෆ්රේසර් ආයතනය සමග එක්ව සංවිධානය කළ "ලෝක ආර්ථික නිදහස දර්ශකයෙහි රට පිළිබඳ විගණනය සඳහා ශ්‍රම වෙළඳ පොළ ප්‍රතිසංස්කරණ" පිළිබඳ වටමේස උපදෙස් රැස්වීමකට සහභාගී වීම සඳහා ප්‍රියංකා ජයවර්ධන මහත්මියට ආරාධනා කරන ලදී, ග්ලෝබල් ටවර් හෝටලය, දෙසැම්බර් 10.

- නිෂා අරුණතිලක මහත්මිය රමණි ගුණතිලක, අනිල ඩයස් බණ්ඩාරනායක, අමල ද සිල්වා, දිලෙනි ගුණවර්ධන සහ චාන්දනී විජේබණ්ඩාර යන මහත්ම මහත්මීන් සමග එක්ව අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා "ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළෙහි කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම" පිළිබඳ ප්‍රතිපත්ති මාලාවක් කෙටුම්පත් කිරීමට දායක වූහ. 2017 ජනවාරි.

- නිෂා අරුණතිලක මහත්මිය ජනවාරි 2 වැනි දින කොළඹ මිලෝදා මධ්‍යස්ථානයෙහි පැවති "කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා වන ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිල (හ්‍යුසෘක) කාර්ය සාධක බලකාය" සඳහා සහභාගී වූහ.

- ප්ලෑන් ඉන්ටර්නැෂනල් සංවිධානය සමග එක්ව සිදු කළ "නායකත්වය සඳහා ශ්‍රී ලංකාවේ ගැහැණු ළමයින්ගේ සහ තරුණ කාන්තාවන්ගේ ආර්ථික හා සමාජ සවිබල ගැන්වීම" නැමති මෙම පර්යේෂණ අධ්‍යයනයෙහි අවසන් වාර්තාව ඔක්තෝබර් 10 වැනි දින ජාත්‍යන්තර ගැහැණු ළමා දිනය සැමරීම සඳහා ප්ලෑන් ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් සංවිධානය කරන ලද ජාතික උත්සවයෙහිදී ප්ලෑන් ඉන්ටර්නැෂනල් සංවිධානයෙහි මෙරට නියෝජිතවරයා විසින් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත බාර දෙන ලදී.

- අෂානි අබයසේකර සහ නිෂා අරුණතිලක විසින් "ශ්‍රී ලංකාවේ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ වඩා ඉහළ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වඩා හොඳ පාසල්" යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනය තුළින් සොයා ගත් කරුණු ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ප්‍රකාශනයක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය ඇතුළු රජයේ අමාත්‍යාංශවල ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයින් අතර බෙදා දෙන ලදී.

  මීට අමතරව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සංවිධානය කරන ලද ප්‍රතිපත්ති සම්බන්ධීකරණ සංසදයක දී මෙම අධ්‍යයනය මගින් සහ අනෙකුත් අදාළ අධ්‍යයන වලින් සොයා ගත් කරුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සහ වෘත්තීය පුහුණු ආයතනවල නිලධාරීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, බුද්ධි මණ්ඩල සහ ලෝක බැංකුව, යුනෙස්කෝ, ආසියා පදනම සහ පෞද්ගලික ආයතනවල නියෝජිතයින් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි විවිධ පාර්ශ්වකරුවන් සමඟ බෙදා ගන්නා ලදී.

- නිෂා අරුණතිලක මහත්මිය ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥයින්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද "පාසල් අධ්‍යාපනය සඳහා වන සංසද" සාමාජිකත්වයට පත් කරනු ලැබුවාය. පෙබරවාරි 1 වැනි දින.

- නිෂා අරුණතිලක මහත්මිය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකු ලෙස නොවැම්බර් 1 වැනිදා සිට පත් කරන ලදී.

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ Core Research $ TTI අරමුදල් සැපයීම යටතේ සුනිමලී මදුරාවල විසින් සිදු කරන ලද "බෝ නොවෙන රෝග සඳහා නිවාරණ ක්‍රියාමාර්ග" නැමති අධ්‍යයනය, ආසියානු සංවර්ධන බැංකුවෙහි අරමුදල් සැපයීම යටතේ සමන්ති බණ්ඩාර විසින් සිදු කරනු ලබන "තාක්ෂණික සහායී සෘෂඃ සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීම සූදානම් කිරීම" නැමති පර්යේෂණය (ක්‍රියාත්මක කෙරෙමින්

පවතින) සහ තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනයෙහි අරමුදල් සැපයීම යටතේ යොලන්තිකා ඇල්ලෙපොල විසින් සිදු කරන ලද "දකුණු ආසියානු කලාපයේ ගම්‍යතාව ගොඩනගන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සහ සෞඛ්‍යය තිරසර සංවර්ධන ඉලක්ක" නැමති අධ්‍යයනය යන අධ්‍යයන වලට විද්වතුන්, ප්‍රතිපත්ති ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සිදුකරන ලද ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවකට අමතරව අමාත්‍යාංශ නිලධාරීන්, රජයේ නියෝජිතායතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජය සහ ශාස්ත්‍රඥයින් සමග පවත්වන ලද ප්‍රධාන තොරතුරුදායක සම්මුඛ සාකච්ඡා ඇතුළත් විය.

ප්‍රකාශන

- අරුණතිලක, නිෂා (2017), "ශ්‍රී ලංකාව අධ්‍යාපනය තුළින් ශ්‍රම බලකායෙහි නිපුණතා ප්‍රවර්ධනය කිරීම - සේවා නියුක්තිය පිළිබඳ නිරාවරණ අධ්‍යයනය" නැමති අධ්‍යයනයෙහි "ශ්‍රම වෙළෙඳපොළ ඇගයීම: ශ්‍රී ලංකාවේ ජනවිකාසය හා ශ්‍රම වෙළඳපොළ පිළිබඳ සමාලෝචනය" නැමති පරිච්ඡේදය, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය

- "ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙහි කාන්තාවන්: අධ්‍යාපනය හා ශ්‍රම බලකාය සඳහා කාන්තා සහභාගිත්වය විමසා බැලීම" යන මාතෘකාව යටතේ නිෂා අරුණතිලක විසින් ලියන ලද ලිපිය, 'ඔයැ ෂික්ඛී පුවත්පත, අගෝස්තු 4.

- අරුණතිලක, නිෂා; ගුණසේකර, නෙලූකා (2017), "ආර්ථිකයෙහි තත්වය 2017" වාර්තාවෙහි "වර්ධනය සඳහා ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ" පිළිබඳ පරිච්ඡේදය, අරමුදල් සැපයීම - IPS Core Research $ TTI

- මනෝජ් තිබ්බොටුවාව, ප්‍රියංකා ජයවර්ධන, නිෂා අරුණතිලක සහ ගුණසේකර, නෙලූකා, "ජීවත් වීමට සරිලන වැටුප පිළිබඳ වාර්තාව: ශ්‍රී ලංකා වතු අංශය" (ඉදිරි), ගෝලීය ජීවන වේතන සංධානය.

- ජයවර්ධන, ප්‍රියංකා (2017), "ශ්‍රී ලංකාවේ ජනතාව නොවිධිමත් ක්ෂේත්‍රයේ රැකියා තෝරා ගන්නේ ඇයි", කම්කරු ආර්ථිකවිද්‍යා ප්‍රකාශන මාලා අංක 19, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ, ශ්‍රී ලංකාව.

- රණසිංහ, අතුල; මදුරාවල, සුනිමලී; සු, ජන් ජේ; සේනාධීර, තුෂාර (2016), "ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ශ්‍රම හිඟය පිළිබඳ ආනුභාවික විමර්ශනයක්", ග්‍රිෆිත් විශ්වවිද්‍යාල සාකච්ඡා පත්‍රිකා මාලාව, ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය, බ්‍රිස්බේන්.

- අරුණතිලක, නිෂා (2017), 'රැකියා නියුක්තිය කෙරෙහි වෙළඳාමේ බලපෑම', 'ආකුලත්වයට පත්ව: දකුණු ආසියාවේ වෙළඳ කම්පනයන්ට සේවකයින්ගේ හැඩ ගැසීම් නැමති ලෝක බැංකු කලාපීය වාර්තාව සඳහා ලියන ලද පසුබිම් පත්‍රිකාව.

- අෂානි අබයසේකර සහ නිෂා අරුණතිලක ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් මාලාව සඳහා ලියන ලද ලිපි: "නිපුණතා සංවර්ධනයට මග: ශ්‍රී ලාංකීය තරුණයින්ට සාමාන්‍ය පෙළ කඩුල්ල තරණය කිරීම සඳහා උපකාර කිරීම" (ටෝකිං ඉකොනොමික්ස් සඟරාව, ඩේලි මිරර්, සිලෝන් ටුඩේ)

- මදුරාවල, එස්; අරුණතිලක, ඒ; මධුෂානි, සී; කරුණාරත්න, එන්. (2017), "නායකත්වය සඳහා ශ්‍රී ලාංකික ගැහැණු ළමයින් සහ තරුණියන් ආර්ථික හා සමාජමය වශයෙන් සවිබල ගැන්වීම". පළ නොකළ වාර්තාව, ප්ලෑන් ඉන්ටර්නැෂනල්, කොළඹ, ශ්‍රී ලංකාව

- සුනිමලී මදුරාවල 'සත්‍රී පුරුෂ භාවය අනුව බෝ නොවන රෝගවල ලක්ෂණ: ශ්‍රී ලංකාවට බෝ නොවන රෝග සඳහා ඇති ඉඩ ප්‍රස්ථා පරාජය කළ හැකිද?'යන මාතෘකාව යටතේ ඕකනසබට ෑජදබදපසපී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන වෙබ් අඩවිය සඳහා ලිපියක් ලිව්වාය. වෙබ් ලිපිනය: යළුළුව://අඅඅ.සව්.කන/ළුකනසබටැජදබදපසපී/2017/10/03/එයැ-ටැබාැරැා-ජේැ-දබෙජ්ා- ජ්බ්ිරස-ක්බන්-ඉැළු-එයැ-දග්/

- සුනිමලී මදුරාවල 'පිරිහෙමින් තිබෙන මැහුම් සේවිකා සංඛ්‍යාව - ශ්‍රී ලංකාවේ අඟළුම් අංශයේ ශ්‍රම හිඟයී යන මාතෘකාව යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන වෙබ් අඩවිය සඳහා ලිපියක් ලිව්වාය. වෙබ් ලිපිනය: යළුළුව://අඅඅ.සව්.කන/ළුකනසබටැජදබදපසපී/2017/04/03/එයැ-ාඅසබාකසබට්ිළුසළුජයසබට-ය්බ්ා-ක්ඉදමරියදරළුට්ැි-සබ-එයැ-ූචව්රුක-සබාම්ළුරහ-සබ්ිරස-ක්බන්/.අප්‍රේල් 03 වැනි දින.

- සුනිමලී මදුරාවල 'ගැහැණු ළමයෙකු ලෙස නායකත්වය ගන්න: ශ්‍රී ලංකාවේ කාන්තා නායකත්වය සවිබල ගැන්වීම්' යන මාතෘකාව යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන වෙබ් අඩවිය සඳහා ලිපියක් ලිව්වාය. වෙබ් ලිපිනය: යළුළුව://අඅඅ.සව්.කන/ළුකනසබටැජදබදපසපී/2018/02/06/ක්ා-කසනැ-ූ-ටසරක-ැපචදඅැරසබට්රස-ක්බනී-ෙපේකැ-කැාැරියසව/. පෙබරවාරි 6 වැනි දින.

- සුනිමලී මදුරාවල ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් 'ශ්‍රී ලාංකික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම: එක් උපාය මාර්ගයක් සියල්ලන් සඳහා යොගය නොවේ' යන මාතෘකාව යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන වෙබ් අඩවිය සඳහා ලිපියක් ලිව්වාය. වෙබ් ලිපිනය: යළුළුව://අඅ අ.සව්.කන/ළුකනසබටැජදබදපසපී/2018/03/08/ැජදබදපස ජ්කකහ-ැපචදඅැරසබට්රස-ක්බන්බ-අදපැබ-දබැ්එරඑැටහ-ාදැිබදළු-සෙළු්කක/. මාර්තු 08 වැනි දින.

- මධුරාවල, එස්. (2017), "ශ්‍රම බලකාය සඳහා කාන්තා සහභාගිත්වය සහ අන්තර්කරණය වූ වර්ධනය: ශ්‍රී ලංකාව සඳහා සමාජ අවස්ථාව කාර්යන් යොදා ගැනීමක්", සවුත් ඒසියා ඉකොනොමික් ජර්නල් 18(2) 214-229

- මදුරාවල, එස්; හිරිමුතුගොඩගේ, ඩී.; ප්‍රේමරත්න, ඩී.; විජයසිරි, ජේ.; "ශ්‍රී ලංකාවේ කොහු සහ කුළු බඩු ක්ෂේත්‍රයේ කාන්තාවන්ට හිමි සහ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත: අවහිරතා සහ ප්‍රතිපත්ති විකල්ප", සටහන් පත්‍රිකා ප්‍රකාශන මාලා අංක 28, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ, ශ්‍රී ලංකාව

- ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (2016), 'ශ්‍රම බලකාය සඳහා කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම, පිළිබඳ ව්‍යාපෘතියී, ජාතික කම්කරු අධ්‍යයන ආයතනය, බත්තරමුල්ල, නිෂා අරුණතිලක (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය), ඒ. විමලවීර (කම්කරු, වෘත්තීය සමිති සම්බඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය), ඊ.එල්.කේ. දිසානායක (මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව) සහ එච්.ආර්.එස්.එල්. රණතුංග (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)ග

- අෂාණි අබේසේකර විසින් ලියන ලද 'ශ්‍රී ලංකාවේ පෞද්ගලික අමතර අධ්‍යාපනයී නැමති ලිපිය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ඉතා වැදගත් ම ප්‍රකාශනය වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2017 වාර්තාවෙහි ප්‍රතිපත්ති සටහනක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

- අබයසේකර, ඒ.; අරුණතිලක, එන්. (2017). "ශ්‍රී ලංකාවේ වඩා ඉහළ සාමාන්‍ය පෙළ ප්‍රතිපල සඳහා වඩා හොඳ පාසල්". ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ, ශ්‍රී ලංකාව

- අබයසේකර, ඒ. සහ අරුණතිලක, එන්. (2018). "ශ්‍රී ලංකාවේ පාසල් මට්ටමේ සම්පත් බෙදා හැරීම සහ අධ්‍යාපන ප්‍රතිඵල ". ජාත්‍යන්තර අධ්‍යාපන සංවර්ධන සඟරාව, 61, 127-141

- ජයවර්ධන, පී. සහ මිලර්, ආර්. (2017), "අධ්‍යාපනය තුළින් ශ්‍රී ලංකාවේ ශ්‍රම බළකායෙහි නිපුණතා ප්‍රවර්ධනය කිරීම - සේවා නියුක්ති අනාවරණ අධ්‍යයනය" නැමති අධ්‍යයනයෙහි "ශ්‍රී ලංකාවේ රැකියා සඳහා නිපුණතා අතර සම්බන්ධතාවයක් ගොඩනැගිනීම", ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය

- අරුණතිලක, එන් සහ අබයසේකර, ඒ. (2018). "ශ්‍රී ලංකාවේ සියලු පන්ති කාමර සඳහා ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් ගුරුවරුන් සිටින්නේ0ද?", ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ, ශ්‍රී ලංකාව.

- අෂානි අබයසේකර විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ඕකනසබට ෑජදබදපසපි බ්ලොග් ලිපි මාලාව සඳහා "විභාග ලකුණු තරගය අවසන් කිරීම: ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පරිවර්තනය කිරීම." නැමති මාතෘකාව යටතේ බ්ලොග් ලිපියක් ලියන ලදී: (ඕකනසබට ෑජදබදපසපි, ද අයිලන්ඩ්, ඩේලි මිරර්, සිලෝන් ටුඩේ) අගෝස්තු 17

- ප්‍රියංකා ජයවර්ධන, "නිපුණතා අතර පවතින පරතරයන් අවම කිරීම: ආර්ථික වර්ධනය ළඟා කර ගැනීමේදී ශ්‍රී ලංකාවට ඇති අභියෝගයක්" ඩේලි මිරර්, සිලෝන් ටුඩේ, ජූනි 22; ද අයිලන්ඩ්, ඩේලි එෆ්.ටී., ඩේලි නිවුස්, ජූනි 23

- නිෂා අරුණතිලක "ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වන අයවැය ප්‍රතිපාදන: ශ්‍රී ලංකාව ස්වකීය සම්පත් සහ අවස්ථා නිවැරදිව යොදා ගන්නේද?" යන මාතෘකව යටතේ ලිපියක් ලිව්වාය. ඩේලි එෆ්.ටී., ඩේලි නිව්ස්: නොවැම්බර් 16; ද අයිලන්ඩ්, දෙසැම්බර් 4

- නිෂා අරුණතිලක සහ අෂානි අබයසේකර විසින් "ගණිතය හා විද්‍යාව විෂයයන් සඳහා සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ ඌනතාවය සා.පෙ. ප්‍රතිඵල දුර්වල වීමට හේතු වී තිබේ" යන මාතෘකාව යටතේ ලියන ලද ලිපිය: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඩේලි එෆ්.ටී., නොවැම්බර් 29

- සේනානායක, එස්.ජේ.; ගුණවර්ධන, එන්.එස්.; පාලිහවඩන, පී.; බණ්ඩාර, එස්.; බණ්ඩාර, පී.; රණසිංහ, ඒ.යූ.; කරුණාරත්න, ආර්.එච්.; ප්‍රියන්ත කුමාර, ජී. (2017), "අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිදන්ගත වකුගඩු රෝගීන් සෞඛ්‍ය සේවාවන් වෙත ප්‍රවේශවීමේදී සෘජුවම දැරීමට සිදු වන වියදම්" (2017)" ලංකා වෛද්‍ය සඟරාව 2017; 62:100-103, ෘධෂ: යඑඑච://ාදස.දරට/10.4038/ජපව.ඩ62ස2.8475

- බණ්ඩාර, එස්. (2017, "ශ්‍රී ලංකාවේ වැඩිහිටි සේවකයින් විසින් ජීවනෝපාය තෝරා ගැනීම සඳහා බලපාන සාධක මොනවාද?", "ඉන්දියානු මානව සංවර්ධන සඟරාව 2017: 11(2) 1 - 22, ෘධෂ: 10.1177/0973703017737863

- වීරසිංහ, එම්.; බණ්ඩාර, එස්.; සනූන්, එම්. (2017), "පාසල් ආපනශාලාවල සේවා ගුණාත්මකභාවය: ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ සිදු කරන ලද සිද්ධි අධ්‍යයනයක්" සිලෝන් ජර්නල් ඔෆ් මෙඩිකල් සයන්ස් 2017: 54 (2),

- සමන්ති බණ්ඩාර විසින් "අවපාතයෙහි නිහඬතාවය බිඳීම: ශ්‍රී ලංකාවට අභියෝගාත්මක කාර්යයක්" නැමති මාතෘකාව යටතේ බ්ලොග් ලිපියක් ලියන ලදී. ද අයිලන්ඩ්, ඩේලි මිරර්, අප්‍රේල් 07

සංනිවේදනය / ප්‍රචාරණය

පර්යේෂණ මගින් සොයා ගත් කරුණු සන්නිවේදනය කිරීම සහ ප්‍රචාරණය බ්ලොග් අඩවි, පුවත් පත් සහ රූපවාහිනී සම්මුඛ සාකච්ඡා, වීඩියෝ සම්මුඛ සාකච්ඡා, ප්‍රතිපත්ති දර්ශන සහ දේශීය සහ අන්තර්ජාතික වශයෙන් සිදුකරන ලද ඉදිරිපත් කිරීම් වැනි විවිධ ක්‍රම රාශියක් හරහා සිදු කරන ලදී.

ආචාර්ය නිෂා අරුණතිලක සහ අෂානි අභයසේකර නොවැම්බර් මස 28 වැනි දින ’රළු ඔඩ රූපවාහිනී නාලිකාව මගින් විකාශය කරන ලද "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2017" ව්‍යාපාර තත්වය නැමැති රූපවාහිනී වැඩසටහනට සහභාගී වූහ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජීවන චේතනය පිළිබඳ ගෝලීය සංධානය සහ ෆෙයාට්ඩ් ඉන්ටර්නැෂනල් විසින් සංවිධානය කර, අගෝස්තු 24 වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයේදී පවත්වන ලද පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවවේදී මනෝජ් තිබ්බොටුවාව සහ ප්‍රියංකා ජයවර්ධන විසින් "වතු ක්ෂේත්‍රයේ ජීවත් වීමට සරිලන වැටුපක් ලැබීම පිළිබඳ අධ්‍යයනය" මගින් සොයා ගත් කරුණු පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළේය. එමෙන්ම, ප්‍රියංකා ජයවර්ධන කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් හොටෙල් ජානකී හි දී පවත්වන ලද "ශ්‍රමය සහ සේවා නියුක්තිය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයෙහිදී" "ශ්‍රී ලංකාවේ ජනතාව විධිමත් නොවන රැකියා වලට සහභාගී වීම තෝරා ගන්නේ මන්ද" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. තවද, ඇය "ජනවාර්ගික අධ්‍යයන සඳහා වන අන්තර්ජාතික මධ්‍යස්ථානය" විසින් සංවිධානය කරන ලද, "ශ්‍රී ලංකාවේ සහ ඉන් ඔබ්බට පවතින ශ්‍රමිකයින්ගේ අස්ථාවරභාවයට ආමන්ත්‍රණය කිරීම" පිළිබඳ සමුළුවේදී "ශ්‍රී ලංකාවේ පවතින අස්ථාවර රැකියා පරිචයන් සහ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් ද සිදු කළාය. එමෙන්ම ඇය "විධිමත් නොවන ස්වරූපයේ රැකියා වලදී සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති" යන මාතෘකාව යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රතිපත්ති දර්ශනය පිළිබඳ ලිපියක් ලියන ලදී. ඩේලි මිරර්, අගෝස්තු 11; ද අයිලන්ඩ්, අගෝස්තු 4; ඩේලි එෆ්.ටී., ද අයිලන්ඩ්, අගෝස්තු 15.

සමාලෝචනය මගින් සොයාගත් ප්‍රධාන කරුණු ප්‍රචාරණය කිරීම සඳහා සහ 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයෙහි සඳහන් ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් වලට ප්‍රමුඛත්වය ලබාදීම සඳහා ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සංවිධානය විසින් ඔක්තෝබර 10 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහිදී සංවිධානය කරන ලද එලිදැක්වීමේ උත්සවයේ දී සහ මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහනේදී සුනිමලී මදුරාවල විසින් 'නායකත්වය සඳහා ශ්‍රී ලාංකික ගැහැණු ළමයින්ගේ සහ තරුණියන්ගේ ආර්ථික සහ සමාජ සවිබල ගැන්වීම ඇගයීම් පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

සුනිමලී මදුරාවල සහ දිලානි හිරිමුතුගොඩගේ 'ශ්‍රී ලංකාවේ කුළුබඩු සහ කොහු කර්මාන්ත අංශවල කාන්තාවන්ට හිමි සහ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත: අවහිරතා සහ ප්‍රතිපත්ති විකල්පී පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනය මගින් සොයා ගත් කරුණු පිළිබඳව නොවැම්බර් 10 වෙනි දින 'අදී සිංහල පුවත්පත සමග පැවැති මාධ්‍ය සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වූහ. එමෙන්ම, සුනිමලී මදුරාවල මහත්මිය ශ්‍රී ලංකාවේ ඇඟලුම් ක්ෂේත්‍රයෙහි පවතින ශ්‍රම හිඟය පිළිබඳව ග්ලෝබල් ප්‍රෙස් ජර්නල් නමැති සඟරාව සමග පැවති මාධ්‍ය සම්මුඛ සාකච්ඡාවකදී ඇයගේ අදහස් ඉදිරිපත් කළාය. එම අදහස් 'ඉදිරියේදී ඇතිවිය හැකි ශ්‍රම හිඟය නිසා ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්ත ශාලා වැටුප් සහ ප්‍රතිලාභ වැඩි කරයි නැමති මාතෘකාව යටතේ ග්ලෝබල් ප්‍රෙස් ජර්නල් සඟරාවේ පළ විය. නිෂා අරුණතිලක සහ අෂානි අභයසේකර "සාමාන්‍ය පෙළ විභාග කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා පාසල සතු සම්පත් බලපායි" යන මාතෘකාව යටතේ සිය ප්‍රතිපත්ති දරශනය ඉදිරිපත් කළහ. එම දෙදෙනා ම "ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පෙළ විභාගයේ වඩා ඉහළ ප්‍රතිඵල සඳහා වඩා හොඳ පාසල්" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කළ අදහස් මගින් සුදුසුකම් ලත් සහ පළපුරුදු ගුරුවරුන්ගේ හිඟය කෙරෙහි අවධානය යොමු කරවන ලදී, ද අයිලන්ඩ්, නොවැම්බර් 29. තවද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර නොවැම්බර් 28 වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද 'ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පෙළ විභාගයේ ඉහළ ප්‍රතිඵල සඳහා වඩාත් හොඳ පාසල්" අධ්‍යයනය මගින් සොයා ගත් කරුණු අඩංගු ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රකාශනය පිළිබඳ තොරතුරු පළ කිරීම සඳහා පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවට සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ සහ දකුණු කොරියාවේ අමතර පෞද්ගලික අධ්‍යාපන කර්මාන්තය පිළිබඳව තිලෝක ද සිල්වා සමග පවත්වන් ලද 'ප්‍රතිපත්ති වීඩියෝ: 'විද්වතුන්ගේ අදහසී ඇතුළත් වීඩියෝව හරහා අෂානි අබයසේකර ස්වකීය අදහස් බෙදා ගත්තාය. එමෙන්ම, 'ශ්‍රී ලංකාවේ සියලුම පන්ති කාමර සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුතු ගුරුවරුන් සපයා දීම් නැමති මාතෘකාව යටතේ නිෂා අරුණතිලක සහ අෂානි අබයසේකර සිය ප්‍රතිපත්ති අදහස් බෙදා ගත්හ.

ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය
සහ තරගකාරීත්වය

ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ තරගකාරීත්වය

පර්යේෂණාවල අවධානයන්

උදාසීන ගෝලීය ආර්ථිකය වර්ධනයක් සහ වෙළඳ කාර්ය සාධනයක් තිබෙන තත්වයක සහ එක්සත් ජනපදය සහ යුරෝපය පුරාවට ගෝලීයකරණයට එරෙහිව ජනතාවාදී හැඟීම් වර්ධනය වෙමින් පවතින පසුබිමක් තුළ ශ්‍රී ලංකාව දේශීය ආර්ථික තරගකාරිත්වය ඉහළ නංවා ගනිමින් ලෝකයේ අනෙකුත් රටවල් සමඟ වඩාත් සමීප ලෙස ඒකාබද්ධ වීමේ මාර්ගයක් අනුගමනය කරමින් සිටියි. මිලියන විස්සක් පමණ වූ සීමිත පාරිභෝගික වෙළඳපොළක් සහිතව අති විශාල වූ ණය බර ප්‍රශ්නයට ආමන්ත්‍රණය කිරීම සඳහා වර්ධනය උද්‍යෝගවත් කර පවත්වා ගැනීම පැහැදිලිව ම ශ්‍රී ලාංකීය භාණ්ඩ හා සේවා සඳහා විදේශයන්හි ඉල්ලුමක් නිර්මාණය කිරීම මත රඳා පවතිනු ඇත.

2016 වර්ෂයේ දී මන්දගාමී දළ දේශීය නිෂ්පාදන වර්ධනයක් තිබුණ ද, රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ, විශේෂයෙන්ම එකවර ණය ගෙවීම වැනි සාර්ව ආර්ථික පරිසරය තුළ ආයෝජකයන්ට සාධනීය වර්ධනයන් බලාපොරොත්තු විය හැකි බව ප්‍රතිපත්ති සැකසුම් මගින් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, වර්ධන අවශ්‍යතාවය කෙරෙහි ඇති ව්‍යූහාත්මක අවහිරතාවලට ආමන්ත්‍රණය කෙරෙන පුළුල් පදනමක් සහිත පරිපූර්ණ ප්‍රතිසංස්කරණ මාලාවක් ඒ හා සමගාමීව ක්‍රියාත්මක කළ යුතු වේ. පිරිවැය ඵලදායී සහ විශ්වාසනීය යටිතල පහසුකම් සේවා, මූල්‍ය පහසුකම් සහ ඉඩම් වෙත ප්‍රවේශය; කාර්යක්ෂම ආයතනික සහ නියාමන පරිසරයක් තිබීම; සහ ව්‍යාත්තීයවේදීන් සහ තාක්ෂණික කුසලතාවය ඇති යහපත් මානව සම්පත් එකතුවක් ආදිය ඉන් සමහරක් වේ.

සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම වාර්ෂික වාර්තා වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වයී නැමැති වාර්තාව මගින් මෙරට ආර්ථික කාර්ය සාධනය පිළිබඳව විචාරාත්මක ඇගයීමක් සහ වර්ධනය හා සාර්ව ආර්ථික ස්ථාවරත්වය උදෙසා නුදුරු අනාගතය සඳහා දැක්මක් සපයා දෙයි. සෑම වර්ෂයකදී ම තිරසාර වර්ධනයක් අත්කර ගැනීම පිණිස රටෙහි සමාජ ආර්ථික සංවර්ධන ප්‍රතිඵල ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ඉතා වැදගත් මධ්‍ය කාලීන ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් මෙම වාර්තාව මගින් විමර්ශනය කරනු ලැබේ. 'ශ්‍රී ලංකාව, ආර්ථිකයෙහි තත්වය 2017 වාර්තාව මගින් එහි ප්‍රධාන තේමා ගත අවධානය ලෙස 'ජන විකාශය, ශ්‍රම වෙළඳ පොළ සහ වර්ධනයී යන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරවයි.

බදුකරණය

මෙරට සංවර්ධන අභියෝගයන්ට ආමන්ත්‍රණය කිරීමේදී සහ දිළිඳුකම අඩු කිරීම කඩිනම් කිරීමේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ඵලදායීත්වය සහ කාර්යක්ෂම භාවය ඇගයීම වැදගත් වේ. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට බදු, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහ සහනාධාර හරහා දිළිඳුකම අඩු කිරීමේ කාර්යය කෙතෙක් දුරට සාක්ෂාත් කරගෙන තිබේද; ආදායම් අය කර ගැනීම සහ රජයේ වියදම් කෙතරම් ප්‍රගතිශීලීද; තනි පුද්ගලයින්ට බලපාන බදු සහ සංක්‍රාම ප්‍රතිපත්ති මගින් අසමානාත්මතාවය හා දරිද්‍රතාවය කෙරෙහි ඇති කරන බලපෑම කුමක්ද යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම අවශ්‍ය වේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය නොවැම්බර් 14 - 16 යන දින වල නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති දහවැනි දකුණු ආසියානු ආර්ථික සමුළුවෙහිදී

වෙළෙඳ ප්‍රතිපත්තිය

2025 දැක්ම, නව වෙළඳ ප්‍රතිපත්තිය සහ ජාතික අපනයන උපාය මාර්ගය ඇතුළු ලියවිලි ගණනාවක් සම්පාදනය කිරීම මගින් පෙන්නුම් කෙරෙන පරිදි වෙළඳාම සහ ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා එහි ඇති වැදගත්කම මෙරට ප්‍රතිපත්ති සාකච්ඡාවෙහි ප්‍රමුඛතම අංශයක් ලෙස ඉස්මතු වී තිබේ.

මිලියන 20 ක පමණ ජනගහනයක් සහිත කුඩා දේශීය වෙළඳ පොළක් තිබෙන තත්ත්වය සැලකිල්ලට ගැනීමේදී, ශ්‍රී ලංකාව තිරසර, ඉහළ මට්ටමේ, දීර්ඝ කාලීන වර්ධනයක් අත්කර ගැනීම සඳහා බාහිරින් ලැබෙන ඉල්ලුම මත යැපීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන තිබේ. අතීත ප්‍රතිපත්ති ප්‍රතිවර්තනය කිරීම මගින් බාහිරට නැඹුරු වූ ප්‍රවේශය තුළින් ශ්‍රී ලංකාව ගෝලීය නිෂ්පාදන ජාලවලට සහභාගී වීම වැඩි කර, ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා දායකත්වය සපයා දෙමින් දේශීය ආර්ථිකයෙහි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එවැනි ප්‍රතිපත්ති සංශෝධන සහ ක්‍රියාත්මක කිරීම් වඩා පුළුල් පාර්ශ්වකාර අදහස් විමසීම් සහ සාර්ථක පර්යේෂණ, එනම් සන්දර්භගත, නිරවද්‍ය භාවය තහවුරු වන සහ ප්‍රතිපත්ති ගැටළු/අරමුණු වලට ගැළපෙන ලෙස සකස් කළ, කාලෝචිත සහ විශ්ලේෂණාත්මක උසස් පර්යේෂණ මත පදනම් වීම අවශ්‍ය වනු ඇත. මෙවන් පසුබිමක් තුළ, 2017 වර්ෂයේ පර්යේෂණ ද්විපාර්ශ්වික සහ කලාපීය වෙළඳ ගිවිසුම් කෙරෙහි අවධානය යොමු කිරීම මගින් එහි දැනට පවතින ක්‍රියාමාර්ග මත ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

පර්යේෂණ අධ්‍යයන

2017 වර්ෂය තුළදී දුෂ්නි වීරකෝන් මහත්මිය "සංවර්ධනය සඳහා ණය මගින් අරමුදල් සපයන සන්දර්භයක් තුළ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීම" පිළිබඳ විමසා බැලීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙහි අරමුදල් සැපයීම යටතේ අධ්‍යයනයක් සිදු කළාය. 2006 - 14 කාල පරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකාවේ වර්ධනය සහ ආර්ථික සංවර්ධනය රාජ්‍ය ආයෝජන මගින් ක්‍රියාත්මක වූ යටිතල පහසුකම් සංවර්ධනය මත දැඩි ලෙස රඳා පවතින තත්ත්වයක් ඇති විය. වඩා ඉහළ රාජ්‍ය ආයෝජන වියදම් සඳහා උපකාරී වීම පිණිස ප්‍රමාණවත් දේශීය සම්පත් නොමැති කම නිසා ශ්‍රී ලංකාව අන්තර්ජාතික සංවර්ධන මූල්‍ය මූලාශ්‍ර මගින් අරමුදල් ලබා ගැනීම ආරම්භ කළේය. රටෙහි ණය සේවා අනුපාතය සීඝ්‍රයෙන් ඉහළ ගිය බැවින් ශ්‍රී ලංකාව අපනයන ආදායම් වර්ධනය සහ ණය නිර්මාණය නොකරන සෘජු විදේශ ආයෝජන ගලා ඒම දිගින් දිගටම පහළ බැසීම හමුවේ ඉහළ යමින් පවතින බාහිර ණය අර්බුදයකට මුහුණ දී සිටියි.

ලෝක බැංකු අරමුදල් සැපයීම යටතේ නිෂා අරුණතිලක සහ ප්‍රියංකා ජයවර්ධන 'ශ්‍රී ලංකාවේ බදු ආපාතය සහ වියදම් යන මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කළහ. මෙම විශ්ලේෂණය මගින් සොයා ගත් කරුණු තුළින්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ජනක විජේසිරි මහතා ඔක්තෝබර් දෙවැනි දින කොළඹ JAIC හිලටන් රෙසිඩන්සිස් හි දී ජී.එස්.පී. ප්ලස් පහසුකම මගින් ආර්ථිකයෙහි ප්‍රධාන අංශ කෙරෙහි ඇති කෙරෙන බලපෑම: මූලික ඇස්තමේන්තු කිපයකි යන මාතෘකාව යටතේ පැවති සංසදයෙහිදී ඉදිරිපත් කිරීමක් සිදු කළේය.

ලබා දුන් ප්‍රධාන දායකත්වය වූයේ මූල්‍ය මැදිහත්වීම්වල සාධනීයත්වය පිළිබඳව ක්‍රමානුකූල, ආනුභූතික සාක්ෂි සපයා දීමයි. ලෝකයේ වෙනත් රටවල් සඳහා ද මේ හා සමාන අධ්‍යයනයන් පවතින නමුත්, මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවෙහි රාජ්‍ය මූල්‍ය උපකරණ පිළිබඳව සහ ආදායම් ප්‍රතිව්‍යාප්ත කර දිළිඳුකම අඩු කිරීම සඳහා එම උපකරණ වලට ඇති හැකියාව විමසා බැලෙන ප්‍රථම විස්තීර්ණ විමර්ශනය මෙම අධ්‍යයනය විය. සංගත ක්‍රමවේදයක් භාවිතා කළ මෙම ප්‍රවේශය මගින් මෙම කලාපයේ සහ ලෝකයේ අනෙකුත් රටවල් සමග සංසන්දනාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා අවකාශය සලසා දෙයි.

2017 වර්ෂය තුළදී, ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාතයංශය වෙනුවෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නැගී එන ආසියාන් සංවිධානයට අයත් රටවල් 4 ක් (වියට්නාමය, මැලේසියාව, තායිලන්තය සහ ඉන්දුනීසියාව) සමග වෙළඳ හා ආයෝජන විභවතා පිළිබඳ අධ්‍යයන සිදු කරන ලදී. ජනක විජයසිරි, කිත්මින හේවගේ, විශ්ව සුබ්‍රමනියම් සහ නුවන්ති සේනාරත්න විසින් මෙම අධ්‍යයන සිදු කරන ලදී.

අපනයන කරුවන් ගෙන් වැඩි දෙනෙකු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ලෙස වර්ග කළ හැකි අතර, ඔවුන් නියැළී සිටින කර්මාන්තයට අනුව ඔවුන්ගේ වෙළඳ පොළ සඳහා විවිධ වර්ගවලට අයත් පුළුල් පරාසයක නිෂ්පාදන අපනයනය කරති. කෙසේ වෙතත්, සමහර කර්මාන්ත ප්‍රධාන වශයෙන් ම අත්කම් භාණ්ඩ, දැව භාණ්ඩ නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, කුළු බඩු, පොල් ආශ්‍රිත නිෂ්පාදන, රෙදි පිළි (අත්යන්ත්‍ර රෙදිපිළි) සහ

සකස්කළ ආහාර වැනි භාණ්ඩ නිෂ්පාදනය කරන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වේ. මේ සම්බන්ධයෙන් සලකා බැලීමේදී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජිනීවා නගරය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වන පාරිභෝගික එකමුතුව සහ භාර සංගමය හා අන්තර්ජාතික වෙළෙඳාම, ආර්ථික විද්‍යාව සහ පරිසරය සඳහා වන මධ්‍යස්ථානය සඳහා වෙළඳ සංවර්ධනයන් සමග සමගාමී වන ව්‍යාපෘතියක කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සහ කර්මාන්ත අංශයෙහි ක්‍රියාත්මක වන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මුහුණදෙන අපනයන බාධක නැමති විවිධ අපනයන ගැටළු පිළිබඳ විමසා බැලීම සඳහා වන අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙහි ශ්‍රී ලාංකික අධ්‍යනය ජනක විජයසිරි සහ නුවන්ති සේනාරත්න විසින් සිදුකරන ලදී.

ප්‍රතිපත්ති නියැළීම්

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකා රජයේ ඉදිරි ආර්ථික ප්‍රතිපත්ති ලියවිල්ල වන '2025 දැක්ම -පොහොසත් රටකී නැමැති ලියැවිල්ල කෙටුම්පත් කිරීම සඳහා සහභාගිත්වය සහ දායකත්වය ලබාදෙන ලදී.

- ජනවාරි 26 වැනි දින ශ්‍රී ලංකා වාණිජ මණ්ඩල ශ්‍රවණාගාරයේ පැවති, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 'ආකූලත්වය තුළින් ජයග්‍රහණය 2017: ව්‍යාපාර සඳහා ආර්ථික දර්ශනය සහ ගම්‍යමානයනී නැමැති සම්මන්ත්‍රණයෙහිදී සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස දුෂ්නි වීරකෝන් මහත්මිය සහභාගී වූවාය.

- ජනක විජයසිරි, මනෝජ් තිබ්බටුවාව සහ දිලානි හිරිමුතුගොඩගේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග ශ්‍රී ලංකාවේ කුළු බඩු ක්ෂේත්‍රය පිළිබඳ සාකච්ඡාවකට සහභාගී වූහ. පෙබරවාරි 22.

- දුෂ්නි වීරකෝන් මහත්මිය මාර්තු 3 වැනි දින ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන ශ්‍රවණාගාරයෙහිදී ක් ශ්‍රී ලංකා ව්‍යාපාර පාසල සඳහා "ශ්‍රී ලංකාව: ආර්ථික දර්ශනය 2017/18" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය.

- දුෂ්නි වීරකෝන් මහත්මිය ජනවාරි 19 සහ මාර්තු 16 යන දිනවල ලංකා වාණිජ මණ්ඩලයෙහි ආර්ථික ප්‍රතිපත්ති මෙහෙයුම් කමිටුව සඳහා සහභාගී වූවාය.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය ෂඔක සමග එක්ව සංවිධානය කරන ලද "ශ්‍රී ලංකා ජාතික අපනයන උපාය මාර්ගය - පළමු වැනි පාර්ශවකරුවන්ගේ සම්මන්ත්‍රණය" සඳහා ජනක විජයසිරි මහතා සහභාගී විය, අප්‍රේල් 6 - 7.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ නිලධාරි කිත්මිණ හේවගේ මහතා 2017 අප්‍රේල් 7 - 8 දිනවල චීනයේ චෙන්ග්ඩු නගරයේ පැවති, සිචුවාන් සමාජ විද්‍යා විද්‍යාපීඨය විසින් සංවිධානය කරන ලද "සමෘධිමත් දේශය හා සේද මාවත" පිළිබඳ සම්මන්ත්‍රණයෙහිදී වෙනස් වෙමින් පවතින ගෝලීය පිළිවෙළ තුළ චීනයේ සේද මාවත යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය.

- ජනක විජයසිරි මහතා අප්‍රේල් 22 - 23 යන දින වල දී ඩකා නුවර පිහිටි ඊෂඊඔෑක ලේකම් කාර්යාලයෙහි පැවැති "3 වැනි ඊෂඊඔෑක ඊහෂඖඔ සමුළුවී සඳහා සහභාගී විය.

- දුෂ්නි වීරකෝන් මහත්මිය ආසියානු සංවර්ධන බැංකුව සහ ජපානයේ යොකාහාමා නගරයේ පෙන්සිල්වේනියා විශ්වවිද්‍යාලයේ බුද්ධි මණ්ඩල සහ සිවිල් සමාජ වැඩසටහන විසින් සංවිධානය කරන ලද ෂඪ වැනි ගෝලීය බුද්ධි මණ්ඩල සමුළුව සඳහා සහභාගී වූවාය, මාර්තු 1 - 3.

- දුෂ්නි වීරකෝන් මත්මිය "රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ගැටළු" පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස මුදල් අමාත්‍යවරයා සහ මුදල් රාජ්‍ය අමාත්‍යවරයා සමග රැස්වීමකට සහභාගි වූවාය, භාණ්ඩාගාරය, ජුනි 13 වැනි දින.

- ජුලි 25 වැනි දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයෙහිදී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 2017 ශ්‍රී ලංකා ආර්ථික සමුළුවෙහි දී 'ආකූලත්වය හමුවේ වඩාත් සපන් වෙළෙඳ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම' පිළිබඳ සැසියේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස දුෂ්නි වීරකෝන් මහත්මිය සහභාගී වූවාය.

- දුෂ්නි වීරකෝන් මහත්මිය අගෝස්තු මස 03 වැනි දින ජනාධිපති ලේකම් කාර්යාලයෙහි පැවති "තිරසර ශ්‍රී ලංකාවක් - 2030 දැක්ම" සකස් කිරීම පිළිබඳව සාකච්ඡාවක කිරීම සඳහා පැවැත්වූ රැස්වීමකට සහභාගී වූවාය.

- දුෂ්නි වීරකෝන් මහත්මිය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා විසින් කැඳවනු ලැබූ, "2025 දැක්ම" පිළිබඳව සාකච්ඡා

කිරීම සඳහා ජූලි 03 වන දින අරලියගහ මන්දිරයේ දී සහ ජූලි 11, 14 සහ අගෝස්තු 8 යන දිනයන්හි ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි පැවති රැස්වීම්වලට සහභාගි වූවාය.

- ජනක විජයසිරි මහතා "ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලයේ අපනයන සම්මාන 2017" සඳහා විනිශ්චයකරුවෙකු ලෙස පත් කරන ලදී, අගෝස්තු 14.

- ජනක විජයසිරි මහතා, සැප්තැම්බර් මස 8 වැනි දින කොළඹ පැවති ලංකා වාණිජ මණ්ඩලයෙහි වෙළඳ නිර්බාධකරණ මෙහෙයුම් කමිටු රැස්වීමට සහභාගී විය.

- 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වයී නැමති වාර්තාව එළිදැක්වීමේ අවස්ථාවේදී දුෂ්නි වීරකෝන් මහත්මිය "ආර්ථිකයේ තත්වය 2017: ආර්ථික දර්ශනය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ආචාර්ය සමන් කැලේගම ශ්‍රවණාගාරය, ඔක්තෝබර් 10.

- ජනක විජයසිරි මහතා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාව සඳහා ජාතික අපනයන උපාය මාර්ගය" පිළිබඳ වට මේස සාකච්ඡාවට සහභාගී විය, ඔක්තෝබර් 12.

- ජනක විජයසිරි මහතා නොවැම්බර් 10 වැනි දින ලංකා වාණිජ මණ්ඩලයෙහි "වෙළඳ නිර්බාධකරණ මෙහෙයුම් කමිටුව" සඳහා සහභාගී විය.

- දෙසැම්බර් 8 වැනි දින ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි ශ්‍රවණාගාරයෙහිදී පවත්වන ලද "අවුරුදු 20 දී ඊෂවීඔැක - අනාගතය සඳහා ප්‍රමුඛතාවයන්" නැමති සම්මන්ත්‍රණයෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස දුෂ්නි වීරකෝන් මහත්මිය සහභාගී වූවාය.

- දුෂ්නි වීරකෝන් මහත්මිය දෙසැම්බර් 16-17 දිනවල කළුතර රෝයල් පාම් හෝටලයෙහි පැවති 'අග්‍රාමාත්‍යතුමාගේ ආර්ථික උපායමාර්ග අපක්‍රමණයී පිළිබඳ වැඩසටහනට සහභාගී වූහ.

- දුෂ්නි වීරකෝන් මහත්මිය ලංකා වාණිජ මණ්ඩලයෙහි ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ මෙහෙයුම් කමිටුවෙහි සාමාජිකාවක ලෙස පත් කරනු ලැබුවාය.

- දුෂ්නි වීරකෝන් මහත්මිය ජනාධිපති ලේකම් කාර්යාලයේ 'ශ්‍රී ලංකාවේ ජාතික තිරසාර සංවර්ධන දැක්ම - 2030ී සම්පාදනය කිරීම සඳහා වන විශේෂඥ කමිටුවෙහි සාමාජිකාවක ලෙස පත් කරනු ලැබුවාය.

- දුෂ්නි වීරකෝන් මහත්මිය '2025 දැක්ම - පොහොසත් රටකී නැමති ලියවිල්ල සකස් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ආර්ථික විද්‍යා ඒකකය සමග සම්බන්ධවී කටයුතු කළාය.

- ජනක විජයසිරි මහතා සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සඳහා "ප්‍රභවය පිළිබඳ නීති සහ ශ්‍රී ලංකාව විසින් ජී.එස්.පී. ප්ලස් වෙළඳ අනුග්‍රහය උපයෝජනය කිරීම වැඩි දියුණු කිරීම සඳහා තිබෙන අනාගත ඉඩප්‍රස්ථා" පිළිබඳ සංක්ෂිප්තයක් සකස් කළේය.
- අතිගරු ජනාධිපතිතුමා සඳහා "ශ්‍රී ලංකාව සඳහා වන ජාතික තිරසර සංවර්ධන දැක්ම 2030" පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් දායකත්වය සපයනු ලැබීය.

- ජනක විජයසිරි, කිත්මිත හේවගේ සහ විශ්වනාදන් සුබ්‍රමනියම් විසින් අගමැති කාර්යාලය සහ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සඳහා "ශ්‍රී ලංකා-වියට්නාම සහ ශ්‍රී ලංකා-මැලේසියානු ආයෝජන සහ වෙළඳ සම්බන්ධතා" පිළිබඳ ප්‍රතිපත්ති සටහනක් ලියන ලදී.

ප්‍රකාශන

- වීරකෝන්, ඩී. සහ හේවගේ, කේ.වී. (2017). "ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිපත්තිය: ආර්ථික දෘෂ්ඨිකෝණය" කැලේගම, එස්. (සංස්කාරණය) ප්‍රකාශනයෙහි "රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, වර්ධනය සහ සාර්ව ස්ථාවරත්වය", ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 17 - 42

- වීරකෝන්, ඩී. (2017) "නව සංවර්ධන මූල්‍ය පසුබිම තුළ ශ්‍රී ලංකාවේ ණය ගැටළු", තුන්වැනි ලෝකයේ සාකච්ඡාමය තේමා, වෙළුම 2, අංක 6, පිටු. 774-761.

- වීරකෝන්, ඩී., 2017, "සාර්ව ආර්ථික ස්ථාවර භාවය, වර්ධනය සහ ණය තිරසාරත්වය", ශ්‍රී ලංකා ආර්ථික සඟරාව, වෙළුම 14, අංක 2

- වීරකෝන්, ඩී. 2017, "චීන - ශ්‍රී ලංකා සබඳතා වල අභියෝග සහ ආර්ථික සහයෝගිතාවයේ අනාගතය", වැන්ග් ලින්ග්ජි සහ ෂාඕ ජියංග්ලින් (සංස්කාරකවරුන්), "අසල්වැසි ප්‍රදේශ වල පොදු අභිප්‍රායයෙහි ප්‍රජාව ගොඩනැගීම", සමාජ විද්‍යා අධ්‍යයන පුවත්පත, චීනය

- හරිනි වීරසේකර "කාර්තුමය සාර්ව ආර්ථික සමාලෝචනය" නැමති අන්තර්ජාලයෙන් බාගත කර ගත හැකි ප්‍රකාශනය සම්පාදනය කළාය.

- අරුණතිලක, එන්. සහ ජයවර්ධන, පී. (2017), "බදු ප්‍රතිසංස්කරණවල සමාජීය බලපෑම් ගණනය කිරීම", එස්. කැලේගම (සංස්.) ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිපත්තිය, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

- අරුණතිලක, එන්.; ඉන්චෝස්ටේ, එන්. ජී.; සහ ලුස්ටිග්,

එන්. (2017) " ශ්‍රී ලංකාවේ බදු ආපාතය සහ වියදම් කිරීම", ජී. ඉන්චෝස්ටේ සහ එන්. ලුස්ටිග් (සංස්කාරකවරුන්.), බදු හා සංක්‍රාමවල ව්‍යාප්ති බලපෑම - අඩු හා මධ්‍ය ආදායම් ලබන රටවල් අටකින් ලබා ගත් සාක්ෂි, වොෂින්ටන් ඩී.සී., ලෝක බැංකුව

- විජයසිරි, ජේ. (2017), "ගෝලීය සංදර්භය තුළ එක් තීරයක් - එක් මාවතක් වැඩසටහනෙහි එක් තීරයක් - එක් මාවතක් ක්‍රියාමාර්ගය පිළිබඳ ශ්‍රී ලංකාවේ දෘෂ්ටි කෝණය", වෑන්ග් ලින්ග්ජි සහ ෂාඕ ජියංග්ලින් (සංස්කාරකවරුන්), 'ගෝලීය සංදර්භය තුළ එක් තීරයක් - එක් මාවතක් වැඩසටහනි, සමාජ විද්‍යා අධ්‍යයන පුවත් පත.

- විජයසිරි, ජේ. (2017), "වෙළඳාම හුදෙක් විශාල ව්‍යාපාර සඳහා පමණක් නොවේ: 2030 දී දකුණු ආසියාවෙහි ප්‍රතිරූපය යළි ගොඩනැගීමේදී ශ්‍රී ලාංකීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල කාර්ය භාරය", මුස්තාෆිෂර් රහ්මාන් සහ ෆාමිඩා ඛතුන් (සංස්කාරකවරුන්), '2030 දී දකුණු ආසියාවේ ප්‍රතිරූපය යළි ගොඩ නැගීම් ප්‍රතිපත්ති සංවාද මධ්‍යස්ථානය, ඩකා.

සන්නිවේදනය / ප්‍රචාරණය

2017 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් බ්ලොග් අඩවි සහ පුවත්පත් ලිපි හරහා වෙළඳාම පිළිබඳ ඔවුන්ගේ පර්යේෂණ කටයුතු පිළිබඳව ප්‍රචාරණය කරන ලදී. ජනක විජයසිරි විසින් ලියන ලද බ්ලොග් ලිපි "ශ්‍රී ලංකාවට පකිස්ථාන-චීන නිදහස් වෙළඳ ගිවිසුමෙන් උගත හැකි පාඩම් හතරක්", "එකට එක් වන්න: ශ්‍රී ලාංකීය ගම්මිරිස් කර්මාන්තයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම", සහ "මැලේසියාව සමග නිදහස් වෙළඳ ගිවිසුම: එය ශ්‍රී ලංකාව සමග වෙළඳ ගලනයකට සහ ආයෝජන පුළුල් කිරීම සඳහා මග පාදන්නේද?" යන මාතෘකා යටතේ දේශීය පුවත් පත්වල නැවත පළ කරන ලද අතර, කිත්මිණ හේවගේ විසින් "ශ්‍රී ලංකාවේ නව කලාපවාදය: දකුණු ආසියාවෙන් ඔබ්බට බැලීම" යන මාතෘකාව යටතේ ඇමරිකා එක්සත් ජනපදයේ ස්ටිම්සන් මධ්‍යස්ථානයෙහි 'දකුණු ආසියානු හඬ' සඳහා ලිපියක් ලියන ලදී. එයට අමතරව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් දේශීය සහ අන්තර්ජාතික වැඩසටහන් වල සාකච්ඡා මණ්ඩලය සාමාජිකයන් ලෙස සහභාගී වී ඉදිරිපත් කිරීම් සිදු කළහ. එමෙන්ම "ශ්‍රී ලංකාවේ කුළු බඩු සහ කොහු කර්මාන්ත අංශ වල කාන්තාවන්ට හිමි සහ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත: අවහිරතා සහ ප්‍රතිපත්ති විකල්ප" යන මාතෘකාව යටතේ සිදුකරන ලද අධ්‍යයනය මගින් සොයාගත් කරුණු පිළිබඳව 'අදී සිංහල පුවත්පත විසින් සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවකට සුනිමලී මදුරාවල සහ දිලානි හිරිමුතුගොඩගේ සහභාගී වූහ.

තවද, බදු පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනයන් මගින් සොයා ගත් කරුණු දේශීය මාධ්‍ය ප්‍රචාරක මාර්ග හරහා ප්‍රචාරණය කරන ලද අතර එමගින් නිෂා අරුණතිලක සහ ප්‍රියන්ත ජයවර්ධන විසින් ලියන ලද පහත සඳහන් ලිපි පළ විය: " පුඩිමෙහි රසය එය ආහාරයට ගන්නා විට තහවුරු වේ: ශ්‍රී ලංකාවේ නව දේශීය ආදායම් පනතෙහි ව්‍යාප්ති සහ ආදායම් ගම්‍යමානයන්" සහ "ශ්‍රී ලංකාවේ අලුත් නීතිය මගින් අඩු හා මධ්‍ය ආදායම් ලබන පුද්ගලයන් සඳහා බදු කපා හැරීම්" ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් වෙළඳ උපාය මාර්ග සහ ප්‍රතිපත්ති, ගෝලීය වර්ධනය සමඟ තරගකාරීව සිටීම, යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් සහනාධාරයේ බලපෑම, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි බලපෑම, සහ ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික දර්ශනය වැනි ක්ෂේත්‍ර පිළිබඳව දේශීය මෙන්ම අන්තර්ජාතික වේදිකාවල ද ඉදිරිපත්කිරීම් සිදු කළහ.

පරිසරය, ස්වාභාවික
සම්පත් සහ කෘෂිකර්මය

පරිසරය සහ ස්වාභාවික සම්පත් සහ කෘෂිකර්මාන්තය

ලෝකය තිරසර සංවර්ධන ඉලක්ක යුගයක් වෙත පිවිසෙමින් සිටින වාතාවරණයක දී ශ්‍රී ලංකාව ප්‍රතිසංස්කරණ මාවතක ගමන් කරමින් සිටියි. තිරසර සංවර්ධනය ළඟා කර ගැනීම බුද්ධිමත් ප්‍රතිපත්ති තීරණ වලින් මෙහෙය වනු ලැබිය යුතු සියුම් සංතුලනාත්මක ක්‍රියාවකි. ගෝලීය දේශගුණික විපර්යාස මගින් ඉදිරියේදී එල්ල කරනු ලැබිය හැකි තර්ජනය විසින් සංවර්ධනය යන්න අඩු කාබන් සහ දේශගුණ ප්‍රතිවර්තනය සහිත එකක් විය යුතු බවට අමතර කොන්දේසි නිර්මාණය කර තිබේ. එමෙන්ම වර්ධන ක්‍රියාවලිය මගින් ඇතිවිය හැකි අහිතකර පාරිසරික විපාක වලින් සිදුවිය හැකි හානිය අවම කිරීම කෙරෙහි රට අවධානය යොමු කළ යුතු වේ. ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍ර අතර කෘෂිකර්ම ක්ෂේත්‍රය පරිසරය සහ ස්වභාවික සම්පත් මත උපරිම මට්ටමෙන් රඳා පවතී. දේශීය කෘෂිකාර්මික අංශය අඩු ඵලදායීතාවය, අකාර්යක්ෂම සම්පත් පරිහරණය, ආහාර සුරක්ෂිත භාවය නොමැති වීම සහ තිරසාර නොවන කෘෂිකාර්මික පරිචයන්හි බලපෑමට ලක් වී තිබෙන අතර, අඩු ඵලදායිතාව අස්ථාවර වෙළඳ භාණ්ඩ මිල සහ අධික නිෂ්පාදන පිරිවැය නිසා වැවිලි අංශය ද අර්බුදයට ලක් වී තිබේ. ආහාර සුරක්ෂිතභාවය, කෘෂිකාර්මික අගය දාමයන්, කෘෂිකාර්මික වෙළඳාම සහ ඉඩම් ප්‍රතිපත්තිය අවධානය යොමු කළ යුතු වැදගත් ක්ෂේත්‍ර බවට පත්වී තිබේ.

පර්යේෂණාවල අවධානය

දේශගුණික විපර්යාස

දේශගුණික විපර්යාස වලට එරෙහිව සටන් කිරීම ඉදිරි වර්ෂවලදී මුහුණ දීමට සිදුවන බරපතළ අභියෝගයකි. අනුවර්ත වීම එම අභියෝග වලට මුහුණ දීමේ ප්‍රධානතම උපායමාර්ගය වේ. දේශගුණික විපර්යාස මගින් එල්ල කරනු ලබන තර්ජනයට සාර්ථක ලෙස අනුවර්තනය වීම් සඳහා තොරතුරු තාක්ෂණය, ප්‍රතිපත්ති, ආයතන සහ සම්පත් සචලීකරණය වැනි ක්ෂේත්‍රවල දැනට පවතින අඩුපාඩු සම්පූර්ණ කළ හැකි ආකාරයේ ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අවශ්‍ය කරයි. දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ ආයතන, තාක්ෂණය, ප්‍රතිපත්ති සහ සම්පත් සචලීකරණයෙහි ඇති ප්‍රධානතම අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා වන අනුවර්තී ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ රාමුවක් මත පදනම් වේ.

පාරිසරික ප්‍රතිපත්ති සහ හරිත ආර්ථිකය

මෑත කාලයේදී ලෝකය පුරා ආර්ථිකයන් හරිතකරණය කිරීම පිළිබඳ වැඩි වශයෙන් අවධානය යොමු කරමින් සිටිති. ලෝක නායකයින් 2015 වර්ෂයේදී තිරසර සංවර්ධන ඉලක්ක අනුගත කර ගත්හ. තිරසර සංවර්ධන ඉලක්ක වල හරය වන්නේ ගෝලීය ආර්ථිකය හරිත ආර්ථිකයක් බවට පත් පරිවර්තනය කිරීමයි. හරිත ආර්ථිකය පිළිබඳ ප්‍රතිපත්තිය අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ මගින් ඉස්මතු වෙමින් පවතින ගෝලීය හරිත ආර්ථික අවස්ථා ග්‍රහණය කර ගනිමින් රටෙහි ස්වභාවික ප්‍රාග්ධනය තුළින් තිරසර පරිසර පද්ධති ගලනයක් සහතික කළ හැකි ප්‍රතිපත්ති නවකරණයන් කෙරෙහි අවධානය යොමු කරයි.

ස්වභාවික සම්පත් ප්‍රතිපත්ති සහ ආයතන

ස්වභාවික සම්පත් ප්‍රතිපත්ති සහ ආයතනවල අරමුණු වන්නේ සම්පත් පරිහරණ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සහ ස්වභාවික සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීම වේ. බොහෝ ශ්‍රී ලාංකිකයින්ගේ ජීවනෝපායයන් ඉඩම්, ජලය, ධීවර සහ වනාන්තර වැනි ස්වභාවික සම්පත් මත විශාල ලෙස රඳා පවතී. මෙම ස්වභාවික සම්පත් ප්‍රශස්ත ලෙස සහ පරම්පරාන්තර හා පරම්පරා අභ්‍යන්තර සාධාරණත්වය සහතික වන පරිදි භාවිතා කරනු ලබන බව සහතික කිරීම සඳහා ආයතන තිබීම අත්‍යවශ්‍ය වේ. එම නිසා ස්වභාවික සම්පත් පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පර්යේෂණ මගින් දැනට තිබෙන ස්වභාවික සම්පත් ප්‍රතිපත්ති, දැනට තිබෙන දේපළ අයිතිවාසිකම් ක්‍රමවේද සහ ආයතන, ඒවායෙහි ශක්තීන්/සීමාවන් සහ ඒවා වැඩි දියුණු කිරීමේ ක්‍රම පිළිබඳව අවධානය යොමු කරයි.

ආහාර සුරක්ෂිතතාව

ශ්‍රී ලංකාව මානව සංවර්ධන සහ සෞඛ්‍ය දර්ශක බොහොමයක සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන තිබුණ ද, එය ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය සම්බන්ධයෙන් දිගින් දිගටම ගැටලුවලට මුහුණ දෙමින් සිටියි. එබැවින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධ පර්යේෂණ කෙරෙහි, විශේෂයෙන් ම රටෙහි ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධ තත්වය ඇගයීම, ආහාර සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති සහ වැඩසටහන්ගත ප්‍රතිචාර ඇගයීම, සහ අවසාන වශයෙන් ආහාර සුරක්ෂිතභාවය සහිත දේශයක් උදෙසා ගමන් කිරීමට බාධා පමුණුවන ගැටලු පරීක්ෂා කිරීම සම්බන්ධ පර්යේෂණ කෙරෙහි අවධානය යොමු කර ඇත.

කෘෂිකාර්මික අගය දාම

අන්තර්කරණය වූ කෘෂි ව්‍යාපාර ග්‍රාමීය ආදායම් ඉහළ නැංවීම සඳහා, රැකියා නිර්මාණය කිරීම සඳහා සහ දේශගුණික විපර්යාසවලට අනුගත වීම සඳහා ප්‍රජාවන්ට උපකාරී වන ප්‍රබල මෙවලමක් බව පැහැදිලි වේ. ප්‍රතිපත්ති

අධ්‍යයන ආයතනය පසු ගිය දශක කිහිපය පුරා වෙළඳ පොළ සහ වෙළඳාම සමග ඒකාබද්ධ වීම මගින් ග්‍රාමීය දිළිඳු ජනතාවට පූර්ණ ලෙස ප්‍රතිලාභ ලැබිය හැකි ආකාර පිළිබඳව පර්යේෂණ සිදු කර ඇත. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය තිරසර ආකාරයට කුඩා පරිමාණ ගොවීන් ගෝලීය අගය දාමයන් සමග සම්බන්ධ කිරීමේදී ශ්‍රී ලංකාව අනුගත කර ගෙන ඇති ව්‍යාපාර ආකෘතිවල ප්‍රධාන ලක්ෂණ විශ්ලේෂණය කිරීම සඳහා එහි අගය දාමය පර්යේෂණ අඛණ්ඩව සිදු කර ඇත.

පර්යේෂණ අධ්‍යයන

දේශගුණික රටාවන්හි වෙනස්වීම් වර්ධනය වෙමින් පැවතීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික අංශයට ඇතිවන බලපෑම් සැලකිල්ලට ගෙන දැනට පවතින භෝග රක්ෂණ වැඩසටහන්, අවදානම් කළමනාකරණ උපාය මාර්ග සහ ගොවීන්ට තිබෙන දේශගුණය සම්බන්ධ අවදානම් කළමනාකරණය කිරීමේදී දේශගුණ රක්ෂණවල විභව කාර්ය භාරය ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් සඳහා දේශගුණ රක්ෂණය නැමැති අධ්‍යයනය සිදු කරන ලදී. ශ්‍රී ලංකාවෙහි වර්ෂාපතනය දර්ශක පදනම් කරගත් රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණික හැකියාව පවතින බව මෙම අධ්‍යයනය මගින් සොයා ගත් කරුණු වලින් පෙන්වා දෙයි. මේ සඳහා කාලීන සහ නිරවද්‍ය වර්ෂාපතන දත්ත තිබීම වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ රක්ෂණය සඳහා සහභාගිත්වය වැඩි දියුණු කිරීම පිණිස ගොවීන් සඳහා වන දේශගුණ රක්ෂණය පිළිබඳ පරිපූර්ණ දැනුවත්භාවයක් ලබා දීමේ සහ අධ්‍යාපනය ලබා දීමේ වැඩසටහන් පැවැත්වීම අත්‍යාවශ්‍ය වේ.

දේශගුණික විපර්යාසවලට හැඩගැසීම සඳහා වන අභියෝග : තොරතුරු සහ සංනිවේදන පරතයන් පියවීම නැමති කාර්ය මූලික පර්යේෂණය අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සමස්ත අනුවර්තන ධාරිතාව වැඩි දියුණු කරමින් ගොවි ප්‍රජාව දේශගුණික විපර්යාසවල බලපෑමට ලක් වීමේ අවදානම අඩු කළ හැකි මැදිහත් වීම් පෙන්නුම් කිරීම කිරීම සඳහා සැලසුම් කර ඇත. මෙම පර්යේෂණය මගින් දේශගුණ විද්‍යා සම්බන්ධ දේශීය දැනුම් පද්ධතීන් වල ශක්තීන් සහ ආකෘතිකරණ තාක්ෂණික ක්‍රමවේදවල දියුණුව යන දෙකම එකට එක් කළ හැකි ඒකාබද්ධ දේශගුණ තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ. ඒකාබද්ධ දේශගුණ තොරතුරු කළමනාකරණ පද්ධති ආකෘති ශ්‍රී ලංකාවේ අවදානම් සහගත ගොවි ප්‍රජාවන් තුළ නියාමන පරීක්ෂාවට ලක් කර ඇති අතර එය අනෙකුත් සංවර්ධනය වෙමින් පවතී කලාප තුළ යොදා ගැනීමේ විභවතාවය ද තිබේ.

දේශගුණික විපර්යාස වලට හැඩගැසීම සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අංශයේ ආපදා අවදානම අඩු කිරීම නැමැති අධ්‍යයනයෙහි අරමුණු ආන්තික කාලගුණික තත්වයන්, සෙමින් වර්ධනය වන ආපදා සහ සුපුරුදු කාලගුණික විචලනයන් හි වෙනස් වීම් හේතුවෙන් සිදුවන හානි සහ

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් සඳහා වන දේශගුණ රක්ෂණයකි නැමැති මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනය මගින් සොයාගත් කරුණු ප්‍රචාරණය කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජනවාරි 24 වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයේදී වැඩමුළුවක් සංවිධානය කළේය.

පාඩුවලට ගොදුරුවීමේ ඇති අවදානම්සහගත බව හඳුනාගැනීම; හානි සහ පාඩු තක්සේරු කිරීම සඳහා සකස් කර ඇති ක්‍රමවේදාත්මක ප්‍රවේශයන් ගවේෂණය කිරීම සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අනුගත කර ගත හැකි සුදුසු ප්‍රවේශයන් හඳුනාගැනීම; සහ හානි සහ පාඩු තක්සේරු කිරීම පිණිස තෝරාගත් ප්‍රවේශවල අදාළත්වය පෙන්නුම් කරමින් දේශගුණය ආශ්‍රිත ආපදා හේතුවෙන් ඇති වන, කෘෂිකාර්මික අංශයට සිදු වන ප්‍රවර්තන හානි සහ පාඩු සඳහා පාදීය මිනුම් දඬු ස්ථාපිත කිරීමේ ක්‍රම හඳුනා ගැනීම වේ.

දේශගුණික විපර්යාස ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සහ ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ආශ්‍රිත ප්‍රතිපත්තිවලට සංකලනය කිරීම පිළිබඳ අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම්කරණ ප්‍රතිපත්තිය තුළට දේශගුණික විපර්යාස පිළිබඳ ගැටළු අන්තර්ගත කිරීම සඳහා සුදුසු රාමුවක් හඳුනා ගැනීමේ අරමුණ ඇතිව දේශගුණික විපර් විපර්යාස සහ ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනය අතර ඇති වෙමින් පවතින සම්බන්ධතාවය පරීක්ෂාවට ලක් කෙරේ. ශ්‍රී ලංකා පරිපූර්ණ ආපදා කළමනාකරණ සැලැස්ම 2004 - 2018 සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් මේ වන විටත් දේශගුණික විපර්යාස නාගරික ප්‍රතිපත්තිවල ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම් සඳහා වන කෂේත්‍ර සහ ක්‍රියාමාර්ග හඳුනා ගෙන තිබේ. එයට අමතරව පළාත් පාලන ආයතන විසින් ආපදා අවදානම් අවම කිරීමේ කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය ප්‍රඥප්ති එමගින් නියම කර තිබේ. එමෙන්ම, මෙම අධ්‍යයනය මගින් දේශගුණික විපර්යාසවල බලපෑමට ප්‍රතිචාර දැක්වීම සඳහා ජාතික පාර්ශවකරුවන්ගේ සහ පළාත් පාලන ආයතනවල ධාරිතාවයන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කරන ලෙස ද ඉල්ලා සිටියි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඉඩම් සහ ප්‍රවාහන ක්ෂේත්‍රවල පවතින තත්වය සහ අවශ්‍යතා ඇගයීම පිණිස සහ දිවයින පුරා ආයතන සහ ගෘහ මට්ටමෙන් සිදු කරනු ලබන ඉඩම් සහ ප්‍රවාහන ක්ෂේත්‍රවල පාර්ශවකරුවන් පිළිබඳ පරිපූර්ණ සමීක්ෂණයක් පදනම් කරගෙන අනාගත

වැඩි දියුණු කිරීම් ඉඩ ප්‍රස්ථා හඳුනා ගැනීම පිණිස පාර්ශවකරුවෙකු වශයෙන් ඇමරිකා එක්සත් ජනපදයෙහි සහස්‍ර අභියෝග සංස්ථාව විසින් දියත් කරන ලද අධ්‍යනයක් සිදු කිරීමෙහි නියැළී සිටියි. ඉඩම් සහ ප්‍රවාහන අංශවල පවතින ගැටලු පිළිබඳ ආර්ථික විශ්ලේෂණය නැමැති අධ්‍යයනය මගින් සොයාගත් කරුණු ශ්‍රී ලංකාවෙහි ඉඩම් සහ ප්‍රවාහන ක්ෂේත්‍රවල වැඩි දියුණු කිරීම් සම්බන්ධ සංවර්ධන තීරණ ගැනීමේදී සෘජුවම යොදා ගනු ලැබේ. 'ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය පිළිබඳ ජාතික උපායමාර්ගික සමාලෝචනය: කුසගින්න තුරන් කිරීම උදෙසා' නැමැති පර්යේෂණය මගින් රටෙහි සමස්ථ ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණ තත්ත්වය පිළිබඳ පුළුල් සහ අන්තර්කරණ අධ්‍යයනයක් සිදුකිරීමට සහ ප්‍රතිපත්ති සහ ජාතික ප්‍රතිචාරවල තිබෙන අඩුපාඩු, සම්පත් සහ ආයතනික ධාරිතාවයන් ඇතුළුව කුසගින්න තුරන් වූ තත්වයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ඇති අභියෝග හඳුනා ගැනීමට අපේක්ෂා කරයි. අධ්‍යයනය මගින් සොයා ගත් කරුණු අනුව ආර්ථික, සමාජයීය සහ පාරිසරික අංශ පුරා පැතිරුණු ඒකාබද්ධ ප්‍රවේශයන් හරහා ආහාර සුරක්ෂිතතාවය, පෝෂණය සහ තිරසර කෘෂිකර්මයට අදාළ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ යෝජනා කරන ලදී.

'ශ්‍රී ලංකාවේ තෝරාගත් භෝග සහ පශු සම්පත් නිෂ්පාදන සම්බන්ධ සැපයුම් සහ මිල හැසිරීම් පිළිබඳ අධ්‍යයනයයි' නැමැති අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ ප්‍රධාන ප්‍රතිපත්ති නිර්දේශයන් හඳුනා ගැනීමේ ඉලක්කය සහිතව ඉස්මතු වෙමින් පවතින ගෝලීය ආහාර සුරක්ෂිතතා අභියෝග සන්දර්භයෙහි සහල්, මත්ස්‍ය සහ කිරි, සහ කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ඉල්ලුම නිර්මාණය වීම, සැපයුම් ප්‍රතිචාර සහ අගය දාම සම්බන්ධතා විශ්ලේෂණය කිරීමයි. එමෙන්ම මෙම අධ්‍යයනය මගින් එකී නිෂ්පාදන වල කාර්යක්ෂම වෙළෙඳ පොළ ක්‍රියාකාරීත්වයට බලපාන ආයතනික සහ තාක්ෂණික අවහිරතාවයන් ද හඳුනා ගන්නා ලදී. මෙම අධ්‍යයනය මගින් අනාවරණය කර ගත් කරුණු අනුව ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්තිවලට දායක වීමේ අරමුණ ඇතිව ප්‍රායෝගික ප්‍රතිපත්ති මැදිහත්වීම් ද යෝජනා කරන ලදී.

'කුරුඳු, ගම්මිරිස් සහ කරඳමුංගු යන භෝග ඉලක්ක කරමින් ශ්‍රී ලංකාවේ කුළු බඩු අගය දාම පිළිබඳ විශ්ලේෂණයයි' නැමැති අධ්‍යයනය මගින් අගය දාම විශ්ලේෂණ ක්‍රමය යොදා ගනිමින් ගුණාත්මකභාවය සහ සෞඛ්‍යාරක්ෂිත බව සම්බන්ධ ප්‍රමිතීන් ද ඇතුළුව ශ්‍රී ලංකාවේ කුළු බඩු ක්ෂේත්‍රය මුහුණ දෙන අවස්ථා සහ බාධක හඳුනා ගැනීම මෙන්ම අගය දාම විශ්ලේෂණය පදනම් කර ගෙන කුළු බඩු ක්ෂේත්‍රය නගාසිටුවීම සඳහා සහ නිෂ්පාදන/අපනයන අවස්ථා පුළුල් කිරීම සඳහා එම දාමයෙහි විවිධ අවධීන්හිදී අවශ්‍ය ප්‍රතිපත්ති මැදිහත්වීම් සිදු කිරීම සඳහා වන නිර්දේශ සපයාදීම අරමුණු කරන ලදී. මෙම අධ්‍යනය මගින් ප්‍රධාන වශයෙන් ම කුරුඳු, ගම්මිරිස් සහ කරඳමුංගු යන භෝග කෙරෙහි අවධානය

පර්යේෂණ සාමාජික මනෝජ් තිබ්බොටුවාව පෙබරවාරි 13 වැනි දින කොළඹදී පැවති "කුසගින්න තුරන් කිරීම උදෙසා ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳ ජාතික ක්‍රමෝපායික සමාලෝචනය" එළි දැක්වීමේ අවස්ථාවේදී

යොමු කරන ලදී. මෙම අධ්‍යනය මගින් අනාවරණය කරගත් කරුණු තුළින් ප්‍රතිපත්ති මැදිහත්වීම් සිදු කිරීම සඳහා අවශ්‍ය පරිපූර්ණ නිර්දේශ සපයා දෙන ලද අතර, පර්යේෂණ කණ්ඩායම විසින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් අදාළ ආයතන වල නිලධාරීන් ගේ හැකියා වැඩි දියුණු කිරීම සඳහා අගය දාම විශ්ලේෂණය පිලිපිළිබඳ පුහුණු සම්මන්ත්‍රණයක් ද පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය, ජයග්‍රහණ සහ ඉදිරි අභියෝග යන අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ පවතින ආහාර සුරක්ෂිතතා තත්වය පිළිබඳව විමසා බලන ලද අතර, රටෙහි ආහාර සුරක්ෂිතතාවය අත්කර ගැනීමේ දී මුහුණ දීමට සිදු වන විවිධ අභියෝග සහ තර්ජන ද හඳුනා ගන්නා ලදී.

ප්‍රතිපත්ති, නියාමන සහ ආයතනික පරිසරය විශ්ලේෂණය කරන අතර ම එමගින් ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට වැරදුණු තැන් පිළිබඳව ද එමගින් තවදුරටත් පරීක්ෂා කර බලනු ලැබීය. අවසාන වශයෙන්, රටෙහි ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ ළඟා කර නොගත් සමාජ සහ ආර්ථික ඉලක්කය සඳහා කෙටි කාලීන සහ දීර්ඝ කාලීන විසඳුම් ද මෙම අධ්‍යයනය මගින් යෝජනා කර තිබේ. නෝර්ත් ලංකා ෆැමිලි ෆුඩ් පුද්ගලික සමාගම විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බහු-ආංශික, ධ්‍යම පරිමාණ පිරි සැකසුම් කර්මාන්තශාලාවක් ඉදි කිරීම හේතුවෙන් ඇතිවී තිබෙන ප්‍රතිඵල, පරිවර්තනයන් සහ බලපෑම් පිළිබඳව ඉදිරි ඇගයීම සහ ලේඛනගත කිරීම සිදු කිරීම සඳහා පාදීය අධ්‍යයනයක් සිදු කිරීම මෙහි මූලික ම අරමුණ විය. මෙම අධ්‍යයනය මගින් සොයා ගත් මූලික කරුණුවලින් එම ප්‍රදේශයේ සමාජ ආර්ථික දර්ශක ඉස්මතු කර පෙන්වන ලද අතර එම ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයේ නියැළී සිටින්නන් වැඩි වැඩියෙන් නූතන කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම සහ අගය එකතු කිරීම් භාවිතා කළ යුතු බව අවධාරණය කරයි. එමෙන්ම අගය දාම නගා සිටුවීම සඳහා රාජ්‍ය පෞද්ගලික නිෂ්පාදන හවුල්කාරීත්වයන් අනුගත කර ගැනීමේ වැදගත්කම ද මෙම සොයා සොයා ගැනීම් මගින් පෙන්වාදෙයි.

ප්‍රතිපත්ති නියැළීම්

- අතුල සේනාරත්න මහතා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාසවල බලපෑම් සඳහා වූ ජාතික අනුවර්තන සැලැස්ම කියාත්මක කිරීම සඳහා වන ජාතික මෙහයුම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළාය

- අතුල සේනාරත්න මහතා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද 'නීල-හරිත: ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සඟරාවේ කතෘ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කළේය.

- අතුල සේනාරත්න මහතා තේ පර්යේෂණ මණ්ඩලයේ පර්යේෂණ පිළිබඳ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය.

- අතුල සේනාරත්න මහතා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි කෘෂිකාර්මය පිළිබඳ ආංශික කමිටුවෙහි සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය.

- මනෝජ් තිබ්බොට්ටුවාව මහතා ජනාධිපති ලේකම් කාර්යාලයෙහි ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි තාක්ෂණ ඇගයුම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් සේවය කළේය.

- මනෝජ් තිබ්බොට්ටුවාව මහතා කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා වන සභාවෙහි සමාජ ආර්ථික පර්යේෂණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස සේවය කළේය.

- මනෝජ් තිබ්බොට්ටුවාව මහතා සහ දිලානි හිරිමුතුගොඩගේ මහත්මිය ශ්‍රී ලංකා රජය සහ ලෝක ආහාර වැඩසටහන සඳහා කුසගින්න තුරන් කිරීම සඳහා වන ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳ ජාතික ක්‍රමෝපායික සමාලෝචනය සකස් කිරීමේ පර්යේෂණ කමිටුවෙහි සේවය කළහ.

- අතුල සේනාරත්න මහතා, මනෝජ් තිබ්බොටුවාව මහතා සහ කාන්චනා වික්‍රමසිංහ මහත්මිය ලෝක කෘෂි-වන විද්‍යා මධ්‍යස්ථානය, ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය හා නීල හරිත ආර්ථික මූල්‍ය පහසුකම, එ.ජා.ප.වැ., සමග '2030 දැක්මී ට සමගාමීව ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකාව සඳහා තිරසර ඉඩම් ප්‍රතිපත්තියක් සඳහා වන මාර්ග සිතියම සකස් කිරීම සඳහා වූ ක්‍රියාකාරී කණ්ඩායමෙහි සේවය කළහ.

- මනෝජ් තිබ්බොටුවාව සහ අතුල සේනාරත්න ලෝක බැංකුවේ අනුග්‍රහය යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන කෘෂිකාර්මික නවීකරණ ව්‍යාපෘතිය සඳහා සමාජ-ආර්ථික පර්යේෂණ ප්‍රමුඛතා හඳුනා ගැනීමේ කාර්යට සහභාගී වූහ.
- මනෝජ් තිබොට්ටුවාව ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සමග එක්ව ආහාර සුරක්ෂිතතා හා තත්ත්ව අභියෝග සහ අවස්ථාවන් හඳුනා ගැනීමේ කාර්යයට සහභාගී විය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික මනෝජ් තිබ්බොටුවාව මහතා සැප්තැම්බර් 19 - 21 දිනවල පැවැති 'අපනයන ප්‍රවර්ධනය හා කෘෂිකර්මික සහ ආහාර නිෂ්පාදන සඳහා ප්‍රධාන ගෝලීය වෙළඳ පළ සඳහා ඇති ප්‍රවේශයි නැමති සමුළුවේහිදී කලාපීය සහයෝගීතාවය වැඩි දියුණු කිරීමේ වැදගත්කම අවධාරණය කළේය.

- කාන්චනා වික්‍රමසිංහ මහත්මිය ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජාතික වශයෙන් නිශ්චය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම් හා අධීක්ෂණ කමිටුවේ සාමාජිකාවක ලෙස සේවය කළාය.

- කාන්චනා වික්‍රමසිංහ මහත්මිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සකස් කළ ශ්‍රී ලංකා සංචාරක උපාය මාර්ගික සැලැස්ම 2017-2020 සකස් කිරීම සඳහා සම්පත් දායකයෙකු ලෙස කටයුතු කළාය. කාන්චනා මහත්මිය ප්‍රධාන වශයෙන් ම තිරසර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වූවාය.

- දිලානි හිරිමුතුගොඩගේ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සහ වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් අප්‍රෙල් මාසයේදී සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දැනුම හා සංස්කෘතික ප්‍රකාශයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත" සකස් කිරීම සඳහා සම්පත් දායකයෙකු ලෙස සහ ඒ පිළිබඳ සාකච්ඡාවලදී සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස කටයුතු කළාය.

- දිලානි හිරිමුතුගොඩගේ මහත්මිය ලෝක බුද්ධිමය දේපළ සංවිධානය, ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාලය සහ වෙළඳ හා වාණිජ කටුයුතු අමාත්‍යාංශය විසින් අප්‍රේල් මාසයේදී සංවිධානය කරන ලද 'බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ සාම්ප්‍රදායික දැනුම් පිළිබඳ ජාතික වැඩමුළුවෙහි සම්පත්දායකයෙකු ලෙස ලෙස කටයුතු කළාය.
- දිලානි හිරිමුතුගොඩගේ මහත්මිය ජූලි මාසයේදී සබරගමුව විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද 'ලංකාවේ කුරුඳු අගය දාම සංවර්ධනයී වැඩසටහනේ සම්පත් දායකයෙකු ලෙස කටයුතු කළේය

ප්‍රකාශන

- සේනාරත්න, ඒ. (2017), එක්සත් ජනපදය පැරිස් ගිවිසුමෙන් ඉවත් වීම; දේශගුණික විපර්යාස පිළිබඳ ගෝලීය දේශපාලනය, නීල-හරිත: ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සඟරාව, වෙළුම ෂෂ, දෙසැම්බර් 2017: 41-45 පිටු

- තිලකරත්න, ජී., නානායක්කාර, ඩබ්ලිව්., මදුරාවල, එස්., ජයරත්න, එස්., වික්‍රමසිංහ, කේ. (2017), තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ජාතික මට්ටමේ ගමන්මානයන්: ශ්‍රී ලංකාවෙහි තත්වය, සදර්න් වොයිස් කාලික පත්‍රිකා අංක 41, බංග්ලාදේශය: ධකා

- වික්‍රමසිංහ, කේ. (2017), ශ්‍රී ලංකාව සඳහා හරිත ආගන්තුක සත්කාරක කර්මාන්තයක්, ශ්‍රී ලංකා එක්ස්පෝර්ටර්, 96 වැනි මුද්‍රණය, අප්‍රේල් - ජූනි 2017

- වික්‍රමසිංහ, කේ. (2017), ශ්‍රී ලංකාවේ තේ සඳහා දේශගුණික රක්ෂණය, ශ්‍රී ලංකා එක්ස්පෝර්ටර්, ජූලි - සැප්තැම්බර් 2017

- හිරිමුතුගොඩගේ, ඩී., "ශ්‍රී ලංකාවේ හරිත සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේදී බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වල කාර්යභාරය", විදේශ ආර්ථික විද්‍යා සඟරාව (ඉංග්‍රීසි) (වෙළුම 87), ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ආයතනය, විදේශ වෙළඳාම පිළිබඳ විශ්ව විද්‍යාලය, වියට්නාමය

- තිබ්බොටුවාව, ආර්.එම්.එම්.අයි., සමරතුංග, පී., හිරිමුතුගොඩගේ, ඩී., බණ්ඩාර, එස්, හේවගේ, එස්., අනුර කුමාර, පී., ජයතිස්ස, ආර්., නානායක්කාර, එල්., බාර්ටන්, බී., සිංකුමාර්වොන්ග්, ඒ., නිහ්මාත්, එම්. සහ ජයසිංහ, එස්. (2017), "කුසගින්න තුරන් කිරීම උදෙසා ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳ ජාතික ක්‍රමෝපායික සමාලෝචනය", ලෝක ආහාර වැඩසටහන, කොළඹ

- හිරිමුතුගොඩගේ, ඩී. (2017), "ශ්‍රී ලංකාවේ හරිත සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේදී බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වල කාර්යභාරය", උදෘත, සබරගමුව විශ්වවිද්‍යාලයේ 6 වැනි අන්තර්ජාතික සමුළුව, සබරගමුව විශ්වවිද්‍යාලය.

- මදුරාවල, එස්., හිරිමුතුගොඩගේ, ඩී., ප්‍රේමරත්න, ඩී., සහ විජයසිරි, ජේ. (2017), කුළුබඩු සහ කොහු කර්මාන්ත අංශවල කාන්තාවන්ට හිමි සහ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, කාර්ය පත්‍රිකා ප්‍රකාශන මාලා අංක 28, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

සන්නිවේදන / ප්‍රචාරණය

අතුල සේනාරත්න මහතා සහ කානචනා වික්‍රමසිංහ මහත්මිය 2018 වර්ෂය සඳහා වන රජයේ අජයේ අයවැය යෝජනා පිළිබඳව තම අදහස් ප්‍රකාශ කළහ. අතුල මහතා අයවැය යෝජනා වල හරිත ආර්ථික අංග කෙරෙහි අවධානය යොමුකළ අතර කාංචනා මහත්මිය දේශගුණික ප්‍රතිවර්තනය වැඩි දියුණු කිරීම සම්බන්ධ යෝජනා පිළිබඳ සාකච්ඡා කළේය. තවද කාංචනා මහත්මිය 2017 නොවැම්බර් මාසයේදී දේශගුණික ප්‍රතිවර්තනය පිළිබඳ භව්‍ය ගම්‍යමාන සාරාංශ කරමින් බ්ලොග් ලිපියක් ද පළ කළාය. එමෙන්ම කාංචනා මහත්මිය 2017 දෙසැම්බර් 01 වැනි දින ඔඩ1 (කලින් එඔසී චදරවී) නාලිකාව ඔස්සේ විකාශය කරන ලද ඊසීඑ වැඩසටහනෙහි සෑඩසැඅ 360 රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවේදී ඇයගේ අදහස් ප්‍රකාශ කළාය. තවද, දෙසැම්බර් 14 වැනි දින ශ්‍රී ලංකා පාරිසරික වෘත්තීයවේදීන්ගේ ආයතනය විසින් සංවිධානයය කරන ලද විශේෂඥ මණ්ඩල සාකච්ඡාවේදී කාංචනා මහත්මිය අයවැය යෝජනා වල පාරිසරික දෘෂ්ටි කෝණයන් අවධාරණය කළාය. මෙම වර්ෂය තුළ වැදගත් අන්තර්ජාතික දින සැමරුම් වෙනුවෙන් පළකරන ලද බ්ලොග් ලිපි කිහිපයක් මගින් තිරසර සංවර්ධනය සම්බන්ධ වැදගත් අංග අවධාරණය කරන ලදී. තවද, අතුල සේනාරත්න මහතා ලෝක සාගර දිනය සහ ලෝක ජල දිනය වෙනුවෙන් පළ කරන ලද ඔහුගේ බ්ලොග් ලිපි මගින් පිළිවෙලින් නීල ආර්ථිකයකට අදාළව ශ්‍රී ලංකාවේ අනාගතය සහ අප ජල කළමනාකරණයට අදාළ ගැටළු අවධාරණය කළේය. එමෙන්ම ඊසීඑ සෑඩසැඅ 360 (එඔඩ හැඉීඑ) නැමති රූපවාහිනී වැඩසටහනෙහිදී පැවති රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවේ දී අතුල සේනාරත්න මහතා නීල ආර්ථික ප්‍රවේශය මගින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලැබිය හැක්කේ කෙසේද යන්න පිළිබඳව ද ද සාකච්ඡා කළේය. තවද ලෝක පරිසර දිනය සහ ලෝක සංචාර සංචාරක දිනය සැමරීම සඳහා කාංචනා වික්‍රමසිංහ මහත්මිය විසින් ලියන ලද ලිපි තුළින් ඇය ශ්‍රී ලංකාවේ පාරිසරික සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සහ තිරසර සංචාරක ව්‍යාපාරය මෑත බැලීම සම්බන්ධ කරුණු අවධාරණය කළාය. එපමණක් නොව, දේශගුණික විපර්යාස වල බලපෑම, දේශගුණික තොරතුරු අඩුපාඩු සම්පූර්ණ කිරීම, කෘෂිකාර්මික අගය දාම, කුසගින්න තුරන් කිරීම, ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සහ වෙනත් පාරිසරික ප්‍රතිපත්ති වැනි අදාළ මාතෘකා පිළිබඳව දේශීය මෙන්ම අන්තර්ජාතික වේදිකාවලදී ද ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

එයට අමතරව, 2017 අගෝස්තු මාසයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ලෝක බැංකුව සමග එක්ව සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ ආර්ථික කළමණාකරණයෙහි පාරිසරික ප්‍රතිලාභ" යන මාතෘකාව යටතේ පළ කරන ලද ඔඅසඑඑර සාකච්ඡාව සඳහා කාංචන වික්‍රමසිංහ මහත්මිය සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහ සහභාගී වූවාය. ඒ මහත්මිය දේශගුණික අනුවර්තනය වීම්, ආපදා අවදානම අඩු කිරීම සහ තිරසර සංචාරක ව්‍යාපාරයට අදාළ ගැටළු සම්බන්ධ ප්‍රතිපත්ති පිළිබඳව සාකච්ඡා කළාය. "ශ්‍රී ලංකාව සඳහා හරිත ගිණුම්කරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම: පාඩම් හුවමාරු කර ගනිමින් අනාගත සංවර්ධනය" නමැති මාතෘකාව යටතේ අගෝස්තු 18 වැනි දින පැවති ජාතික වැඩමුළුව සඳහා අතුල සේනාරත්න මහතා සහ කාංචනා වික්‍රමසිංහ මහත්මිය සම්පත් පුද්ගලයින් ලෙස සහභාගී වූහ.

දරිද්‍රතාවය සහ
අවදානම් සහගත බව

දරිද්‍රතාවය සහ අවදානම්සහගත භාවය

ශ්‍රී ලංකාව පසුගිය දශකය පුරා දිළිඳුකම අඩු කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාව දරිද්‍රතා මට්ටම අඩකින් අඩු කිරීම, විශ්ව ප්‍රාථමික අධ්‍යාපන මට්ටම සාක්ෂාත් කර ගැනීම සහ අධ්‍යාපනයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම වැනි සහස්‍ර සංවර්ධන ඉලක්ක ගණනාවක් ද සාක්ෂාත් කරගෙන තිබේ. එසේ වුවද, අසමානාත්මතාවය සහ අවදානම්සහගත භාවය ශ්‍රී ලංකාවේ දැඩි අවධානය යොමු විය යුතු ගැටළු ලෙස තවදුරටත් පවතියි. 2012/2013 වර්ෂවලදී 0.48 ක් ව පැවති ගෘහස්ථ ආදායමෙහි ගිනි සංගුණකය 2016 දී 0.45 ක් දක්වා එම අවුරුදු කිහිපය තුළදී ඉතා සුළු වශයෙන් අඩුවීමක් පෙන්නුම් කළ ද පසුගිය දශක දෙක පුරා එය ඉතා ඉහළම මට්ටමක පැවතුණි. එයට අමතරව, අධ්‍යාපනය, සෞඛ්‍යය, ජලය සහ සනීපාරක්ෂාව, සහ මූල්‍ය සේවා වැනි මූලික සේවා සහ යටිතල පහසුකම් වෙත ප්‍රවේශ වීමට අදාළව දැඩි විෂමතාවයන් පවතින අතර එය රටෙහි පවතින ආදායම් විෂමතාවය ඉහළ මට්ටමට පැවතීමට ද දායක වන කරුණක් විය හැක. මෙවන් සන්දර්භයක් තුළ දරිද්‍රතාවය සහ අවදානම් සහගත භාවය පිළිබඳ ප්‍රරතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරනු ලබන පර්යේෂණය මගින් තිරසර සංවර්ධන ඉලක්ක, දරිද්‍රතාවය සහ අසමානාත්මතාවය, සමාජ ආරක්ෂණය සහ මූල්‍ය අන්තර්කරණය, සහ වයස්ගත වීම ද ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි අවධානය යොමු කර ඇත.

පර්යේෂණාවල අවධානය

තිරසර සංවර්ධන ඉලක්ක

ශ්‍රී ලංකාව 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර කර ගැනීම සඳහා කැපවී කටයුතු කරන රටවල් ගණනාව අතරින් එකකි. තිරසර සංවර්ධන ඉලක්ක වලට ඉලක්ක 17 ක් ද, සෞඛ්‍ය සම්පන්න ජීවිත සහතික කිරීම සඳහා දිළිඳුකම සහ කුසගින්න තුරන් කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සාක්ෂාත් කරගැනීම, පරිසරය සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීම ඇතුළු විශාල පරාසයක විහිදුණු අරමුණු 169 ක් ද ඇතුළත් වේ. තිරසර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා ශ්‍රී ලංකා රජය ක්‍රියාමාර්ග ගණනාවක් ම ගෙන ඇත (උදා: තිරසර සංවර්ධන පනත ස්ථාපිත කිරීම, තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර කරගැනීම ඉලක්ක කර ගත් අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීම වැනි). එසේ වුවත් එය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාව අභියෝග ගණනාවකට මුහුණ දී සිටියි.

මූල්‍ය අන්තර්කරණය

ගුණාත්මක මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම දිළිඳුකම, අවදානම්සහගත භාවය සහ අසමානාත්මතාවය අඩු කිරීම සඳහා සහ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වලට සහාය වීම සඳහා අවශ්‍ය ඉතා වැදගත් ක්‍රියාමාර්ගයක් වේ. රටෙහි වැඩිහිටි ජන ජනගහනයෙන් 83 % ක් පමණ දෙනාට

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ගංගා තිලකරත්න මහත්මිය තිරසර සංවර්ධන ඉලක්ක දේශීයකරණය කිරීම් සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග අවධාරණය කරයි, නොවැම්බර් 01-02, කත්මණ්ඩු, නේපාලය.

මූල්‍ය ආයතනවල බැංකුව ගිණුම් තිබෙන නමුත් (එය දකුණු ආසියාවේ සාමාන්‍ය අගය වන 46% ට වඩා ඉතා ඉහළ අගයකි) ශ්‍රී ලංකාව තුළ ඉහළ මූල්‍ය අන්තර්කරණයක් අත් කර ගැනීම සඳහා ආමන්ත්‍රණය කළ යුතු ගැටලු ගණනාවක් තිබේ. මූල්‍ය සේවාවල, විශේෂයෙන්ම අඩු ආදායම් ලබන කණ්ඩායම් සඳහා තිබෙන මූල්‍ය සේවා වල තිබෙන අඩු ගුණාත්මකභාවය සහ ඉහළ පිරිවැය, රක්ෂණය, ප්‍රේෂණ සහ ඩිජිටල් මූල්‍ය සේවා වැනි මූල්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය සහ ඒවා පරිහරණය අඩු වීම, සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ණය පහසුකම් සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොතිබීම එවැනි ගැටළුවලට අයත් වේ.

සමාජ ආරක්ෂණය

සමාජ ආරක්ෂණ වැඩසටහන් විශාල සංඛ්‍යාවක් තිබුණ ද, දැනට පවතින සමාජය ආරක්ෂණ ක්‍රමවේදවල අඩු ආවරණය, දුර්වල ඉලක්කගත කිරීම, සහ එම ක්‍රමවේද කොටස් වලට වෙන් වී තිබීමේ ස්වභාවය සහ වැඩසටහන් අතර සම්බන්ධීකරණයක් නොතිබීම වැනි විවිධ අඩු පාඩු සහ දුර්වලකම් තිබේ. මෙම ගැටලු මගින් සහ ජනගහනයෙහි මධ්‍යන්‍ය වයස ඉහළ යමින් පැවතීම, නොවිධිමත් ක්ෂේත්‍රය ඉතා විශාල වීම සහ ශ්‍රම බලකාය සඳහා අඩු කාන්තා සහ සහභාගීත්වය වැනි ඉස්මතු වෙමින් පවතින ජනවිකාශ සහ ශ්‍රම වෙළෙඳ පොළ අභියෝග මගින් ශ්‍රී ලංකාවේ දැනට පවතින සමාජ ආරක්ෂණ ක්‍රමවේදවල ක්ෂේත්‍ර ගණනාවක ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.

දරිද්‍රතාවයට සහ අසමානාත්මතාවයට ආමන්ත්‍රණය කිරීම

ශ්‍රී ලංකාව දරිද්‍රතාවය අඩු කිරීම සම්බන්ධයෙන් ජයග්‍රහණ ලබා ගෙන තිබුණ ද, පසුගිය දශක දෙක පුරාවට ගෘහස්ථ ආදායමෙහි ගිනි සංගුණකය 0.45 - 0.49 තරම් වූ පරාසයක ඉහළ අගයක් ව පැවතුණි. දිළිඳුතම පංචමකයෙහි ගෘහස්ථ ආදායමෙහි කොටස 4% - 5% අතර අගයක ද, ඉහළම පංචමකයෙහි ගෘහස්ථ ආදායම 50% පනහකට අධික මට්ටමක

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ගංගා තිලකරත්න මහත්මිය පෙබරවාරි 27 වැනි දින ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති "දකුණු ආසියාවේ වයස්ගත වූවන්ගේ ආදායම් සුරක්ෂිතභාවය සහ විශ්ව මූලික ආදායම" නැමැති මෙම තේමාව යටතේ පවත්වන ලද සම්මන්ත්‍රණයේදී "ශ්‍රී ලංකාවේ වයස්ගත පුද්ගලයන්ගේ ආදායම් සුරක්ෂිතභාවය" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළා ය

ද පැවැතුණු අතර එමගින් රටෙහි අසමානාත්මතාවයෙහි සැලකිය යුතු තරම් ඉහළ මට්ටම් පවතින බව පෙන්නුම් කරයි. අසමානාත්මතාවය යනු අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ආරක්ෂිත පානීය ජලය වැනි සේවා සඳහා ඇති ප්‍රවේශයෙහි අසමානාත්මතාවය, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී කණ්ඩායම්, ජනවර්ග සහ කුල අතර ඇති අසමානාත්මතාවය වැනි අසමානාත්මතාවයෙහි ව්‍යූහමය ස්වරූපයන් ද ඇතුළත් වන, ආදායම් විෂමතාවෙන් ඔබ්බට ගිය බහුමානයන් සහිත සංකල්පයක් වේ.

පර්යේෂණ අධ්‍යයන

ගංගා තිලකරත්න මහත්මියගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් විසින් ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමෙහි ගමාමානයන් විමසා බැලීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලද අතර එමගින් "තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමෙහි ජාතික මට්ටමේ ගමාමානයන්: ශ්‍රී ලංකාවෙහි තත්වය" නැමැති ප්‍රකාශනය එළිදක්වන ලදී. මෙම පර්යේෂණය මගින් තිරසර සංවර්ධන ඉලක්ක ජාතික සැලසුම්කරණ ක්‍රියාවලියට සංකලනය කිරීම හා එහි ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම පිළිබඳව සහ මූල්‍යකරණය, අධීක්ෂණය, දත්ත සහ වුල්කාරීත්වයන් යන ක්ෂේත්‍රවල ක්‍රියාත්මක කිරීමේ අභියෝග පිළිබඳව ද විමසා බලන ලදී. මෙම අධ්‍යයනය සඳහා බංග්ලාදේශයේ ධකා නුවර "පශ්චාත් සහස්‍ර සංවර්ධන ඉලක්ක පිළිබඳව වන සදර්න් වොයිස් ලේකම් කාර්යාලය: අන්තර්ජාතික සංවර්ධන ඉලක්ක" නැමති වැඩසටහන මගින් අරමුදල් සපයන ලදී.

ආර්ථිකයෙහි තත්වය 2017 වාර්තාව සඳහා ශ්‍රී ලංකාවෙහි තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම නැමැති මාතෘකාව යටතේ පරිච්ඡේදයක් සකස් කරන ලද අතර, එමගින් තිරසර සංවර්ධන ඉලක්කවල ජාතික අදාළත්වය, තිරසර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා රජය විසින් ගෙන ඇති ප්‍රධාන ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ අභියෝග විමසා බලන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය අන්‍යෝන්‍ය ක්ෂුද්‍ර රක්ෂණ සම්බන්ධ ඉල්ලුම, සැපයුම සහ නියාමන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සහ එම අංශයෙහි දියුණුව සහ වර්ධනය කෙරෙහි බලපාන ගැටළු සහ අවහිරතා හඳුනා ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය, සමුපකාර ක්ෂුද්‍ර රක්ෂණවල වර්තමාන සන්දර්භය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සපයා දීම සඳහා අන්‍යෝන්‍ය රක්ෂණ පිළිබඳ අනාවරණ පර්යේෂණයක් සිදුකරන ලදී. එක්සත් රාජධානියේ අන්තර්ජාතික සමුපකාර සහ අන්‍යෝන්‍ය රක්ෂණ සංධානය සඳහා මෙම අධ්‍යනය සිදු කරන ලදී. ගංගා තිලකරත්න හ චින්තනී සූරියමුදලි යන මහත්මීන් විසින් ශ්‍රී ලංකාවේ ආහාර ආශ්‍රිත සමාජ සහනාධාර වැඩසටහන්: මුදල් සංක්‍රාම දක්වා පරිණාමය වීම සහ පරිවර්තනය වීම නමැති මාතෘකාව යටතේ ප්‍රකාශනයක් සම්පාදනය කරන ලද අතර, එමගින් 1940 දශකයේ සිට මෙරට පැවති ආහාර සලාක ක්‍රමය, ආහාර සහනාධාර ක්‍රමය, සහ ආහාර මුද්දර ක්‍රමය වැනි විවිධ ආහාර ආශ්‍රිත සහනාධාර වැඩසටහන්වල පරිණාමය පිළිබඳව සහ පසුගිය වර්ෂ කිහිපය තුළදී අහාර ආශ්‍රිත සහනාධාර වැඩසටහන් වල සිට මුදල් සංක්‍රාම දක්වා පරිවර්තනය වීම සම්බන්ධ පරිපූර්ණ විශ්ලේෂණයක් සපයා දෙයි. එමෙන්ම එමගින් පසුගිය දශක කිහිපය පුරා මෙවැනි වෙනස් වීම් සිදුවීම කෙරෙහි බලපෑ සාධක සහ ඒවායෙහි ගමාමානක් ද විමසා බලයි. මෙම අධ්‍යයනය ලෝක බැංකු අරමුදල් සැපයීම යටතේ රටවල සිද්ධි අධ්‍යයන වශයෙන් ඊජිප්තුව, ඉන්දියාව, ඉන්දුනීසියාව, මෙක්සිකෝව, ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල් ඇතුළත්වූ විවිධ රටවල් සම්බන්ධ ව්‍යාපෘතියක කොටසක් ලෙස සිදු කරන ලදී.

ගංගා තිලකරත්න මහත්මිය අසමානාත්මතාවය අවම සඳහා තිබෙන බරපතල ගැටළු සහ ප්‍රතිපත්ති විකල්ප විමසා බැලෙන අධ්‍යයන පත්‍රිකාවක් සකස් කළාය. ශ්‍රී ලංකාවෙහි සේවා වෙත ප්‍රවේශ වීමේ දී තිබෙන අසමානාත්මතාවයෙහි අඩුවීමක් දක්නට ලැබුණ ද ආදායම් විෂමතාවය ඉහළ යමින් පැවතීම, සේවාවල ගුණාත්මක භාවයෙහි තිබෙන අසමානත්වය, විශේෂයෙන්ම ශ්‍රම වෙළඳපොළෙහි තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානාත්මතාවය දැඩි ලෙස අවධානය යොමු විය යුතු ගැටළු බවට මෙම පත්‍රිකාව මගින් අවධාරණය කරයි. අසමානාත්මතාවය අවම කිරීම සඳහා වන ප්‍රධාන ප්‍රතිපත්ති විකල්ප පහක් මෙම පත්‍රිකාව මගින් අවධාරණය කර ඇත: ඵලදායී රැකියා අවස්ථා නිර්මාණය කිරීම, සමාජ ආරක්ෂණය ශක්තිමත් කිරීම, මානව ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කිරීම, රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව සංවේදී ශ්‍රම වෙළඳපොළ ප්‍රතිපත්ති එම විකල්ප වේ.

අමල් නානායක්කාර මහතා සහ යොලන්තිකා ඇල්ලේපොළ මහත්මිය ශ්‍රී ලංකාවේ ළමා දරිද්‍රතාවය සහ ඔවුන්ගේ අධ්‍යාපනය සහ පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සඳහා ඇති ප්‍රවේශය සම්බන්ධ ගැටලු යන මාතෘකාව යටතේ අධ්‍යයනයක්

සිදු කළහ. මෙම අධ්‍යනය මගින් ගෘහස්ථ ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/2013 මගින් ලබා ගත් දත්ත පදනම් කර ගෙන ශ්‍රී ලංකාවේ විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටින, දිළිඳු සහ අවදානම් සහගත තත්වයන් යටතේ සිටින ළමයින් පිළිබඳව සහ එම ළමයින්ගේ අධ්‍යාපනය සහ පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සඳහා එම ළමයින්ට ඇති ප්‍රවේශය සම්බන්ධ ගැටළු පිළිබඳව විමසා බැලෙයි. තවද විධිමත් පාසල් අධ්‍යාපනයෙන් ඉවත් වන, විශේෂයෙන් ම අනිවාර්ය අධ්‍යාපන වයසෙන් පසුව පාසල් අධ්‍යාපනයෙන් ඉවත් වන දිළිඳු සහ අවදානම් සහගත තත්වයන්ට මුහුණ දී ඇති ළමයින් සිටින ස්ථාන සහ ඔවුන්ගේ සමාජ ආර්ථික කණ්ඩායම් මෙන්ම එවැනි තත්ත්වයන් ඇතිවීමට බලපා ඇති හේතු ද මෙම අධ්‍යනය මගින් හඳුනා ගැනෙන අතර, එම ගැටළුවලට ආමන්ත්‍රණය කිරීම සඳහා වන නිර්දේශ ද එමගින් සපයා දෙයි.

එමෙන්ම, ආර්ථිකයෙහි තත්වය 2017 වාර්තාව සඳහා ශ්‍රී ලංකාවෙහි ළමා දරිද්‍රතාවය පිළිබඳ ප්‍රතිපත්ති සංක්ෂේපයක් ද සකස් කරන ලදී (විමල් නානායක්කාර). දිළිඳු සහ වඩාත්ම අවදානම් සහගත තත්වයන්ට මුහුණදී ඇති ළමයින් සිටින පසුගාමී ප්‍රදේශ සහ ඔවුන් අයත් වන සමාජ ආර්ථික කණ්ඩායම් හඳුනා ගැනීම එහි ඉලක්කය විය. මෙම විශ්ලේෂණය මගින් ආදායම් දරිද්‍රතාවයට සහ බහුමාන දරිද්‍රතාවය යන දෙකටම අයත් ළමයින් ආවරණය කෙරෙයි.

ප්‍රතිපත්ති නියැළීම්

- තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියෙහි විවිධ පාර්ශ්වයන්ගේ වගකීම්වල කාර්යභාරය පිළිබඳව තිරසාර සංවර්ධනය හා වනජීවී අමාත්‍යාංශය සඳහා ලිපියක් සකස් කර (2017 අගෝස්තු 29 වන දින පවත්වන ලද පාර්ශ්වකරුවන්ගේ උපදේශනය පදනම් කර ගනිමින්) තිරසාර සංවර්ධනය හා වනජීවී අමාත්‍යාංශයෙහි තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ උපදේශක කමිටුවට එම වාර්තාව ඉදිරිපත් කරන ලදී (ඔක්තෝබර් 2017).

- සමාජ ආරක්ෂණය පිළිබඳ කොටස සඳහා දායකත්වය සපයා දීම මගින් ශ්‍රී ලංකාව 2025 දැක්ම ලියවිල්ල සකස් කිරීම සඳහා දායකත්වය ලබා දෙන ලදී.

ප්‍රකාශන

- තිලකරත්න, ජී., නානායක්කාර, ඩබ්ලිව්., මදුරාවල, එස්., ජයරත්න, එස්. සහ වික්‍රමසිංහ, කේ. (2017) "තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ජාතික මට්ටමේ ගම්‍යමානයන්: ශ්‍රී ලංකාවෙහි තත්ත්වය", සදර්න් වොයිස් ප්‍රායෝගික පත්‍රිකා අංක 41, සදර්න් වොයිස් ලේකම් කාර්යාලය, බංග්ලාදේශය, (යළුළුවඃ //ාදමළුයැරබඩදසජැ.දරට/අව-ජදබළුබළු/මචකඳී/2017/03ීඑ-ධජ-41.චාඅ)

- කැලේගම, එස්. සහ තිලකරත්න, ජී., 'ශ්‍රී ලංකාවී රට පිළිබඳ පරිච්ඡේදය (8 වැනි පරිච්ඡේදය), යොෂිනෝ, එන්. සහ මෝගන්, පී.ජේ. (සංස්කාරකවරුන්), "මූල්‍ය අන්තර්කරණය, නියාමනය සහ අධ්‍යාපනය: ආසියානු දෘෂ්ටි කෝණය", ආසියානු සංවර්ධන බැංකු ආයතනය, ජපානය, (යළුළුවඃ//අඅ්ඉ.දරට/සළුී/ැමේකළු/සෙකී/චමඉකසජ්ළුසදබ/350186/ාඉස-සෙබ්බජස්ක-සබජකම්සදබරුටමක්ළුසදබ-ැමජ්ළුසදබ-ීස්බ-චැරිචැජළුසඩී.චාඅ)

- තිලකරත්න, ජී. සහ සූරියමුදලි, සී. (2017) 'ශ්‍රී ලංකාවේ ආහාර ආශ්‍රිත සමාජ සහනාධාර වැඩසටහන්: මුදල් සංක්‍රාම වෙත පරිණාමනය සහ පරිවර්තනය වීම් (4 වැනි පරිච්ඡේදය), ඇල්ඩර්මන්, එච්., ජෙන්තිලිනි, යූ., සහ යෙම්ට්සොෆ්, ආර්. (2018) 'බිලියන 1.5 ක ජනතාවගේ ප්‍රශ්නයක්: ආහාර ද, වවුචර් ද නැතහොත් මුදල් සංක්‍රාම ද?' වොෂින්ටන් ඩී.සී., ලෝක බැංකුව.

- දේව් නාදන් සහ අකිලේෂ් කේ. ෂර්මා විසින් සංස්කරණය ලද 'දකුණු ආසියාවේ සේවා නියුක්තිය, සමාජ ආරක්ෂණය සහ අන්තර්කණය වූ වර්ධනයී නැමති ග්‍රන්ථයෙහි 'ශ්‍රම බලකායෙහි සහභාගීත්වය හා සේවා නියුක්ති තත්ත්වය කෙරෙහි සමාජ ආරක්ෂණයෙහි ඇති බලපෑම: ශ්‍රී ලංකාවෙන් ලැබෙන සාක්ෂී නැමති පරිච්ඡේදය. සවුත් ඒසියා මුද්‍රණාලය (ඉදිරියේ ප්‍රකාශයට පත් කිරීමට නියමිත ප්‍රකාශනය).

- මුස්ටාෆිසර් රහ්මන් සහ ෆාමිඩා බතුන් විසින් සංස්කරණය කරන ලද '2030 දී දකුණු ආසියාවෙහි ප්‍රතිරූපය යළි ගොඩනැගීම් නැමති ග්‍රන්ථයෙහි තිලකරත්න, ජී. විසින් ලියන ලද (2017) 'දකුණු ආසියාව තුළ අසමානාත්මතාවය අඩු කිරීම සම්බන්ධ බරපතල ගැටළු සහ ප්‍රතිපත්ති විකල්ප: ශ්‍රී ලංකාවේ දෘෂ්ටි කෝණයකින්', ප්‍රතිපත්ති සංවාද සඳහා වන මධ්‍යස්ථානය, නොවැම්බර් 2017 (පිටු. 102-106)

සන්නිවේදනය /ප්‍රචාරණය

2017 වර්ෂයේ තුළදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් බ්ලොග් අඩවි සහ පුවත්පත් ලිපි හරහා ව්‍යාප්තියට අදාළ ඔවුන්ගේ පර්යේෂණ පිළිබඳ ප්‍රචාරණය කළහ. විමල් නානායක්කාර මහතා 'විවිධ දරිද්‍රතා රේඛා පදනමෙන් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයෙහි තත්වයී, 'මානව සංවර්ධනය: ශ්‍රී ලංකාවේ ජයග්‍රහණ සහ අභියෝගී, 'තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම් සහ 'දරිද්‍රතාවය සහ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය: ශ්‍රී ලංකාවේ තරුණ පරම්පරාවට බලපාන කල් ගතවූ ප්‍රශ්නයකී වැනි මාතෘකා යටතේ බ්ලොග් ලිපි ලියන ලද අතර, චින්තනී සූරියමුදලි මහත්මිය 2017 ඔක්තෝබර් 17 වැනි දින දරිද්‍රතාවය තුරන් කිරීමේ දිනය වෙනුවෙන් 'සමාජ සංවර්ධනය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක - ශ්‍රී ලංකාව ලබා ඇති ලකුණු ප්‍රමාණය කුමක්ද? යන මා මාතෘකාව යටතේ බ්ලොග් ලිපියක් ලියුවාය. එමෙන්ම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් දේශීය මෙන්ම විදේශීය වේදිකාවලදී ද වැඩිහිටි පුද්ගලයන්ගේ ආදායම් සුරක්ෂිතතාවය, මූල්‍ය අන්තර්කරණය, තිරසර සංවර්ධන ඉලක්ක සහ සමාජ ආරක්ෂණය වැනි ක්ෂේත්‍ර පිළිබඳව ඉදිරිපත් කිරීම් සිදු කළහ.

සංක්‍රමණය සහ
නාගරිකකරණය

සංක්‍රමණය සහ නාගරිකකරණය

සංක්‍රමණය සහ නාගරික කරණයට අදාළව ශ්‍රී ලංකාව ලබන අත්දැකීම් සීඝ්‍ර පරිවර්තනයන්ට භාජනය වෙමින් පවතී. සංක්‍රමණිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල් වල සුබසාධනය සහ ශ්‍රී ලංකාවට අන්තර්ජාතික ප්‍රේෂණ ලබා ගැනීම පිළිබඳව සහ විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් නියාමනය කිරීම පිළිබඳව අවම ප්‍රතියමාන සහිතව සංක්‍රමණික සේවකයින්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය - කුසලතා - ගමනාන්ත සංයුතිය වෙනස් කිරීම සංක්‍රමණයට අදාළ මෑත කාලීන ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් වී තිබේ. කෙසේ වෙතත්, නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ද ශ්‍රම සැපයුමෙහි තිබෙන හිඟය ඉහළ යමින් පැවතීම ශ්‍රී ලංකාවේ ශ්‍රම සැපයුම් සම්බන්ධයෙන් වර්ධනය වෙමින් පවතින අභියෝගයක් වී තිබේ. ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශ වෙත සිදුවන සංක්‍රමණය හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල ශ්‍රම හිඟයට හේතු වී තිබෙන අතර, නාගරික ප්‍රදේශවල සිට අන්තර්ජාතිකව සිදු වන සංක්‍රමණය නාගරික ප්‍රදේශවල ශ්‍රම ඌණතාවයට හේතු වී තිබේ. නාගරිකකරණය සිදුවන වේගය සීඝ්‍රයෙන් වැඩිවීම නිසා නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල තිබෙන ගැටළු තව තවත් උග්‍ර වී තිබේ

පර්යේෂණාවල අවධානය

ප්‍රතිපත්තිය අධ්‍යාපන ආයතනය විසින් 2017 වර්ෂයේ දී සංක්‍රමණය සහ නාගරිකකරණය යන තේමාව යටතේ සිදුකරන ලද පර්යේෂණ මගින් ප්‍රධාන වශයෙන්ම සංක්‍රමණ පාලනය, විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සහ නාගරිකකරණය යන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරන ලද සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම සැලසුම් සහගතව අනුගත කර ගැනීමත් සමගම සංක්‍රමණයේදී අන්තර්ජාතික සහයෝගීතාවය සහ පාලනය පිළිබඳ ප්‍රතිපත්තිමය සැලකිල්ල දේශීය මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද ප්‍රමුඛත්වය ලබා දෙන කරුණක් බවට පත්වී තිබේ. සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම මගින් අන්තර්ජාතික සංක්‍රමණයෙහි සියලුම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කරමින් සංක්‍රමණය සහ මානව සංචලනය පිළිබඳ පරිපූර්ණ අන්තර්ජාතික සහයෝගීත්වය සඳහා වන රාමුවක් ඉදිරිපත් කිරීම ඉලක්ක කර ඇත.

පර්යේෂණ අධ්‍යයන

2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාව සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම පිළිබඳ කලාපීය උපදේශක ක්‍රියාවලියට වාර්තා කිරීම සඳහා එහි ස්ථාවරය සකස් කරන ලද අතර, විදේශ රැකියා අමාත්‍යාංශය සහ සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානය වෙනුවෙන් ජාතික උපදේශක ක්‍රියාවලිය පිළිබඳව වන මෙම වාර්තාව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂක බිලේෂා වීරරත්න මහත්මිය විසින් සකස් කරන ලදී. මෙහිදී ඒ මහත්මිය රටෙහි ස්ථාවරය සකස් කිරීම පිළිබඳව

ප්‍රතිපත්ති අධ්‍යයපන ආයතනයෙහි පර්යේෂණ සාමාජික බිලේෂා වීරරත්න මහත්මිය අගෝස්තු 25 වැනි දින පැවති සුරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණය පිළබඳ ගෝලීය ගිවිසුම් පිළිබඳව ජාතික බහු පාර්ශවකාර උපදේශක සමුළුවෙහිදී ඉදිරිපත් කිරීමක් සිදු කළාය.

පාර්ශවකරුවන්ගේ යෙදවුම් එක්රැස් කර ගැනීම සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන් සමග ද වෙන වෙන ම සංවේදීකරණ රැස්වීම් පවත්වා සංක්‍රමණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සංක්‍රමණය පිළිබඳ අනෙකුත් පාර්ශවකරුවන් සඳහා ජාතික අදහස් විමසීමෙහි ප්‍රතිඵල පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරන ලදී. "ශ්‍රී ලංකාව - සුරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම, ජාතික අදහස් විමසීමෙහි ප්‍රතිඵල වාර්තාව" නමැති මාතෘකාව යටතේ සකස් කරන ලද අවසන් වාර්තාව විදේශ රැකියා අමාත්‍යාංශය සහ සංක්‍රමණය පීළිබඳ අන්තර්ජාතික සංවිධානය හරහා සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම පිළිබඳ ආසියා පැසිෆික් කලාපීය ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කරන ලදී.

උප නියෝජිතයින් වශයෙන් පොදුවේ හඳුන්වනු ලබන බඳවා ගැනීමේ අතරමැදියන් නියාමනය කිරීම පිළිබඳව ජාතික මට්ටමෙහි ප්‍රතිපත්ති අවධානය වැඩි වැඩියෙන් යොමු වී තිබෙන අතර, විදේශ රැකියා සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ මෙම අවිධිමත් පාර්ශ්වකරුවන් සතුව තිබෙන අවම අවබෝධය පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් අවධාරණය කළහ. ශ්‍රී ලංකාවෙහි උප නියෝජිතයින් නියාමනය කිරීම පිළිබඳව සාක්ෂි පදනම් කර ගත් ප්‍රතිපත්ති සැලසුම්කරණය සඳහා පහසුකම් සැලසීම පිණිස විදේශ රැකියා අමාත්‍යාංශයේ සහතික කිරීම සහිතව "තාවකාලික සංක්‍රමණික සේවකයින් බඳවා ගැනීම සහ ශ්‍රී ලංකාවේ උප නියෝජිතයින්ගේ වර්ධනය වෙමින් පවතින කාර්යභාරය" නැමති මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කිරීම සඳහා බිලේෂා වීරරත්න මහත්මිය විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එම අධ්‍යයනය සඳහා අබුඩාබි හි නිව්යෝර්ක් සරසවියේ සහ නිව්යෝර්ක් හි පිහිටි කොලොම්බියා සරසවියේ 'ශ්‍රම සංක්‍රමණය පිළිබඳ පර්යේෂණ සහ ආනුභවික විශ්ලේෂණ වැඩසටහනෙහී අරමුදල් සැපයීම

ලැබුණි. මෙම පර්යේෂණය මගින් මූලිකව සොයා ගන්නා ලද කරුණු සංක්‍රමණය සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ සංක්‍රමණ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ගෙන් සමන්විත වන, විදේශ රැකියා අමාත්‍යාංශයේ වැඩසටහන් ක්‍රියාකාරී කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

උප නියෝජිතයින් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සතු ධාරිතාවය සහ පළපුරුද්ද සාර්ථකව තහවුරු කිරීමට එකී අධ්‍යයනයට හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස බිලේෂා මහත්මියට උප නියෝජිතයින් පිළිබඳව දෙවැනි අධ්‍යනයක් සිදු කිරීමට අවස්ථාව උදා විය. "ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කර්මාන්තයේ බඳවා ගැනීමේ අතරමැදියන් පිළිබඳ පරිපූර්ණ වාර්තාවක්" නම් වූ මෙම අධ්‍යයනය විදේශ රැකියා අමාත්‍යාංශය වෙනුවෙන් සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානය විසින් පවරන ලදී.

ශ්‍රී ලංකාවේ සංක්‍රමණ ක්‍රියාවලියෙහි සිටින බඳවා ගැනීමේ අතරමැදියන් නියාමනය කිරීම සඳහා සාක්ෂි පදනම් කරගත් නිර්දේශ සපයා දීම මෙම අධ්‍යයනයෙහි අරමුණු වේ. එමෙන්ම, ඒ මහත්මිය පුහුණු ශ්‍රමිකයින් රඳවා ගැනීම සහ යළි සංකලනය කිරීම සඳහා, දේශීයව නිර්මාණය කළ ගෝලීය නිපුණතාවයන් ආරක්ෂණණය කර ගැනීම සඳහා සහ ගෝලීය නිපුණතා සහිත ණ්ඩායමකින් ප්‍රතිලාභ ලැබීම සඳහා ශ්‍රී ලංකාව සතු හැකියාව පිළිබඳව අවධානය යොමු කරන අධ්‍යයනයක් සිදු කළාය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම වාර්තාව වන ආර්ථිකයෙහි තත්වය 2017 වාර්තාවට "වර්ධනය සහ තරගකාරිත්වය සඳහා නිපුණතාවයන් රඳවා ගැනීම, යළි සංකලනය කිරීම සහ ආකර්ෂණය කිරීම" යන මාතෘකාව යටතේ පරිච්ඡේදයක් අන්තර්ගත කරන ලදී.

නවතම ප්‍රවණතාවයන් අන්තර්ගත කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "සක්‍රමණය පිළිබඳ විශාල දත්ත සමූහ විශ්ලේෂණය කිරීම - මව්වරුන්ගේ සංක්‍රමණය වීම මගින් ශ්‍රී ලංකාවෙහි හැර දමා යන ඔවුන්ගේ දරුවන්ගේ සුබසාධනය කෙරෙහි ඇති වන බලපෑම" සහ "ශ්‍රී ලංකාවට එවන ප්‍රේෂණ පිළිබඳ විශාල දත්ත විශ්ලේෂණය - ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වන ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ චර්යාවන්" නැමැති මාතෘකා යටතේ ජාතික විද්‍යා පදනම සඳහා සිදු කරන සංක්‍රමණය සම්බන්ධ පර්යේෂණ සඳහා විශාල දත්ත සමූහ යොදා ගැනීම පිළිබඳ යෝජනා සකස් කරන ලදී. එමෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රේෂණ රටාවන් පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයට ද යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් 2017 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ මගින් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ නාගරික ග්‍රාමීය ජනගහනය පිළිබඳ විකල්ප ඇස්තමේන්තු සම්බන්ධ ගැටළු පිළිබඳව අවධාරණය කරන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික බිලේෂා වීරරත්න මහත්මිය "ශ්‍රී ලංකාවේ නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවාවන් සඳහා අරමුදල් යෙදවීම" නැමැති මාතෘකාව යටතේ පත්‍රිකාවක් ලියන ලද අතර එය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් සංවිධානය කරන ලද ඉ්ඊ-ඔඔඉ සංවර්ධන සංසදය 2017 හි දී ඉදිරිපත් කරන ලදී.

ප්‍රතිපත්ති නියැළීම්

- බිලේෂා වීරරත්න මහත්මිය අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සංවිධානය කර අරලියගහ මන්දිරයේ දී පවත්වන ලද " අනාගතය සඳහා පුහුණු ශ්‍රමයෙහි අගුළු විවර කිරීම" නමැති මාතෘකාව යටතේ පවත්වන ලද රැස්වීමට සහභාගී වූවාය.

- අයිතිවාසිකම් සඳහා මග සහ ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය සහ නිපුණතා උන්නතාවය පිළිබඳ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාකාරී ව්‍යාපාරය සමග එක්ව ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසංධාන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "පීස් එක්ස්පෝ 2017" උළෙලෙහිදී තිරසර සංවර්ධන ඉලක්ක මාධ්‍ය කලාපය නැමැති වැඩසටහනෙහිදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සහකාර හරිනි වීරසේකර මහත්මිය ඉහත කී තේමාව යටතේ ම "පුහුණු ශ්‍රම සංක්‍රමණය සහ දේශීය ප්‍රජාව කෙරෙහි එමගින් ඇතිවන බලපෑම" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාවකට සහභාගී වූවාය.

- බිලේෂා වීරරත්න මහත්මිය විදේශ රැකියා අමාත්‍යාංශය සඳහා "ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුවෙහි" තවදුරටත් සේවය කරන ලද අතර, ආචාර්ය වීරරත්න මහත්මිය සහ අරුණතිලක මහත්මිය යන දෙදෙනා ම ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සංවිධානය කරන ලද ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සමාලෝචනය සඳහා විශේෂඥයින් ලෙස සේවය සපයා දුන්හ.

- බිලේෂා වීරරත්න මහත්මිය ශ්‍රී ලංකාවේ ශ්‍ර සංක්‍රමණිකයින්ගේ සමාජ ආර්ථික බලපෑම සහ නූතන දවසේ වහල් සේවය නැමැති තේමාව යටතේ ඔඑ1 රූපවාහිනී නාලිකාව විසින් විකාශය කරන ලද "ෆෙස් ද නේෂන්" නැමැති සජීවී රූපවාහිනී සාකච්ඡාව සඳහා සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහභාගී වූවාය.

- එමෙන්ම බිලේෂා වීරරත්න මහත්මිය ශ්‍රී ලංකාවේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් සංවිධානය කරන ලද, "සංක්‍රමණයෙහි අනාගතය වෙනස් කිරීම - ආහාර සුරක්ෂිතතාවය සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම" නමැති මාතෘකාව යටතේ ලෝක ආහාර දිනය වෙනුවෙන් පවත්වන ලද විද්වත් මණ්ඩල සාකච්ඡාව සඳහා සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහභාගී වූ අතර " නීල හරිත අයවැය විසින් සංක්‍රමණිකයින් සහ ඔවුන්ගේ 'ඩොලර් කොළී අමතක කළේ ද?" යන මාතෘකාව යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ටෝකිං ඉකොනොමික්ස්

බ්ලොග් අඩවිය සහ දේශීය මාධ්‍ය කව සඳහා ලිපියක් පළ කළාය.

අනෙකුත් ක්‍රියාකාරකම්

- 2017 වර්ෂයේ දී බිලේෂා වීරරත්න මහත්මිය කොළඹ විද්‍යාලයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙකු සඳහා උපදේශක වශයෙන් කටයුතු කළ අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම උපාධි ආයතනයේ ආචාර්ය උපාධි නිබන්ධන සනාථ කිරීමේ විභාගයක් සඳහා පරීක්ෂකවරියක වශයෙන් ද සේවය කළාය.

- එමෙන්ම බිලේෂා වීරරත්න මහත්මිය 2010 වර්ෂයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි අරමුදල් සැපයීම සඳහා " දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්ක්‍රියාකාරීත්වය සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික වෙළඳපොළෙහි පිටතට සංක්‍රමණය වීම" පිළිබඳ පර්යේෂණ යෝජනාවක් ඉදිරිපත් කළාය.

ප්‍රකාශන

- වීරරත්න, බිලේෂා (2017), "වර්ධනය හා තරගකාරීත්වය සඳහා නිපුණත්වය ශක්තිමත් කිරීම, යළි සංකලනය කිරීම සහ ආකර්ෂණය කර ගැනීම", ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ, ශ්‍රී ලංකාව

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ඕකනසබට ෟජදබදපසපි සඟරාව සඳහා සහ දේශීය මාධ්‍ය සඳහා බිලේෂා වීරරත්න විසින් ලියන ලද බ්ලොග් ලිපිය, "විසි කරන විට ගෙවන්න! ශ්‍රී ලංකාවේ ඉහළ යමින් පවතින කසළ ගැටළුව සඳහා විසඳුමක්".

- 2016 දී පැවැත්වූ ෂධඝෘ ඊකමැ ෟජදබදපහ ෘස්කදටමැ නැමති සම්මන්ත්‍රණය පිළිබඳ සංස්කරණය කළ වෙළුම සඳහා බිලේෂ වීරරත්න විසින් "ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල සංචාරක කර්මාන්තය සහ නාගරීකරණය" නැමති පරිච්ඡේදය ලියන ලදී.

- අරුණතිලක, නිෂා; ජයරත්න, සුවෙන්ද්‍රානි; පෙරේරා, නිපුනි; ගුණසේකර, නෙලූකා (2017), "සියරට පැමිණීම: නැවත සංකලනය වීමේ අභියෝග", එස්. ඉරුදය රන්ජන් "දකුණු ආසියාවේ සංක්‍රමණ වාර්තාව", (පිටු 267-291), ඔක්සන්, රූට්ලෙජ්, එක්සත් රාජධානිය.

- වීරරත්න, බිලේෂා. (2017). "ශ්‍රී ලංකාව: සුරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණ පිළිබඳ ගෝලීය ගිවිසුම", ජාතික අදහස් විමසීම් ප්‍රතිඵල වාර්තාව, විදේශ රැකියා අමාත්‍යාංශයෙහි සංක්‍රමණ සඳහා ජාත්‍යන්තර සංවිධානය සහ විදේශ සේවා අමාත්‍යාංශය

- බිලේෂ වීරරත්න (2017). "ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය ජනගහන පැතිකඩ: විකල්ප ඇස්තමේන්තු", ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති බාගත හැකි දත්ත පත්‍රිකා.

සංනිවේදනය / ප්‍රචාරණය

අබුඩාබි හි නිව් යෝර්ක් විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද පළමු වැනි වාර්ෂික ඍෑබඵ වැඩමුළුවේදී "තාවකාලික සංක්‍රමණික සේවකයින් බඳවා ගැනීම සහ ශ්‍රී ලංකාවේ උප නියෝජිතයින්ගේ වර්ධනය වෙමින් පවතින කාර්ය භාරය" නැමැති අධ්‍යයනය මගින් සොයාගත් කරුණු පරිත්‍යාගශීලීන්ගෙන් සහ පර්යේෂකයින්ගේ සමන්විත සභාවකට සහ නිව් යෝර්ක්හි ෆාර්මින්ග්ඩේල් විද්‍යාලයේ නිව්යෝර්ක් ප්‍රාන්ත ආර්ථික සංගමයේ වාර්ෂික සමුළුවෙහි ශාස්ත්‍රඥයින්ගෙන් සැදුම් ලත් සභාවකට ඉදිරිපත් කළාය. එමෙන්ම වීරරත්න මහත්මිය ශ්‍රී ලංකාවේ නාගරික සහ ග්‍රාමීය ජනගහන පැතිකඩ පිළිබඳ විකල්ප ඇස්තමේන්තු සකස් කරන ලද අතර ඒවා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන වෙබ් අඩවියෙහි නොමිලයේ බාගත කළ හැකි දත්ත පත්‍රිකා ලෙස පළ කර ප්‍රචාරණය කරන ලදී.

පෞද්ගලික අංශය සහ සංවර්ධනය

පෞද්ගලික අංශය සංවර්ධනය කිරීම දැනුම පදනම් කරගත්, අධික තරගකාරී, සමාජ වෙළඳ පොළ ආර්ථිකයක් නිර්මාණය කිරීම උදෙසා 2025 දැක්ම මගින් යෝජනා කර ඇති රජයෙහි ප්‍රතිපත්ති දැක්මෙහි අත්‍යවශ්‍ය සංරචකයක් වේ. අඩු ඒක පුද්ගල ආදායමක් සහිත, මිලියන 20 ක පාරිභෝගිකයින් සංඛ්‍යාවකගෙන් සමන්විත, සාපේක්ෂ වශයෙන් කුඩා දේශීය වෙළඳ පොළක් තිබීම සලකා බැලීමේදී, ශ්‍රී ලංකාව අඩු මධ්‍යම ආදායම් ලබන තත්ත්වය අභිබවා ගිය ප්‍රගතියක් අත් කර ගැනීම අපනයන දිශානත වූ ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම මත රඳා පවතිනු ඇත. එසේ කිරීමට නම් අඛණ්ඩ කාල පරිච්ඡේදයක් පුරා බාහිරින් පවතින ඉහළ ඉල්ලුම සාර්ථක ලෙස පාලනය කිරීම සඳහා අවශ්‍ය රාමු නිර්මාණය කිරීම රටට අවශ්‍ය වේ. ඒක පුද්ගල ආදායම එක්සත් ජනපද ඩොලර් 5,000 දක්වා ඉහළ නැංවීමට ද, නව රැකියා මිලියනයක් උත්පාදනය කිරීමට ද, සෘජු විදේශ ආයෝජන වර්ෂයකට එක්සත් ජනපද ඩොලර් බිලියන 5.0 ක් දක්වා වැඩි කිරීමට ද, වර්ෂයකට එක්සත් ජනපද ඩොලර් බිලියන 20.0 දක්වා අපනයන දෙගුණ කිරීමට ද රජය අරමුණු කරයි. තවද, සියයට අටක අනුපාතයක හෝ එයට වැඩි දළ දේශීය වර්ධන අනුපාතයක් පවත්වා ගැනීමේ ප්‍රතිපත්තිමය අරමුණක් සහිත රජය දැනට ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් 27% ක් ව පවතින වාර්ෂික ආයෝජන අනුපාතය අවම වශයෙන් 35% දක්වා ඉහළ නැංවිය යුතු වනු ඇත. රාජ්‍ය මූල්‍ය කෙරෙහි වර්ධනය වෙමින් පවතින පීඩනය හමුවේ සහ රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදනයෙන් 6% ට ආසන්න ප්‍රමාණයක උච්ඡතම මට්ටමක පැවතිය හැකි බවට වන දැනුම්දීම් තිබෙන තත්වයක මෙම ඉහළ ආයෝජන අනුපාතය සම්පූර්ණයෙන්ම පාහේ පෞද්ගලික ආයෝජන මගින් ලබා ගත යුතු වේ.

පර්යේෂණ අවධානයන්

2017 වර්ෂයේ පර්යේෂණවල අවධානය ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ යොමු වී තිබේ: (1) පෞද්ගලික අංශයේ සංවර්ධනය සඳහා නියාමන පරිසරය සහ තරගකාරීත්වය කෙරෙහි එමගින් ඇති කෙරෙන බලපෑම, (2) ව්‍යවසායකත්වය, නවෝත්පාදන සහ ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයෙහි ආයෝජන ප්‍රවනතා. නියාමන බාධක ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය සහ ව්‍යාපාර කිරීමේ පහසුව වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු අවහිරතාවයන් ඇති කරවන සාධක ලෙස අන්තර්ජාතික දර්ශක ගණනාවක් මගින් හඳුනා ගෙන තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා වන ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම කෙරෙහි විශාල අවධානයක් යොමු කරමින් පසු ගිය වර්ෂ කිහිපයේදී නියාමන ප්‍රතිසංස්කරණ සිදු කිරීමට ප්‍රමුඛත්වයක් ලබා දී තිබුණි. ප්‍රතිසංස්කරණ ඉඩ ප්‍රස්ථා තිබෙන ක්ෂේත්‍ර හඳුනා ගැනීමට පමණක් නොව, ඉදිරියට අනුගමනය කළ හැකි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ නිල නිලධාරි කිත්මිණ හේවගේ ජූලි 9 - 12 දින වල චීනයේ මැංග්ෂි නගරයේ පැවැති තුන්වැනි ට්‍රාන්ස් -හිමාලයා සං සංවර්ධන සංසදයෙහිදී 'ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රතිපත්තිය සහ සංවර්ධනයි නමැති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය.

ප්‍රතිපත්ති දිශාවන් තීරණය කිරීමට ද මෙම ක්ෂේත්‍රයෙහි සිදු කෙරෙන පර්යේෂණ උපකාරී වී තිබේ. මෙම වර්ෂය පුරා සිදු කරන ලද පර්යේෂණ මගින් නියාමන පරිසරයෙන් ඔබ්බට ගොස් පෞද්ගලික අංශයේ සංවර්ධනයෙහි තිබෙන අංශ විශේෂිත ප්‍රවණතා කෙරෙහි ද අවධානය යොමු කර ඇත. එමෙන්ම, මෙම පර්යේෂණ ක්ෂේත්‍රය මගින් අංශ විශේෂිත අභියෝග කෙරෙහි ගැඹුරු දැක්මක් ලබා දීමට සහ සාක්ෂි පදනම් කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි දායක වීමට අවශ්‍ය වන අවස්ථා පිළිබඳ ගැඹුරු දැක්මක් ලබා ගැනීමට ද හැකිවී තිබේ.

පර්යේෂණ අධ්‍යයන

සන්නද්ධ ගැටුම් අවසන් වීම හේතුවෙන් සහ ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම් ලබන තත්වය දක්වා වර්ධනය වීම හේතුවෙන් එහි ආර්ථිකය වර්තමානයේ දී සැලකිය යුතු පරිවර්තනයන්ට භාජනය වෙමින් පවතියි. ලෝක ආර්ථික සංසදය සමග හවුල්කාරිත්වයෙන් යුතුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාව සඳහා ලෝක ආර්ථික සංසද පරිවර්තන සිතියමක් නිර්මාණයය කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන පරිවර්තන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කළේය. මෙම පර්යේෂණ මගින් පරිවර්තන තේමා හතක් හඳුනාගන්නා ලදී: සාධාරණ වර්ධනය, සේවා නියුක්තිය සහ සේවා නියුක්ති හැකියාව, ඵලදායී කෘෂිකර්මය, ඩිජිටල් පරිවර්තනය, අපනයන තරගකාරීත්වය, ප්‍රතිසංධානය හා සංවර්ධනය, සහ ප්‍රතිසංස්කරණ සහ යහපාලනය.

මෙම සිතියම මූලික වශයෙන් 2017 වර්ෂයේ ඩාවෝස් නුවර පැවැති ලෝක ආර්ථික සංසදය හමුවේ දී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට ඉදිරිපත් කරන ලද අතර, ඉන්

පසුව එය ප්‍රසිද්ධියට පත් කරන ලදී. මෙම සිතියම සියලුම ලෝක ආර්ථික සංසද පාර්ශවකරුවන්ට ශ්‍රී ලංකාවෙහි ආර්ථික කටයුතු සම්බන්ධ නියැළීම් සිදු කිරීම සඳහා අවශ්‍ය වේදිකාවක් ලෙස ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, එතැන් සිට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් වන දුෂ්නි වීරකෝන් සහ කිත්මින හේවගේ ලෝක ආර්ථික සංසදයේ විශේෂඥ ජාලයට ද පත් කර තිබේ.

අකාර්යක්ෂම රාජ්‍ය නිලධාරිවාදය, ප්‍රතිපත්ති අස්ථාවරත්වය සහ සීමාකාරී කම්කරු නියාමනය ආදිය ආර්ථිකය සඳහා පෞද්ගලික අංශයේ ඉහළ සහභාගීත්වයක් ලබා ගැනීම කෙරෙහි බලපාන නියාමන අවහිරතාවයන් ගෙන් සමහරකි. අවධානය යොමුවිය යුතු මෙම ක්ෂේත්‍ර ගෝලීය තරගකාරීත්වය පිළිබඳ වාර්තාව 2017 මගින් අවධාරණය කරන ලදී. ලෝක ආර්ථිකය සංසදය සඳහා මෙම වාර්තාව සකස් කිරීමේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සඳහා ශ්‍රී ලංකාවේ හවුල්කාර ආයතන ලෙස අඛණ්ඩව කටයුතු කරයි.

මැදි ආදායම් ලබන තත්වයට උසස් වීමේ සිට ශ්‍රී ලංකාවට සාම්ප්‍රදායිකව ආධාර ලබාදුන් රටවලින් ලැබෙන සනදායි සංවර්ධන මූල්‍ය සඳහා ශ්‍රී ලංකාවට තිබූ ප්‍රවේශය සැලකිය යුතු ලෙස අඩු වී තිබේ. ශ්‍රී ලංකාවේ වැදගත් උපාය මාර්ග ික පිහිටීම සහ ඉන්දියාව සහ චීනය මෙරට සංවර්ධන ක්‍රියාවලියෙහි වැදගත් ක්‍රියාකාරීන් ලෙස ඉස්මතු වීමත් සමග දකුණු-දකුණු සහයෝගිතාවය දිගින් දිගටම ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කර තිබේ. මෙය පිළිගැනීමට ලක් කිරීමක් වශයෙන්, කිත්මින හේවගේ සහ හරිනි වීරසේකර ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම් සන්දර්භය තුළ වෙනස් වෙමින් පවතින සංවර්ධන මූල්‍ය පරිසරය නමැති මාතෘකාව යටතේ විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා පර්යේෂණයක් සිදු කිරීමට බාර ගත්හ. මෙම පර්යේෂණය සඳහා ඉන්දියාවේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පර්යේෂණ සහ තොරතුරු පද්ධති නැමති ආයතනය විසින් අරමුදල් සපයනු ලබන අතර එය ප්‍රකාශයට පත් කිරීම සඳහා පිළිගෙන තිබේ.

පසුගිය වර්ෂ කිහිපය තුළදී ශ්‍රී ලංකාවට ලැබෙන සෘජු විදේශ ආයෝජන ගලනය අසතුටුදායක තත්වයක පැවති අතර, විශේෂයෙන්ම නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි සිදු කෙරෙන ආයෝජන සැලකිය යුතු ලෙස අඩු වී තිබේ. නිෂ්පාදන කේෂ්ත්‍රයේ ආයෝජන පිළිබඳව තවදුරටත් ගැඹුරු අවබෝධබෝධයක් ලබා ගැනීම පිණිස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් වන කිත්මින හේවගේ සහ හරින් වීරසේකර ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ආයෝජන පිළිබඳව ආයතන මට්ටමේ විශ්ලේෂණයක් නැමැති අධ්‍යයනය සිදු කරමින් සිටිති. මෙම අධ්‍යනයෙහි වාර්තාව 2018 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පත්‍රිකාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සහකාර විශ්වනාදන් සුබ්‍රමනියම් මහතා 2017 මාර්තු 15 වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයේදී පැවති ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දින සංසදයෙහි සාකච්ඡා මණ්ඩලයේ මුලසුන දැරිය

ප්‍රතිපත්ති නියැළීම්

- කිත්මින හේවගේ මහතා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් ස්ථාපනය කරන ලද ලෝක ආර්ථික සංසද නියැළීම් පිළිබඳ ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරී කණ්ඩායමට කරුණු පැහැදිලි කර දුන්නේය.

- ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ සකස් කරන ලද රජයේ තුන් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සඳහා ආයෝජන ප්‍රතිපත්තිය සහ ප්‍රතිසංස්කරණ නැමැති කොටස සකස් කිරීම් සඳහා දායකත්වය ලබාදෙන ලදී.

- කිත්මින හේවගේ මහතා සාර්ක් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානයය කරන ලද "තේ ගිවිසුම පුනර්ජීවනය කිරීම" පිළිබඳ වටමේස සාකච්ඡාවට සහභාගී විය.

ප්‍රකාශන

- වීරකෝන්, ඩී., සහ හේවගේ, කේ.වී. (2017), "රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, වර්ධනය සහ සාර්වස්ථාවරත්වය", කැලේගම, එස්. (සංස්කාරක) "ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිපත්තිය: ආර්ථික දෘෂ්ටිකෝණයන්" ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 17-42

- හේවගේ, කේ. වී. (2017),"වෙළඳාම සඳහා කලාපීය ආධාර සපයා දීම හරහා ආර්ථික සහයෝගීතාවය නැවත ශක්තිමත් කිරීම", "දකුණු ආසියාව සඳහා නව ඉදිරි ගණුදෙනු: වාණිජ්‍යය හා සබැඳුම්", රූට්ලෙජ්.

■ හේවගේ, කේ.වී. (2017). "දකුණු ආසියාවේ හැරීම: තරගකාරීත්වය ඉහළ නැංවීම සහ මීළඟ අපනයන බලගාරය නිර්මාණය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති" පිළිබඳ සමාලෝචනය, දකුණු ආසියා ආර්ථික සඟරාව, 18 (1), 1-26 සඟරා, 126-30

සංන්වේදන / ප්‍රචාරණය

ඉහත සාකච්ඡා කරන ලද පරිදි, පෞද්ගලික අංශයේ වඩා ඉහළ ආයෝජනයක් සඳහා පහසුකම් සැලසීම පිණිස ආර්ථික ප්‍රතිසංස්කරණ වල නියැළීම මෙම වර්ෂයෙහි පර්යේෂණ සහ ප්‍රචාරණ වල අවධානය විය. පර්යේෂණ නිලධාරී කිත්මිනි හේවගේ මහතා වාර්ෂික ආසියානු සංවර්ධන බැංකු - ආසියානු බුද්ධි මණ්ඩල සංවර්ධන සංවාදයෙහි දී සිදුකරන ලද ඉදිරිපත් කිරීමක් අතරතුරදී ශ්‍රී ලංකාව මෙම නව තත්වයන්ට හැඩ ගැසීමේ හදිසි අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා කළේය. මෙම ඉදිරිපත් කිරීම දේශීය මුද්‍රිත මාධ්‍ය ඔස්සේ වාර්තා කරන ලද අතර, ඊසීඑ 360X සෘඩසැඅ රූපවාහිනී වැඩසටහනෙහි පැවති රූපවාහිනී සම්මුඛ සාකච්චාවකදී ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරන ලදී.

ශ්‍රී ලංකාවේ විධිමත් ආර්ථිකය සඳහා කාන්තා ශ්‍රම බලකා සහ සහභාගිත්වය අඩුවීම රටෙහි වර්ධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන බාධකයක් වී තිබේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ කුළුබඩු සහ කොහු කර්මාන්ත අංශයෙහි කාන්තා ශ්‍රම සහභාගීත්වය සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳව ජනක විජයසිරි, සුනිමලී මදුරාවල, දිලානි හිරිමුතුගොඩගේ සහ දර්ශනී ප්‍රේමරත්න විසින් සිදුකරන ලද පර්යේෂණය පදනම් කරගෙන, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සඳහා කාන්තා ශ්‍රම බලකායෙහි අඩු සහභාගීත්වය පිළිබඳ පුවත්පත් ලිපි ගණන ගණනාවක් පළ කරන ලදී.

එමෙන්ම ආයෝජන ප්‍රතිසංස්කරණ වල ඇති අඩුපාඩු වලට ආමන්ත්‍රණය කිරීම, දේශීය පෞද්ගලික අංශ ආයෝජනයන් සඳහා පවතින අවහිරතා, සහ සභ්වභාවික ආපදා සහ යුරෝපයේ සහ එක්සත් ජනපදයේ ආර්ථික ප්‍රතිපත්ති වෙනස්වීම් වැනි දේශීය හා බාහිර කම්පනයන්ගේ බලපෑම් ආදිය සම්බන්ධයෙන් තවත් විවිධ ලිපි හා මාධ්‍ය සම්මුඛ සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී.

TTI අරමුදල් සැපයීම යටතේ සිදු කළ වැඩසටහන් 2017

ප්‍රකාශන

ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2017
ශ්‍රී ලංකාවේ බදුකරණය; වර්තමාන ප්‍රවණතා සහ දෘෂ්ටිකෝණයන්
TE Digest - 2017 - 1 වෙනි කලාපය සහ 2 වැනි කලාපය
ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය: අවුරුදු 150 ක් සහ ඉන් ඔබ්බට

වැඩසටහන්

ආසියානු බුද්ධි මණ්ඩල සංවර්ධන සංසදය

පර්යේෂණ ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ නාගරික හා ගාමීය ජනගහන පැතිකඩ: විකල්ප ඇස්තමේන්තු
ශ්‍රී ලංකාවේ සිටින ගුරුවරු සංඛ්‍යා - ගුණාත්මකභාවය බලපායි!

ශ්‍රී ලංකාවේ පාසල්වල ලක්ෂණ සහ ශිෂ්‍ය කාර්ය සාධනය

සෞඛ්‍ය රක්ෂණය ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න වර්යාවන්ට බලපායිද?

ශ්‍රී ලංකාවේ ශේණියේ ශිෂ්‍යත්ව විභාගය:

කාර්ය සාධනය සහ ඵලදායීතාවය ඇගයීම - PJ 281 I

පුහුණු සහායක කාර්ය මණ්ඩලය

"කාන්තාවන් සඳහා ගැටුම් කළමනාකරණ හැකියාවන්" පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය" පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
ඩිජිටල් ඡායාරූප පිළිබඳ දෙදින වැඩමුළුව

පර්යේෂණ කාර්ය මණ්ඩලය

2018 වසරේදී පර්යේෂණ නිලධාරි අෂානි අබේසේකර මහත්මිය සඳහා ඡෑජ මාර්ගගත පාඨමාලාව

කාර්ය මණ්ඩලය අන්තර්ක්‍රියා

විනෝද චාරිකාව - අවානි හෝටලය කළුතර

පර්යේෂණ කණ්ඩායම් නායකයින්

වමේ සිට දකුණුට:
ගංගා තිලකරත්න, PhD (මැන්චෙස්ටර්), ජානක විජයසිරි, PhD, (මොනෑෂ්), නිෂා අරුණතිලක, PhD (ඩියුක්), සමන් කැලේගම, ඩී. , D'Phil (ඔක්සන්), බිලේෂා වීරරත්න, PhD(CUNY), දුෂ්නි වීරකෝන්, PhD (මැනචෙස්ටර්), අතුල සේනාරත්න PhD (ඩීකිං), මනෝජ් තිබ්බොටුවාව, PhD (බටහිර ඕස්ට්රේලියාව)

පර්යේෂණ කාර්ය මණ්ඩලය

කාංචනා වික්‍රමසිංහ
BSc (පේරාදෙණිය), MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ

ප්‍රියංකා ජයවර්ධන
BSc (කොළඹ), MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ

සුනිමලී මදුරාවල
BA (කොළඹ), MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ

ඩිලානි හිරමුතුගොඩගේ
BA (කොළඹ), MEcon (කොළඹ)
පර්යේෂණ නිලධාරි

සමන්ති බණ්ඩාර
BA (කොළඹ), MSc (Chulalongkorn)
පර්යේෂණ නිලධාරි

කිත්මිණි හේවගේ
BA (ජෝන්ස් හොප්කින්ස්), MSc (UCL)
පර්යේෂණ නිලධාරි

නෙලුක ගුණසේකර
BA (කොළඹ)
පර්යේෂණ සහකාර

චින්තනී සූරියමුදලි
BA (කොළඹ)
පර්යේෂණ නිලධාරි

අෂානි අබයසේකර
BA (පේරාදෙණිය), MA (ANU)
පර්යේෂණ නිලධාරි

නවන්ති සේනාරත්න
BSc (සවුතැම්ටන්), MSc (සරේ)
පර්යේෂණ සහකාර

හරිනි විරසේකර
BSc (ඔදකසව), BA (කොළඹ)
MSc (වෝර්වික්)
පර්යේෂණ සහකාර

යොලන්තිකා ඇල්ලේපොළ
BSc (ශාන්ත ඇන්ඩෘස්),
MSc (LSE)
පර්යේෂණ සහකාර

විමල් නානායක්කාර
BSc (පේරාදෙණිය)
ජ්ෂ්ඨ බාහිර සාමාජික

ආචාර්ය සමන් කැලේගම (1959 - 2017) මහතාගේ ජීවිතයේ වැදගත් අවස්ථා





1983

M'Sc' (ගණිතය), ප්‍රථම පංතිය
ඉංදියානු තාක්ෂණ ආයතනය, කන්පූර්, ඉන්දියාව

1986

M'Sc (සංවර්ධන ආර්ථික විද්‍යාව),
ශාන්ත කැතරින් කොලෙජ්, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය,එක්සත් රාජධානිය

1990

D'Phil' (ආර්ථික විදයාව),
ශාන්ත කැතරින් කොලෙජ්, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආචාර්ය කැලේගම මහතා
පර්යේෂණ සාමාජිකයෙකු ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට සම්බන්ධ විය.

1992

"ආර්ථිකයෙහි තත්වය"
නැමති වාර්තාව ආරම්භ කිරීම

1993

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ආයෝජන අරමුදල පිහිටුවීම

1995

විධායක අධ්‍යක්ෂ තනතුරට පත් වීම

1998

සාර්ක් පර්යේෂණ ජාලයේ සභාපති තනතුරට පත්වීම
(විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ)

සම්පත් බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්වීම

1999

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ගොඩනැගිල්ල සඳහා ඉඩම අත්පත් කර ගැනීම

ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ සභාපති තනතුරට පත්වීම



2000

2006

2007

2008

2010

2012

2015

2016

දකුණු ආසියා ආර්ථික සඟරාව එළි දැක්වීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (කර්මාන්ත / ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ)

ජනාධිපතිතුමා යටතේ ක්‍රියාත්මක වන **ජාතික ආර්ථික සභාවෙහි සේවය කිරීම** සඳහා ආරාධනා ලැබීම

දකුණු ආසියා ආර්ථික සමුළුව ආරම්භ කිරීම

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන නව ගොඩනැගිල්ල විවෘත කිරීම

පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙහි පාලක මණ්ඩලයට පත්වීම

සිංගර් ශ්‍රී ලංකා සමාගමෙහි සභාපති ලෙස පත්වීම

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයෙහි අන්තර්ජාතික වෙළඳාම සඳහා වන මධ්‍යස්ථානයෙහි සභාපති තනතුර සඳහා තෝරා ගනු ලැබ සිටීම

අන්තර්ජාතික ග්‍රන්ථ:

කලාපීය ආර්ථික සංකලණය

ආකුල වාතාවරණයන් තුළ දකුණු ආසියාව මුහුණ දෙන අභියෝග (සංස්කාරක)

ප්‍රකාශනය: වෙළඳාම, ආර්ථික විද්‍යාව සහ පරිසරය පිළිබඳ දකුණු ආසියානු සුපරීක්ෂණය, කත්මණ්ඩු; සහ ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වන දකුණු ආසියානු මධ්‍යස්ථාය, කත්මණ්ඩු, 2012

දකුණු ආසියාව තුළ විදේශාධාර

මතු වෙමින් පවතින වාතාවරණයන් (සංස්කාරක),
සේජ් ප්‍රකාශන, ඉන්දියාව, 2012,
රූට්ලෙජ් ප්‍රකාශන, එක්සත් රාජධානිය, 2011

දකුණු ආසියාවේ වෙළඳ ලිහිල්කරණය හා දරිද්‍රතාවය (සහාය සංස්කාරක)

සේජ් ප්‍රකාශන, ඉන්දියාව, 2011

දකුණු ආ ආසියාවේ සංක්‍රමණය, ප්‍රේෂණ සහ සංවර්ධනය (සංස්කාරක)

සේජ් ප්‍රකාශන, ඉන්දියාව, 2010

දකුණු ආසියාවේ ආර්ථික සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම - SAFTA ගිවිසුමෙන් ඔබ්බට (සහාය සංස්කාරක), සේජ් ප්‍රකාශන, ඉන්දියාව, 2009

දකුණු ආසියාවේ සේවා වෙළඳාම (සංස්කාරක)

වෙළඳාමෙන් ලැබෙන ප්‍රතිලාභ යොදා ගැනීම පිළිබඳ දකුණු ආසියානු වෙළඳ සහ සංවර්ධන වාර්ෂික සංග්‍රහය

දේශීය අභියෝග සහ ඉන් ඔබ්බට (සහාය සංස්කරණය), ශාස්ත්‍රීය පදනම, වෙළඳාම සහ සංවර්ධනය සඳහා වන ඉන්දියානු මධ්‍යස්ථානය, 2008, සේජ් ප්‍රකාශන, ඉන්දියාව, 2007, ලෝක වෙළඳ සංවිධානයේ දකුණු ආසියාව (සංස්කාරක)

දකුණු ආසියානු වෙළඳ සහ සංවර්ධන වාර්ෂික සංග්‍රහය 2006 - තීරණාත්මක අවස්ථාවල බහුපාර්ශ්විකවාදය

සංවර්ධන ප්‍රමුඛතාවයන් යළි තහවුරුකිරීම (සහාය සංස්කාරක), විලී ප්‍රකාශන, ඉන්දියාව, 2007, පීඩනය යටතේ සංවර්ධනය, සංක්‍රාන්ති අවස්ථාවක තිබෙන ශ්‍රී ලංකාවේ ආර්ථිකය, සේජ් ප්‍රකාශන, ඉන්දියාව, 2006

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තිය

ගැටළු සහ සංවාද (ස්ංස්කාරක), සේජ් ප්‍රකාශන, ඉන්දියාව, 2004

දේශීය ග්‍රන්ථ:

ශ්‍රී ලංකාවේ වෙළෙඳ පොළ ආර්ථික තන්ත්‍රය යටතේ ආර්ථික හා සමාජ සංවර්ධනය,

බුද්ධදාස හේවාවිතාරණගේ උපහාර
වෙළුම 1, ඔක්තෝබර් 2011 (දිලෙනි ගුණවර්ධන සමග සංස්කරණය කළ)

ශ්‍රී ලංකාවේ වෙළෙඳ පොළ ආර්ථික තන්ත්‍රය යටතේ ආර්ථික හා සමාජ සංවර්ධනය,
බුද්ධදාස හේවාවිතාරණගේ උපහාර
වෙළුම 2, පෙබරවාරි 2012 (දිලෙනි ගුණවර්ධන සමග සංස්කරණය කළ)

"සමකාලීන ආර්ථික ගැටලු: ගෝලීය සන්දර්භයෙහි ශ්‍රී ලංකාව"

ශ්‍රී ලංකා ආර්ථික සංගමය, 2006

"කෝටා ක්‍රමවේදයට පසු දකුණු ආසියාව:

MFA කෝටා අදියර ක්‍රමය ඉවත් කිරීමෙහි බලපෑම" (සංස්කාරක), IPS $ FES" 2005

"ශ්‍රී ලංකාවේ නිමි ඇඳුම් කර්මාන්තය: ගෝලීය අභියෝගයට මුහුණ දීම" (සංස්කාරක) IPS" 2004
ශ්‍රී ලංකා ආර්ථික සඟරාව (ගාමනී කොරයා මහතාට ගෞරව පිණිස පළකළ විශේෂ මුද්‍රණය)
(ඒ.ඩී.වී. ද එස්. ඉන්ද්‍රරත්න සමග සංස්කරණය කරන ලද), ප්‍ර.අ.ආ. 2004

"වසර 400 ක ලන්දේසි - ශ්‍රී ලංකා සබඳතා: 1602-2002"

(ආර්. මැදවෙල සමග සංස්කරණය කළ), ප්‍ර.අ.ආ., 2003

දකුණු ආසියාවේ කලාපීය ආර්ථික සහයෝගීතාවය සඳහා තිබෙන බාධක

(සංස්කාරක), දකුණු ආසියා සහයෝගීතාවය සඳහා වන ක්‍රියාකාරීත්ව සංධානය සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ඒකාබද්ධ ප්‍රකාශනය, 2001
ශ්‍රී ලංකාවේ ශ්‍රම ඉල්ලුම පිළිබඳ කම්කරු නීතිකරණයෙහි බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම
(ආර්. ගුණතිලක සමග), ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව,
මුදල් හා ක්‍රමම සම්පාදන අමාත්‍යාංශය, 1997

"ශ්‍රී ලංකාව තුළ පොද්ගලීකරණය: ක්‍රියාත්මක කිරීමේ මුල් වසරවල අත්දැකීම්"
ශ්‍රී ලංකා ආර්ථික සංගමය - ඕෂෘ ඒකාබද්ධ ප්‍රකාශනය, කොළඹ, 1993.

සහාය සේවා

මූල්‍ය සහ පරිපාලනය

පර්යේෂණ ඒකකවලට සහාය සේවා සපයා දීම පිණිස මූල්‍ය සහ පරිපාලන දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. එම සහය සේවා මූල්‍ය, පරිපාලන, මානව සම්පත්, නඩත්තු, මෙහෙයුම්, ප්‍රවාහන සහ ප්‍රසම්පාදන සේවා වලින් සමන්විත වේ.

ආචාර්ය සමන් කැලේගම මහතාගේ හදිසි අභාවය හේතුවෙන් 2017 මූල්‍ය වර්ෂය ආයතනයට පිරිමැසිය නොහැකි පාඩුවක් අත් කරදෙමින් අවසන් විය. කෙසේ වෙතත්, ඒ මහතාගෙන් ලැබුණු මග පෙන්වීම නිසා ප්‍රතිපත්ති අදධ්‍යයන ආයතනය දූරදර්ශී මගක් ඔස්සේ මෙහෙයවීම සඳහා අවශ්‍ය ශක්තිය අපට ලැබී තිබේ.

මෙම වර්ෂයේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි මූල්‍ය කාර්ය සාධනය රුපියල් මිලියන 14.68 ක අතිරික්තයක් පෙන්නුම් කරයි. රුපියල් මිලියන 144 ක් වූ සමස්ත ආදායම් සාමූහික වශයෙන් පහත සඳහන් ආදායම් වලින් සමන්විත වේ: ව්‍යාපෘති ආදායම (37%), පොළී ආදායම (25%), රජයේ ප්‍රදාන (10%), IDRC TTI ප්‍රදාන (18%), සහ අනිකුත් විවිධ ආදායම් (10%). මෙම වර්ෂය තුළ දී ලබාගත් රුපියල් මිලියන 53.0 ක වාර්තාගත ව්‍යාපෘති ආදායම පසුගිය වර්ෂ දෙක තුළ උපයාගෙන තිබූ රුපියල් මිලියන 25.0 ක සහ රුපියල් මිලියන 36.0 ක ආදායමට සාපේක්ෂව වැදගත් වර්ධනයක් පෙන්වයි.

2016 වර්ෂය තුළදී පර්යේෂකයින් හතර දෙනෙකු සහ සහාය කාර්ය මණ්ඩල සාමාජිකයින් තුන් දෙනෙකු ආයතයෙන් සමු ගත් අතර ආයතනයේ පර්යේෂණ සහ සහාය අංශවලට අලුතින් කාර්ය මණ්ඩල සාමාජිකයින් දස දෙනෙකු බඳවා ගනු ලැබූහ.

කාර්ය මණ්ඩලය

ගයානි කල්දේරා, මුදල් හා පරිපාලන අධ්‍යක්ෂ
රනුෂි ජයතිලක, ගණකාධිකාරී
තක්ෂිලා විතානගේ, ගිණුම් සහකාර
මධුෂ හෙට්ටිආරච්චි, මූදල් හා පරිපාලන සහකාර
නිලන්ති අලහකෝන්, ලේකම්
බර්නඩෙට් ප්‍රබලොගිනි, පිළිගැනීමේ නිලධාරිනිය
හර්ෂනී ෆොන්සේකා, මානව සම්පත් සහ පරිපාලන නිලධාරී
රේණුකා විජේකෝන්, පහසුකම් කළමනාකරණ නිලධාරී
පී.යූ. කේ. රාජසිරි, රියදුරු / කාර්යාල සහායක
ජී. ආර්. වික්‍රමසේන, රියදුරු / කාර්යාල සහායක
එච්. එස්. උදයකාන්ත, රියදුරු / කාර්යාල සහායක
නිහාල් වසන්ත, රියදුරු / කාර්යාල සහායක
එස්. පී. ගාමිණී, කාර්යාල සහායක

සහාය සේවා

සන්නිවේදන සහ විහිදුම්කරණ

සන්නිවේදන මාර්ග ඵලදායී ලෙස යොදා ගනිමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳ ප්‍රචාරණ සහ විහිදුම් කාර්යය ආයතනයෙහි ප්‍රධාන අරමුණ වලින් එකක් වන අතර එය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සන්නිවේදන සහ ප්‍රකාශන ඒකකයෙහි මෙහෙයවීම් යටතේ සිදු කරනු ලැබේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය බහු මානයන් ඔස්සේ සිදු කළ පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු විවිධ මාධ්‍ය හරහා දේශීය සහ අන්තර්ජාතික පාර්ශවකරුවන් වෙත බෙදා හැරීම මෙයට අයත්වේ. ප්‍රරකාශන, ප්‍රතිපත්ති සංක්ෂිප්ත, මුද්‍රිත, විද්‍යුත් සහ ගුවන්විදුලි මාධ්‍ය, ඩිජිටල් සහ සමාජ මාධ්‍ය, සහ විවිධ වැඩසටහන් සහ සංවාද මෙයට ඇතුළත් වේ. 2017 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සන්නිවේදන උපාය මාර්ගය සහ සන්නිවේදන සැලසුම් පර්යේෂණ කාර්යය මණ්ඩලයේ අදහස් විමසීම තුළින් තවපදුරටත් සංවර්ධනය කර අනුගමනය කරන ලදී.

ප්‍රකාශන හරහා පර්යේෂණ ප්‍රකාශනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය පර්යේෂණ සොයාගැනීම් ප්‍රචාරණය කිරීම සඳහා සහ සමාජ ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීමේ ගැටළු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත දැනුම් දීම සඳහා භාවිතා කරන ප්‍රධාන මාධ්‍යන්ගෙන් එකක් ලෙස ප්‍රකාශන යොදා ගනියි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රකාශන සකස් කිරීම සහ ප්‍රචාරණය කිරීම අධීක්ෂණය කරනු ලබන ප්‍රකාශන අංශය, එම ප්‍රකාශනවල ගුණාත්මක භාවය පවත්වා ගනු ලබන බව පමණක් නොව, දේශීය මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද පුළුල් පිරිසක් වෙත එම ප්‍රකාශන ප්‍රවේශ වන බව සහ ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ නියැලීම ලබාගන්නා බව සහතික කරයි.

ප්‍රතිපත්ති අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශන අලෙවි කිරීම සාමාන්‍යයෙන් ආයතන පරිසරයේ දී සහ දිවයින පුරා සිටින තෝරාගත් වෙළඳුන් මගින් සිදු කෙරේ. ප්‍රකාශන අලෙවි කරන වෙළඳුන් පිළිබඳ සමස්ත අධීක්ෂණය සිදු කිරීමට අමතරව ප්‍රකාශනය ඒකකය විසින් අවශ්‍ය පසු විපරම් කටයුතු ද සිදු කරනු ලැබේ. එමෙන් ම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රකාශන අලෙවි කිරීම්වල ඉලක්ක සපුරා ගැනීම සඳහා විවිධ අලෙවිකරණ ක්‍රමෝපායයන් ද අනුගත කර ගනු ලැබේ.

වෙනත් මාර්ග

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශාස්ත්‍රීය පර්යේෂණ ආයතනයේ ජාතික, කලාපීය සහ අන්තර්ජාතික

පාර්ශවකරුවන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් යන ඉලක්කගත කණ්ඩායම්වල වඩාත් ඵලදායී නියැලීම ලබා ගැනීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති ප්‍රතිවේධ වැනි වැඩි ප්‍රවේශයක් ලැබෙන සහ පහසුවෙන් අවබෝධ කරගත හැකි ක්‍රමවත් සැකසුම්වලින් නැවත ඉදිරිපත් කරනු ලැබේ. 2017 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එහි ප්‍රකාශන සහ සිදු කෙරෙමින් පවතින පර්යේෂණ පදනම් කර ගෙන ප්‍රතිපත්ති ප්‍රතිවේධ 19 ක් සකස් කළේය. මේ අතරින් ප්‍රතිපත්ති ප්‍රතිවේධ 15 ක් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම වාර්ෂික ප්‍රකාශනය වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2017" පදනම් කරගෙන සකස් කරන ලදී.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි කාලීන කෘති පිළිබඳව සාකච්ඡා කිරීම සහ ප්‍රතිපෝෂණය ලබා ගැනීම සඳහා නිතිපතා සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ පාර්ශවකරුවන් සමග වඩාත් අවිධිමත් වට මේස සාකච්ඡා පැවැත්වීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විහිදුම්කරණ ක්‍රියාමාර්ග අතර වේ. ඊට අමතරව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, නිතිපතා සිදු කරන විද්වත් මණ්ඩල සාකච්ඡා සහ පරිවර්තනය කරන ලද විහිදුම්කරණ සහ ප්‍රකාශන ද්‍රව්‍ය වැනි විකල්ප හරහා දේශීය භාෂාව භාවිතා කරන කණ්ඩායම් ද ඉලක්ක කර ඇත.

මාධ්‍ය සමග උපායමාර්ගික සම්බන්ධතාවයක් හරහා විහිදුම්කරණය

පසුගිය කාල පරිච්ඡේදය පුරා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මුද්‍රිත සහ විද්‍යුත් ජන මාධ්‍ය සමග සමීප සම්බන්ධතාවයක් පවත්වා ගෙන ඇත. දෘශ්‍ය බව සහ ප්‍රචාරණය මෙම ආයතනයේ ප්‍රධානතම ප්‍රමුඛතාවයන් වන බැවින් මාධ්‍ය සමග තිබෙන මෙම ක්‍රමෝපායික හවුල්කාරිත්වය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සමාජ ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් ඔබ්බෙහි ද සිටින ඉලක්කගත කණ්ඩායම් වෙත ප්‍රචාරණය

සහාය සේවා

කිරීම සඳහා බොහෝ සෙයින් පහසුකම් සලසා ඇත. මාධ්‍ය නිවේදන සහ පර්යේෂණ ලිපි ස්වරූපයෙන් බෙදා හරිනු ලබන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පුවත් මාධ්‍යවෙත හොඳින් ග්‍රහණය වන අතර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා පුළුල් මාධ්‍ය ආවරණයක් ද ලැබෙයි.

2017 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඉංග්‍රීසි මාධ්‍ය ජන මාධ්‍ය වෙත බ්ලොග් ලිපි 50ක් සපයා ඇත (ටෝකිං ඉකොනොමික්ස් සහ ක්ලයිමට් නෙට් බ්ලොග් අඩවි මගින් සකස් කරන ලද). සමස්තයක් වශයෙන් 2017 වර්ෂයේ දී මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සඳහා මාධ්‍ය අංග 507 ක් සපයා දී ඇත. අලුතින් හඳුන්වා දෙන ලද ක්‍රියාමාර්ග යක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය අධ්‍යාපනය පිළිබඳ එහි නවතම තොරතුරු සපයා දීම සඳහා මාධ්‍ය හමුවක් පවත්වන ලදී. මාධ්‍ය සහ පර්යේෂණ කාර්ය මණ්ඩලය අතර මුහුණට මුහුණ සිදු කළ සාකච්ඡා මගින් ආයතනය සහ ජනමාධ්‍ය අතර තිබෙන සම්බන්ධතාවය ශක්තිමත් වී තිබෙන අතර, වඩාත් වැඩි ඉලක්ක කිරීමක් සහිතව ආයතනයෙහි පර්යේෂණ ප්‍රවාරණය කිරීම සඳහා එය උපකාරී වී තිබේ.

තවත් ලුත් ක්‍රියාමාර්ගයක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් 2017 වර්ෂයේ දී රූපවාහිනී සම්මුඛ සාකච්ඡාව, සහ සාකච්ඡාමය වැඩසටහන් වලට සහභාගී වීම් ආරම්භ කළහ. ප්‍රතිපත්ති අධ්‍යායන ආයතනයේ පර්යේෂකයින් විසින් ඔවුන්ගේ විශේෂීකරණය සහිත ක්ෂේත්‍ර වන නීල ආර්ථිකය, ශ්‍රම වෙළෙඳ පොළ අකාර්යක්ෂමතා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, සංක්‍රමණය, ශ්‍රී ලංකාවේ ආර්ථික දැක්ම සහ දේශගුණ රක්ෂණය ඇතුළත් ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා කිරීම එලෙස පවත්වන ලද වැඩසටහන් 6 ක අංග විය.

වැඩසටහන්

2017 වර්ෂයේ පවත්වන ලද වැඩසටහන් අතර ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවර්ධන ආර්ථික විද්‍යාව සහ තිරසරභාවය පිළිබඳ මධ්‍යස්ථානය, දකුණු ආසියා පර්යේෂණ ජාලය සහ ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලය සමඟ එක්ව ජනවාරි මාසයේදී සංවිධානය කරන ලද මනව ප්‍රාග්ධනය, ආහාර සුරක්ෂිතභාවය සහ දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ සමුළුව ද විය. එමෙන්ම 'ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් සඳහා දේශගුණ රක්ෂණයී යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනයක් මගින් සොයා ගත් කරුණු ප්‍රචාරණය කිරීම සඳහා ජනවාරි මාසයේ දී පවත්වන ලද වැඩමුළුවක් ද ඒ අතර විය.

ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දිනය සැමරීම පිණිස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඩිජිටල් යුගයේ පාරිභෝගික අයිතිවාසිකම් නැමැති තේමාව කේන්ද්‍ර කර ගනිමින් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, ඩිජිටල් පාරිභෝගිකයින්, ව්‍යවසායකයින් සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් මාර්තු මාසයේදී සංසදයක් පවත්වන ලදී. එමෙන්න, පුළුල් පරාසයකට අයත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජීවන වැටුප පිළිබඳ ගෝලීය සංසදය සහ ෆෙයාට්‍රේඩ් සංවිධානය විසින් සංවිධානය කරන ලද පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් අගෝස්තු මාසයේ දී පවත්වන ලදී. තවද, 2017 සැප්තැම්බර් මාසයේ දී 5 වැනි ඒෂ්-ඒඔඔහ සංවර්ධන සංසදය කොළඹ දී පවත්වන ලදී. රටවල් 25 ක් නියෝජනය කරමින් පාර්ශවකරුවන් සහභාගී වූ එම සංසදය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සහ ආසියානු සංවර්ධන බැංකුවේ සම සංවිධායකත්වයෙන් පවත්වන ලදී. එයට අමතරව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රධානතම වාර්තාව 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2017' නැමති වාර්තාව ඔක්තෝබර් මාසයේදී එළි දක්වන ලදී

මාර්ගගත මාධ්‍ය ඔස්සේ දැනුම ප්‍රචාරණය කිරීම

තොරතුරු දැන ගැනීම පිණිස මාර්ගගත මාධ්‍ය කෙරෙහි ලෝකය වැඩෙ වැඩියෙන් නැඹුරු වෙමින් සිටින නිසා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ද ආයතනයෙහි පර්යේෂණ පිළිබඳව වැඩි උනන්දුවක් ඇති කිරීම සඳහා සහ සමාජ ආර්ථික ප්‍රතිපත්ති ගැටලු පිළිබඳ ප්‍රධාන ප්‍රතිවේදයන් සන්නිවේදනය කිරීම සඳහා සමාජ සහ ඩිජිටල් මාධ්‍ය මාර්ග ගණනාවක් තෝරා ගෙන තිබේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය වේදිකා මෙන්ම ටෝකිං ඉකොනොමික්ස් සහ ක්ලයිමට් නෙට් යන බ්ලොග් අඩවි දැනුම ප්‍රචාරණය කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් යොදා ගෙන ඇති මාර්ගගත වේදිකා අතර වේ. නවීකරණය කරන ලද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වෙබ් අඩවිය 2017 අප්‍රේල් මාසයේදී දියත් කරන ලද අතර, සතිපතා පාහේ ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ නව අන්තර්ගතයන් එම වෙබ් අඩවියට එක් කරනු ලැබේ.

ගැඹුරු මාතෘකා සාකච්ඡා කෙරෙන රචනා, කතු වැකිය ඉදිරි පිටුවේ පළවෙන ලිපි, සීඝ්‍ර ප්‍රතිචාර ලිපි ආදිය නිතිපතා පළ කෙරෙන මෙම බ්ලොග් අඩවි ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම විනිදුම්කරණ වලින් එකක් වේ. එමෙන්ම, 'සවුත් ඒසියන් වොයිසී සහ 'වර්ල්ඩ් පොලිටික්ස් රිවීවී වැනි ගෝලීය වේදිකාවවල පර්යේෂකයින්ගේ තෝරාගත් ලිපි පළ කර තිබේ.

එමෙන්ම 2017 වර්ෂය තුළදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමාජ මාධ්‍ය තුළ පෙනී සිටීම ද සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වූ අතර, ආයතනයෙහි ෆේස්බුක්, ඔඅසඑඑර, බසබනැෂබ, සහ ශදමඔමඉැ පිටු නිතිපතා යාවත්කාලීන කරනු ලැබේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ නිල පිටුවට 2016 වර්ෂයේ දී ලැබුණ් "Likes" සංඛ්‍යාව 1893 ක් වූ අතර 2017 වර්ෂය වන විට එය 2639 දක්වා වර්ධනය විය. එමෙන්ම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ලෝක බැංකුව සමග එක්ව ඔඅසඑඑර සාකච්ඡාවක් සඳහා සම-සත්කාරකත්වය දරන ලද අතර, ආර්ථිකයෙහි තත්ත්වය පිළිබඳ ආයතනය විසින් ම ඔඅසඑඑර සාකච්ඡාවක් පවත්වන ලදී. මෙය පර්යේෂකයින්ට ශ්‍රී ලංකාවේ අන්තර්ජාල ප්‍රජාව සමග නියැළීම සඳහා වූ නව්‍ය ක්‍රමයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින්ගෙන් වැඩි දෙනෙකු ක්‍රියාකාරී ඔඅසඑඑර සාමාජිකයන් බවට පත් විය. තවද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජාතික අයවැය මෙම ආයතනයේ පර්යේෂකයින්ගේ අදහස් සහ මූලික ප්‍රතිචාර සන්නිවේදනය කෙරෙන සම්මුඛ සාකච්ඡාවක් ද ඇතුළත් ශදමඔමඉැ සම්මුඛ සාකච්ඡා 11 ක් නිර්මාණය කරන ලදී. මේ ආකාරයට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට එහි ප්‍රමුඛතම පර්යේෂණ සමග විවිධ වූ පාර්ශවකරුවන් පරාසයක් වෙත ප්‍රවේශ වීමට හැකිවී තිබේ.

කාර්ය මණ්ඩලය

චාමේන් විජේසිංහ - කළමනාකරු, ප්‍රකාශන සහ වැඩසටහන්
ෂිහාරා මධුවගේ - කළමණාකරු - සන්නිවේදන සහ උපායමාර්ගික විහිදුම්
අමේෂ් තෙන්නකෝන් - ප්‍රකාශන නිලධාරි
අසුන්තා පෝල් - ලේකම්
නයෝමි ජයකොඩි - ලේකම්
අයෝනි රංගලා - සම්බන්ධීකරණ ලේකම් / මානව සම්පත් සහකාර
ගයේන්ද්‍ර කරුණාරත්න - සංස්කාරක, අර්ධ කාලීන

සහාය සේවා

තොරතුරු පද්ධති

ප්‍රතිපත්තිය අධ්‍යයන ආයතනයෙහි තොරතුරු පද්ධති ඒකකය, මෘදුකාංග, ජාලකරණය, සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය, වෙබ් අඩවි සකස් කිරීම, නඩත්තු කිරීම සහ තොරතුරු ප්‍රචාරණය, දත්ත සංචිත සකස් කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය ආදී සියලු තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. එමගින් එම අංශය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට කලාපීය විශේෂඥ මධ්‍යස්ථානයක් ලෙස තරගකාරීව සිටීමට අවශ්‍ය සහාය සපයා දෙයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු සංනිවේදන තාක්ෂණ අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණ ඇතිව, සම්පූර්ණයෙන්ම නව තත් ප්‍රදේශ ජාලයක් සංකල්පනය කර ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම, සන්නිවේදනය, දුරස්ථ සම්මන්ත්‍රණය සහ සම්බන්ධකතාවය වැඩි දියුණු කරමින් සහ වෙනම ම දුරකතන ජාලයක් සවි කිරීම සඳහා වැය වන පිරිවැය අඩු කරමින් සව දුරකථන සහිත ඒකාබද්ධ ඒකීය සන්නිවේදන ජාලයක් ස්ථාපිත කරන ලදී.

කාර්ය මණ්ඩල සාමාජිකයින් සම්මන්ත්‍රණ ශාලාවෙහි හෝ ශ්‍රවණාගාරයෙහි සිටින විට ඔවුන්ට මෙම දුර දුරකථන ජාලය භාවිතා කිරීමට හැකි වන පරිදි මෙම පහසුකමට ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය සම්මන්ත්‍රණ පහසුකම ද ඒකාබද්ධ කරන ලදී. එමෙන් ම මෙම පහසුකම සඳහා අඛණ්ඩ මාර්ගගත විදුලි සැපයුම සපයා දෙන යන්ත්‍ර දෙකක් මගින් අඛණ්ඩව විදුලිය සැපයුම ලබා දෙයි.

වඩාත් පරිශීලක හිතකාමී අතුරු මුහුණත් සපයා දීම මගින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ ක්‍රියාකාරකම් වලට පුළුල් ප්‍රචාරයක් ලබා දීමේ අරමුණ ඇතිව මෙම නව වෙබ් අඩවිය හිටපු විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා විසින් 2017 අප්‍රේල් මාසයේ දී දියත් කරන ලදී

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු තාක්ෂණ ජාලය එහි පූර්ණ ආයු කාලය ඉක්මවා ආයතනයට සේවය සපයා ඇති බව සැලකිල්ලට ගෙන, 2018 වර්ෂයේ දී එම ජාලය වෙනුවට අලුතින් ජාලයක් ස්ථාපිත කිරීම සඳහා අශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

එමෙන්ම වඩාත් වේගවත් තොරතුරු තාක්ෂණය සපයා දීම පිණිස ආයතනයෙහි දැනට භාවිතා කරනු ලබන පැරණි සේවා පරිගණකක සංස්කරණය ඉවත්කර ඒ වෙනුවට වෙළඳ පොළෙහි පවතින නවතම සංස්කරණයක් ස්ථාපිත කර සේවා පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය ද ආරම්භ කර තිබේ.

කාර්ය මණ්ඩලය

නන්දක පොතුහේවා, තොරතුරු පද්ධති ප්‍රධානී
නාලක ලියනපතිරණ, වෙබ් කළමනාකරු සහ පද්ධති පරිපාලක
රෝහාන් කළුආරච්චි, වෙබ් සැකසුම්කරු සහ ජාල සහයක

සහාය සේවා

පුස්තකාලය

මෙහෙවර:

පුස්තකාලය මගින් ප්‍රතිචාරී දැනුම් සේවා සපයා දෙමින් සහ කාර්ය මණ්ඩලය ගුණාත්මක තොරතුරු මූලාශ්‍ර සමග සම්බන්ධ කරමින් පර්යේෂණ වැඩි දියුණු කිරීම.

දැක්ම:

පුස්තකාලය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා අත්‍යාවශ්‍ය දැනුම් සේවා ලබා ගැනීම සඳහා තෝරා ගනු ලබන කේන්ද්‍රීය ස්ථානය වීම.

දළ විශ්ලේෂණය

පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවෙහිද සඳහන් කර ඇති පරිදි, තොරතුරු අවශ්‍යතාවයන් අනුව මෙන්ම පර්යේෂකයින්ගේ තොරතුරු සෙවීමේ චර්යාවන්ට අනුව, සහ තිබෙන සම්පත්, විශේෂයෙන්ම තිබෙන මානව සම්පත් අනුව පුස්තකාල සේවා ප්‍රතිව්‍යූහගත කිරීම පුස්තකාලයෙහි ප්‍රධාන අවධානය විය.



පුස්තකාල එකතුව සංවර්ධනය කිරීම

දැනට ක්‍රියා ක්‍රියාත්මක කෙරෙමින් පවතින ප්‍රතිව්‍යූහගතකරණ වැඩසටහන් සැලකිල්ලට ගනිමින් පුස්තකාලය දේශීය, කලාපීය සහ අන්තර්ජාතික සංවිධානවල (ශ්‍රී ලංකා මහ බැංකුව, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජාත්‍යන්තර කම්කරු සංවිධානය) ප්‍රධාන ප්‍රකාශනයන්හි විද්‍යුත් සංස්කරණයන් ලබා ගැනීම කෙරෙහි ප්‍රධාන අවධානය යොමු කරන ලද අතර, එහි පොත් සහ පත්‍රිකා එකතුවට සැලකිය යුතු සංඛ්‍යාවක් අලුතින් එකතු කර ගැනීමට ද හැකි විය.

විද්‍යුත් ප්‍රකාශනවලට අමතරව පුස්තකාලයට මුද්‍රිත ප්‍රකාශන

පුස්තකාලයාධිපතිවරයා අගෝස්තු 19 - 25 දින වල පෝලන්තයේ රොක්ලෝ නගරයේ පැවති අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ ලෝක පුස්තකාල සහ තොරතුරු සමුළුවට ද සහභාගී විය.

සහ ලියවිලි විශාල ප්‍රමාණයක් ද හුවමාරු සහ පරිත්‍යාග ආකාරයෙන් ලැබුණි. මේවා පුස්තකාලය විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා අංශික ප්‍රතිපත්තිය පිළිබඳව පවත්වා ගෙන යනු ලබන සුරක්ෂිතාගාරයට ඉතා වටිනා එකතුවීම් විය.

මාර්ගගත පූර්ණ-පාඨ දත්ත සංචිත සඳහා ප්‍රවේශය

2018 වර්ෂයේ දී ද පුස්තකාලය ෂෘෂක/ඔයසබන ඕබන ෂබසඑස්එසඩැ සංවිධානයේ වටිනා සහයෝගය ඇතිව දත්ත සංචිත ණනාවක් සඳහා අඛණ්ඩව ප්‍රවේශය සපයා දුනි. කෙසේ වෙතත් මාර්ගගත පූර්ණ පාඨ දත්ත සංචිත සඳහා ප්‍රවේශය සපයා දීම අදියරෙන් අදියර ඉවත් කිරීමත් සමග ම එය පුස්තකාලයට අති විශාල අභියෝගයක් වනු ඇත. පුස්තකාලයට මුහුණ දීමට සිදු වී තිබෙන අනෙකුත් අභියෝග අතර මෙම අභියෝගයට අපගේ ප්‍රතිව්‍යූහගතකරණ ප්‍රයත්නයන්හි ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

සේවා වැඩි දියුණු කිරීම

දැනට සපයා දෙනු ලබන දැනුවත් කිරීමේ සේවා සහ පරිශීලක අධ්‍යාපනය ක්‍රියාකාරකම් හේතුවෙන් පුස්තකාලයේ අන්තර්ජාලය, ධර්ෂක සහ විද්‍යුත් දත්ත සංචිත පරිහරණය කිරීම සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබේ. 2017 වර්ෂයේ දී පර්යේෂකයින් මුද්‍රිත ප්‍රකාශන ද්‍රව්‍ය 434 ක පමණ ප්‍රමාණයක් බැහැර ගෙන ගොස් තිබෙන අතර එයට අත්පත්‍රිකා, ශාස්ත්‍රය නිබන්ධන, කාර්ය පත්‍රිකා සහ මුද්‍රිත ජර්නල් සහ සඟරා 189 ක් ඇතුළත් විය. එයට අමතරව, පුස්තකාලය අන්තර් පුස්තකාල පිරුළු සේවා සහ ලියවිලි සැපයීමේ ඉල්ලීම් ගණනාවක් සම්බන්ධයෙන් ද කටයුතු කර තිබේ. 2017 දෙසැම්බර් අවසානය වන විට ආයතනයේ පර්යේෂකයින්ගේ



ඉල්ලීම් මත පුස්තකාලය විද්‍යුත් ලියවිලි 351 ට ආසන්න සංඛ්‍යාවක් සපයා දී තිබේ.

පුස්තකාල බෙදාහැරීම්, ලිපිලේඛන සපයාදීම සහ අන්තර් පුස්තකාල පිරුළු සංඛ්‍යාලේඛන - 2017

පුස්තකාලය විසින් ඊමේල් සහ දුරකථන විමසීම් සැලකිය යුතු සංඛ්‍යාවකට ප්‍රතිචාර දක්වන ලද අතර, එයට අමතරව, පුස්තකාලයට පැමිණි දේශීය මෙන්ම අන්තර්ජාතික වෘත්තීයවේදීන් සහ ශිෂ්‍යයින් සඳහා ද එහි සේවා සපයා දෙන ලදී.

පුස්තකාල කමිටුව

නිෂා අරුණතිලක මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් පුස්තකාල කමිටුව සමස්ත පුස්තකාල ප්‍රතිපත්තිය සකස් කිරීමේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පුස්තකාලය තවදුරටත් සංවර්ධනයන කිරීම් පුළුල් මාර්ගෝපදේශ සකස් කිරීමේදී පුස්තකාලයාධිපතිට සහාය දීමේ උපදේශක කාර්යභාරය ඉටු කරයි. විශේෂයෙන්ම මෙම කමිටුව පර්යේෂකයින්ගේ අශ්‍යතා ප්‍රමුඛතාවයන් පුස්තකාලයාධිපතිට දැනුම් දෙන අතර, ආයතනයෙහි සමස්ත අභිමතාර්ථ සන්දර්භය ඇතුළත පුස්තකාලය සඳහා අවශ්‍ය මාර්ග නිර්දේශය සකස් කරයි.

මානව සම්පත්

පෙර වාර්තා මගින් ද පෙන්වා දී ඇති කාර්ය මණ්ඩලය ගැටළු තවමත් එලෙස ම පවතින අතර පුස්තකාල සේවා ප්‍රතිව්‍යූහගත කිරීම හරහා එම ගැටළුවලට ආමන්ත්‍රණය කෙරෙනු ඇත. ප්‍රතිව්‍යුහගතකරණ වැඩ සටහන සකස් කර නිම කෙරෙන තුරු තාවකාලිකව පුහුණු පුස්තකාල සහායකයෙකුගේ සේවය කුලී පදනමින් ලබාගන්නා ලදී.

පෙබරවාරි 20 - 22 දිනවල ඉන්දියාවේ නව නවදිල්ලි නුවර පැවති අන්තර්ජාතික පුස්තකාල සංගම් සහ ආයතන සංවිධානයේ ආසියා සහ ඕසීනියා කලාපීය ස්ථාවර කමිටුවේ මධ්‍ය රැස්වීම සඳහා පුස්තකාලයාධිපතිනිය සහභාගී වූවාය.

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ ශක්තිමත් පුස්තකාල සංගම් ගොඩනැගීමේ වැඩසටහනෙහි ප්‍රතිඵලය ලත් පුහුණුකරුවෙකු වශයෙන් පුස්තකාලයාධිපතිනිය ඉන්දියාවේ නවදිල්ලි නුවර (2017 ඔක්තෝබර් 4-7) සහ නේපාලයේ කත්මණ්ඩු නුවර (2017 දෙසැම්බර් 9-11) පැවති පුහුණු වැඩමුළු දෙකකට සහභාගී වූවාය.

ඉදිරි වර්ෂය සඳහා ප්‍රමුඛතාවයන්

ආයතනයේ නිටපු විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා වෙනුවෙන් විශේෂ පුස්තකතාලයේ විශේෂ එකතුවක් සකස් කිරීම සහ ඔහු විසින් ලියන ලද කෘතිවල ඩිජිටල් පුස්තකාලයක් නිර්මාණය කිරීම 2018 වර්ෂයේ ඉහළම ප්‍රමුඛතාවය වනු ඇත. එම විශේෂ එකතුව ආචාර්ය කැලේගම මහතා ගේ පවුලේ සාමාජිකයින් විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පුස්තකාලය සඳහා කාරුණිකව පරිත්‍යාග කරන ලද ඔහුගේ පෞද්ගලික පුස්තකාලයෙන් ලබා සමහර පොත්පත් යොදා ගනිමින් සකස් කෙරෙනු ඇත. කැලේගම මහතා සහ අනෙකුත් ලේඛකයින් විසින් ආර්ථිකය පිළිබඳව ලියන ලද ග්‍රන්ථ, සඟරා සහ පත්‍රිකා ආදිය මෙම එකතුවට ඇතුළත් වනු ඇත. එමෙන්ම, පුස්තකාල සේවා සහ කාර්ය මණ්ඩලය රාජකාරී ප්‍රතිව්‍යූහගත කිරීම ද 2018 වර්ෂයේ ප්‍රමුඛ කාර්යයක් ව පවතී.

කාර්ය මණ්ඩලය

ප්‍රෙමිලා ගමගේ, පුස්තකාලයාධිපති
විශාකා නර්මදා, පුහුණු පුස්තකාල සහායක

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රකාශන 2017













සීමාවාසික සම්මන්ත්‍රණ - 2017

"බදු ආපාතන සහ රජයේ සංක්‍රාම", නිෂා අරුණතිලක, පර්යේෂණ සාමාජික, සහ ප්‍රියංක ජයවර්ධන, පර්යේෂණ ආර්ථික විද්‍යාඥ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, මාර්තු **27**

"ළමා දරිද්‍රතාවය", විමල් නානායක්කාර, ජ්‍යෙෂ්ඨ බාහිර සාමාජික, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, පෙබරවාරි **28**

"අන්‍යෝන්‍ය ක්ෂුද්‍ර රක්ෂණය", චින්තනි සූරියමුදලි, පර්යේෂණ සහකාර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, අප්‍රේල් **28**

"ශ්‍රී ලංකාවේ පාසල් සම්පත් හා අධ්‍යාපන ප්‍රතිඵල", නිෂා අරුණතිලක, පර්යේෂණ සාමාජික, සහ අෂානි අබයසේකර, පර්යේෂණ නිලධාරි, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජූලි **10** වන දින

"තාක්ෂණය ලබාදීම හා බුද්ධිමය දේපළ අයිතිවාසිකම්: ශ්‍රී ලංකාව තිබෙන ස්ථානය කුමක්ද?", දිලානි හිරිමුතුගොඩගේ, පර්යේෂණ නිලධාරී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, අගෝස්තු 25

"ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය: ප්‍රවණතා, බලපෑම් සහ අභියෝග", යොලන්තිකා ඇල්ලෙපොළ පර්යේෂණ සහකාර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, සැප්තැම්බර් 29 වැනි දින,

"ශ්‍රී ලංකාවට ඊජ + පහමසුකම මගින් ලැබුණු අපනයන ප්‍රතිලාභය සංඛ්‍යාත්මක වශයෙන් කොපමණද?" ජානක විජයසිරි, පර්යේෂණ සාමාජික, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, අගෝස්තු 04 වැනි දින

"නායකත්වය සඳහා ශ්‍රී ලාංකීය ගැහැණු ළමයින්ගේ සහ තරුණියන්ගේ ආර්ථික හා සමාජ සවිබල ගැන්වීම්", සුනිමලී මදුරාවල, පර්යේෂණ ආර්ථිකවිද්‍යාඥ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, නොවැම්බර් 28 වන දින

දේශීය ඉදිරිපත් කිරීම්

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ මොනෑෂ් විශ්වවිද්‍යාලය ඒකාබද්ධව සංවිධානය කරන ලද "දකුණු ආසියාවේ මානව ප්‍රාග ්ධනය, ආහාර සුරක්ෂිතතාවය සහ ආර්ථික සංවර්ධනය" නැමැති තේමාව යටතේ පවත්වන ලද සමුළුවෙහි දී "දකුණු ආසියාවේ සංවර්ධන අභියෝග" නැමැති සැසියෙහි මුලසුන දැරීම. ගලදාරි හෝටලය, ජනවාරි (සමන් කැලේගම විසිනි).

- දකුණු ආසියාවේ නෝර්වේජියානු තානාපතිවරුන්ගේ හමුවෙහිදී "කලාපීය දේශපාලන ආර්ථිකය: ශ්‍රී ලාංකීය දෘෂ්ටි කෝණය" නමැති මාතෘකාව යටතේ සිදු කරන ලද දේශනය. ගෝල් ෆෙස් හෝටලය, ජනවාරි 30 (සමන් කැලේගම විසිනි)

- ජේ.ඊ. ජයසූරිය අනුස්මරණ පදනම විසින් සංවිධානයය කරන ලද "ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයෙහි රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්: ගැටළු සහ අභියෝග" යන මාතෘකාව යටතේ පවත්වන ලද විසි හත් වැනි ජේ.ඊ. ජයසූරිය අනුස්මරණ සිදු කරන ලද දේශනය. ශ්‍රී ලංකා පදනම් ආයතනය, පෙබරවාරි 13. (සමන් කැලේගම විසිනි)

- "ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි වර්තමාන තත්වය" නමැති මාතෘකාව යටතේ සිදු කරන ලද දේශනයක්. යන්ග් ජේසීස් ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකා පදනම් ආයතනය, මාර්තු 25 (සමන් කැලේගම විසිනි)

- යුරෝපා සංගමයේ ආර්ථික උපදේශකවරුන්ගේ රැස්වීමෙහිදී "ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තිය සහ ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික වාතාවරණය පිළිබඳව දළ විශ්ලේෂණයක්" නමැති මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, යුරෝපා සංගම් නියෝජිත පිරිස, මාර්තු 02. (සමන් කැලේගම විසිනි)

- "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය" නැමති වාර්තාව එළි දැක්වීමේ අවස්ථාවෙහිදී "ආර්ථිකයේ තත්වය 2017: ආර්ථික දර්ශනය" නමැති මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම. ආචාර්ය සමන් කැලේගම ශ්‍රවණාගාරය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 10 (වීරකෝන් විසිනි)

- ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය විසින් සංවිධානයය කරන ලද "2020 දී බිම්ස්ටෙක්: අනාගතය සඳහා ප්‍රමුඛතාවයන්" නැමැති තේමාව යටතේ පවත්වන ලද වැඩසටහනෙහි විද්වත් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, ලක්ෂ්මන් කදිරගාමර් ආයතන ශ්‍රවණාගාරය, දෙසැම්බර් 8 (දුෂ්නි වීරකෝන් විසිනි)

- ලෝක ආහාර වැඩසටහන විසින් සංවිධානය කරන ලද රජයේ නායකයින්ගේ රැස්වීමෙහිදී "ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය පිළිබඳ ජාතික උපායමාර්ගික සමාලෝචන" කෙටුම්පත පිළිබඳ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, ජනාධිපති ලේකම් කාර්යාලය, ජනවාරි 17. (මනෝජ් තිබ්බෙටුවාව විසිනි)

- "ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් සඳහා දේශගුණික

රක්ෂණය" තැමැති මාතෘකාව යටතේ පවත්වන ලද වැඩමුළුවෙහි සාකච්ඡාවන් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරය, ජනවාරි 24 (මනෝජ් තිබ්බොටුවාව විසිනි)

- "ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් සඳහා දේශගුණ රක්ෂණය" නැමැති තේමාව යටතේ පවත්වන ලද වැඩමුළුවෙහි දී "ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් සඳහා දේශගුණ රක්ෂණය" නමැති මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයන්ය මගින් සොයා ගත් ප්‍රධාන කරුණු සහ ප්‍රතිපත්ති ගම්‍යමානයන් ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරය, ජනවාරි 24 (කාංචනා වික්‍රමසිංහ විසිනි)

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයේදී පැවති අවසන් උපදේශක කමිටු රැස්වීමෙහිදී "කුරුඳු කර්මාන්තයේ අගය දාම විශ්ලේෂණය" මගින් සොයාගත් කරුණු පිළිබඳ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, මාර්තු 07 (දිලානි හිරිමුතුගොඩගේ විසිනි)

- "කුරුඳු, ගම්මිරිස් සහ කරදමුංගු යන ක්ෂේත්‍රවල අගය දාම අධ්‍යයනය" පිළිබඳව පවත්වන ලද ජාතික ප්‍රචාරණ වැඩමුළුවෙහි දී "ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ අගය දාමය පිළිබඳ විශ්ලේෂණය" නමැති මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරය, මාර්තු 20, (දිලානි හිරිමුතුගොඩ විසිනි)

- "කුරුඳු, ගම්මිරිස් සහ කරදමුංගු යන ක්ෂේත්‍රවල අගය දාම අධ්‍යයනය" පිළිබඳව පවත්වන ලද ජාතික ප්‍රචාරණ වැඩමුළුවෙහි දී "ශ්‍රී ලංකාවේ කරඳමුංගු කර්මාන්තයේ අගය දාමය" පිළිබඳ විශ්ලේෂණය" නමැති මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරය, මාර්තු 20, (දිලානි හිරිමුතුගොඩ විසිනි)

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සංවිධානය කරන ලද "සාම්ප්‍රදායික දැනුම සහ සංස්කෘතික ප්‍රකාශ කිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත" පිළිබඳ සාකච්ඡාවෙහි විද්වත් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, මිලෝදා මූල්‍ය අධ්‍යයන විද්‍යාපීඨයෙහි චර්චිල් චර්චුවල් රූම්, අප්‍රේල් 07 (දිලානි හිරිමුතුගොඩගේ විසිනි)

දේශීය ඉදිරිපත් කිරීම්

- සබරගමුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද සබරගමුව විශ්ව විද්‍යාලයේ හය වැනි අන්තර්ජාතික සමුළුවෙහිදී "ශ්‍රී ලංකාවේ පරිසර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේදී බුද්ධිමය දේපළ අයිතිවාසිකම් වල කාර්ය භාරය" නමැති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, ග්‍රෑන්ඩ් කැන්ඩියන් හෝටලය, මැයි 03 - 05, (දිලානි හිරිමුතුගොඩගේ විසිනි)

- "හරිත ගිණුම්කරණය" පිළිබඳ ජාතික වැඩමුළුවෙහිදී "ශ්‍රී ලංකාව තුළ හරිත ගිණුම්කරණය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික නිර්දේශ" නමැති මාතෘකාව යටතේ පැවති සැසියෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව, අගෝස්තු 17 (කාංචනා වික්‍රමසිංහ විසිනි)

- ලෝක බැංකුව සමඟ එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ ආර්ථික කළමනාකරණයෙහි පාරිසරික ප්‍රතිලාභ" නැමති මාතෘකාව යටතේ පැවති සංවාදයෙහි විද්වත් මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කිරීම, අගෝස්තු 21 (කාංචනා වික්‍රමසිංහ විසිනි)

- "නීල ආර්ථිකය සහ ශ්‍රී ලංකාවට එයින් ප්‍රතිලාභ ලැබිය හැකි ආකාරය" නැමති ඊසී‍ඒ සෑඩසැඅ 360 (එඔඩ හැඒඒ) රූපවාහිනී වැඩසටහන් විශේෂාංගය, ජූනි 16 (අතුල සේනාරත්න විසිනි)

- "ඉඩම් සෞඛ්‍යය යනු ජාතික ධනය වේ" යන මාතෘකාව යටතේ පැවති විශේෂඥ වැඩමුළුවෙහි දී "ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි දී මුණ දීමට සිදුවන අභියෝග" නැමති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, ආචාර්ය සමන් කැලේගම ශ්‍රවණාගාරය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 11 - 13 (මනෝජ් තිබ්බොටුවාව විසිනි)

- ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ 2017 වාර්ෂික සැසියෙහිදී "කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පවතින ආහාර සුරක්ෂිතතා ගැටළු" යන මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය, රාජගිරිය, ඔක්තෝබර් 28 (මනෝජ් තිබ්බොටුවාව විසිනි)

- ඔඩ1 රූපවාහිනී නාලිකාව (කලින් තිබූ එඔඩී වදරවී නාලිකාව) මගින් විකාශය කරන ලද ඊසී‍ඒ සෑඩසැඅ 360 වැඩසටහනෙහිදී "නීල හරිත අය වැයෙහි දේශගුණික ප්‍රතිවර්තන අංග" නැමැති මාතෘකාව යටතේ පවත්වන ලද රූපවාහිනී සම්මුඛ සාකච්ඡාව, දෙසැම්බර් 01 (කාංචනා වික්‍රමසිංහ විසිනි)

- ශ්‍රී ලංකා පරිසර වෘත්තියවේදීන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ නීල හරිත අයවැය 2018: පාරිසරික දෘෂ්ටිකෝණයෙන් එහි යථාර්ථය" නැමැති මාතෘකාව යටතේ පවත්වන ලද සාකච්ඡාවෙහි විද්වත් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ශ්‍රවණාගාරය, දෙසැම්බර් 14 (කාංචනා වික්‍රමසිංහ විසිනි)

- කාන්තාවන්ගේ පර්යේෂණ සඳහා වන කේන්ද්‍රය, නෙට්වෝර්ක්, ශ්‍රී ලංකා ජල හවුල්කාරිත්වය, සහ කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව විසින් සංවිධානය කරන ලද "තිරසර සංවර්ධන ඉලක්කවලට සහ පරිසර විපර්යාස අභියෝග වලට මුහුණ දීම: කාන්තා වෘත්තීයවේදීන් සඳහා වන වටමේස සාකච්ඡාව" නැමති වැඩසටහනෙහිදී "දේශගුණික විපර්යාස, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගැටලු සහ තිරසර සංවර්ධන ඉලක්ක" නැමති මාතෘකාව යටතේ සිදු කළ මුඛ්‍ය දේශනය, කාන්තාවන්ගේ පර්යේෂණ සඳහා වන මධ්‍යස්ථානය, කොළඹ, දෙසැම්බර් 22 (කාංචනා වික්‍රමසිංහ විසිනි)

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවර්ධන ආර්ථික විද්‍යාව සහ තිරසරභාවය පිළිබඳ මධ්‍යස්ථානය, දකුණු ආසියානු පර්යේෂණ ජාලය සහ ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලය සමඟ එක්ව සංවිධානය කරන ලද "දකුණු ආසියාවේ මානව ප්‍රාග්ධනය, ආහාර සුරක්ෂිතතාවය සහ සංවර්ධනය" පිළිබඳ සමුළුවෙහිදී "දැනුම් පදනම් කරගත් ආර්ථිකයක් සඳහා අධ්‍යාපනය" නැමැති මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, ඇන්තූරියම් රූම්, ගලදාරි හෝටලය, කොළඹ, ජනවාරි 11 - 12, (නිෂා අරුණතිලක විසිනි)

- "කාර්ය සම්පාදනයෙහිදී සහ ප්‍රවාහනයේදී කාන්තාවෝ" සංවිධානය විසින් සංවිධානය කළ හතර වැනි සංවත්සරික බුද්ධි මණ්ඩල සාකච්ඡාවේදී "ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය වැඩි දියුණු වීම සම්බන්ධ ගැටළු" නැමති මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, කිංස්බරි හෝටලය, මාර්තු 20, (නිෂා අරුණතිලක විසිනි)

- "ශ්‍රී ලංකා ජනගහන සංගමයේ වාර්ෂික සැසි සහ වාර්ෂික මහා සභා රැස්වීම" අවස්ථාවෙහිදී "වයස්ගත සේවකයින් විවිධ ජීවනෝපාය වලට සහභාගී වීම තෝරාගන්නේ මන්ද?" යන මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, ආර්ථික විද්‍යා ශ්‍රවණාගාරය, කොළඹ විශ්වවිද්‍යාලය, (සමන්ති බණ්ඩාර විසිනි)

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජීවන වැටුප පිළිබඳ ගෝලීය සන්ධානය සහ ෆෙයා ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ වතු අංශයේ ජීවන වැටුප: එය ප්‍රමාණවත් ද?" යන තේමාව යටතේ පවත්වන ලද සම්මන්ත්‍රණයෙහිදී "ශ්‍රී ලංකාවේ ජීවන වැටුප: වතු අංශය (තේ)" යන මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ශ්‍රවණාගාරය, අගෝස්තු 24 (මනෝජ් තිබ්බොටුවාව විසිනි)

දේශීය ඉදිරිපත් කිරීම්

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජීවන වැටුප පිළිබඳ ගෝලීය සන්ධානය සහ ෆෙයා ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් විසින් සංවිධානය කරන ලද පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවෙහිදී "වතු අංශය සඳහා ජීවන වැටුප පිළිබඳ අධ්‍යයනය" යන මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ශ්‍රවණාගාරය, අගෝස්තු 24 (ප්‍රියංකා ජයවර්ධන විසිනි)

- මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුවේ හි දී පවත්වන ලද "ශ්‍රී ලංකාවේ ජනතාව තාවකාලික ස්වරූපයේ රැකියා වලට සහභාගි වීම තෝරා ගන්නේ මන්ද?" යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනය මගින් සොයා ගත් කරුණු පිළිබඳ ඉදිරිපත් කිරීම, සැප්තැම්බර් 12, (ප්‍රියංකා ජයවර්ධන විසිනි)

- ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා විසින් සංවිධානය කරන ලද, "2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ දී ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සමාලෝචනය කිරීම සහ ප්‍රමුඛතාවය ලබා දීම" නැමති මාතෘකාව යටතේ සිදුකරන ලද අධ්‍යයනය මගින් සොයාගත් ප්‍රධාන කරුණු ප්‍රචාරණය කිරීම සඳහා "නායකත්වය සඳහා ශ්‍රී ලංකාවේ ගැහැණු ළමයින් සහ තරුණියන් ආර්ථික සහ සමාජමය වශයෙන් සවි බල ගැන්වීම" නැමැති වැඩසටහන දිය කිරීමේ අවස්ථාවෙහි දී සහ ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා අධ්‍යයනය විසින් අන්තර්ජාතික ගැහැණු ළමයින්ගේ දිනය සැමරීම සඳහා සංවිධානය කරන ලද මාධ්‍ය දැනුම්වත් කිරීමේ වැඩ වැඩසටහනෙහි දී "නායකත්වය සඳහා ශ්‍රී ලංකාවේ ගැහැණු ළමයින් සහ තරුණියන් ආර්ථික සහ සමාජමය වශයෙන් සවි බල ගැන්වීම ඇගයීම" පිළිබඳව සිදු කරන ලද ඉදිරිපත් කිරීම, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, ඔක්තෝබර් 10, (සුනිමලී මදුරාවල විසිනි)

- "ඇඩ්වොකාටා ආර්ථික නිදහස සමුළුව" අවස්ථාවෙහිදී "ශ්‍රම වෙළඳ පොළ ප්‍රතිසංස්කරණ" නැමැති මාතෘකාව යටතේ පැවති සැසියෙහි මූලසුන දැරීම, ග්ලෝබල් ටවර්ස් හෝටලය, කොළඹ, ඔක්තෝබර් 12 (නිෂා අරුණතිලක විසිනි)

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ අ.පොෂ.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ වඩා ඉහළ ප්‍රතිඵල සඳහා වඩා හොඳ පාසල්" නැමැති ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන අධ්‍යයනය මගින් සොයා ගත් කරුණු ප්‍රචාරණය කිරීම සඳහා පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාව "නිෂා අරුණතිලක සහ අශානි අබයසේකර විසිනි"

- Art TV රූපවාහිනී නාලිකාව මගින් විකාශය කරන ලද "ව්‍යාපාර පිළිබඳ තත්ත්වය" නැමැති වැඩසටහනෙහි දී "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2017" නැමති මාතෘකාව යටතේ පැවති රූපවාහිනී සාකච්ඡාවට සහභාගී වීම, නොවැම්බර් 28 (නිෂා අරුණතිලක විසිනි)



- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානයය කරන ලද "2017 වර්ෂයේ ආකුල තත්ත්වයන් තුළින් ජයග්‍රහණය: ආර්ථික දැක්ම සහ ව්‍යාපාර සඳහා ගම්‍යමාන" නැමති සම්මන්ත්‍රණයෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහභාගී වීම, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩල ශ්‍රවණාගාරය, ජනවාරි 26 (දුෂ්නි වීරකෝන් විසිනි)

- සී.ඒ. ශ්‍රී ලංකා ව්‍යාපාර පාසල විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාව: ආර්ථික දර්ශනය 2017/18" නමැති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, සී.ඒ. ලංකා ශ්‍රවණාගාරය, කොළඹ (දුෂ්නි වීරකෝන් විසිනි)

- ලෝක බැංකුව විසින් සංවිධානය කරන ලද "දරිද්‍රතා අධ්‍යාපනය සඳහා සාක්ෂි පදනම් කර ගත් ප්‍රතිපත්ති" නැමැති වැඩසටහනේදී "රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ව්‍යාප්ති බලපෑම" යන මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, මැයි 8 (ප්‍රියංකා ජයවර්ධන විසිනි)

- කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණපති උපාධිධාරීන්ගේ සංගමය සහ ඩේලි පුවත්පත ඒකාබද්ධව සංවිධානය කරන ලද වාර්ෂික කළමනාකරණ සමුළුවෙහිදී " ඨරදඅසබට එයැ ඨස්බවී" නමැති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, ජූනි 13 (ජනක විජයසිරි විසිනි)

- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානයය කරන ලද "ශ්‍රී ලංකා ආර්ථික සමුළුව 2017" අවස්ථාවෙහිදී "ආකුල තත්ත්වයන් අතරතුර වඩාත් ඵලදායී වෙළඳ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම" නැමති මාතෘකාව යටතේ පැවති සැසියෙහි විද්වත් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය කොළඹ, ජූලි 25 (දුෂ්නි වීරකෝන් විසිනි)

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි හා ආසියානු සංවර්ධන බැංකුවෙහි සම සංවිධානයෙන් පවත්වන ලද "ආසියානු සංවර්ධන බැංකු - ආසියානු බුද්ධි මණ්ඩල සංවර්ධන සංසදය"

දේශීය ඉදිරිපත් කිරීම්

අවස්ථාවෙහිදී "ශ්‍රී ලංකාවේ ආර්ථික දර්ශනය" නැමති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, කොළඹ, සැප්තැම්බර් 20 - 21 (කිත්මින හේවගේ විසිනි)

- "UNESCAP හැකියා සංවර්ධන වැඩසටහන" අවස්ථාවේදී " වෙළෙඳ ප්‍රතිපත්ති විශ්ලේෂණය" නැමති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, මිලේදා මූල්‍ය අධ්‍යාපන විද්‍යාපීඨය, කොළඹ, සැප්තැම්බර් 22 (ජනක විජයසිරි විසිනි)

- TV1 රූපවාහිනී නාලිකාවේ Biz 1st Roundup වැඩසටහනෙහි පෙනී සිටීම, සැප්තැම්බර් 29 (කිත්මින හේවගේ විසිනි)

- ශ්‍රී ලංකාව සහ ජී.එස්.පී. ප්ලස් පහසුකම: තිරසර සැපයුම් දාම සහතික කිරීම" නැමති මාතෘකාව යටතේ පැවති ජාතික සංසදයෙහිදී "ආර්ථිකයෙහි ප්‍රධාන අංශ කෙරෙහි ජී.එස්.පී. ප්ලස් පහසුකමෙහි බලපෑම: මූලික ඇස්තමේන්තු කිහිපයක්" නැමති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, ජෂක හිල්ටන්, කොළඹ, ඔක්තෝබර් 2 (ජනක විජයසිරි විසිනි)

- විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද අබු ඩාබි නිව්යෝක් විශ්වවිද්‍යාලයෙහි පවත්ත්වන ලද වැඩසටහන් ක්‍රියාකාරී කමිටු රැස්වීමෙහිදී "තාවකාලික සංක්‍රමණික සේවකයින් බඳවා ගැනීම සහ ශ්‍රී ලංකාවේ උප-නියෝජිතයන්ගේ නැගී එන කාර්ය භාරය" නැමති මාතෘකාව යටතේ පවත්වන ලද ඉදිරිපත් කිරීම, විදේශ රැකියා අමාත්‍යාංශය, මාර්තු 31 (බිලේෂා වීරරත්න විසිනි)

- සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කර්මාන්තයේ බඳවා ගැනීමේ අතරමැදියන්" නැමති මාතෘකාව යටතේ සිදු කළ ඉදිරිපත් කිරීම. සංක්‍රමණය පිලිබඳ අන්තර්ජාතික සංවිධානය, කොළඹ, ජූලි 6 (බිලේෂා වීරරත්න විසිනි)

- ඇමරිකන් ඉන්ස්ටිට්‍යුට් ඔෆ් ලංකන් ස්ටඩීස් විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ පවුල්, ඥාතීන් සහ රාජ්‍යය" නමැති මාතෘකාව යටතේ පවත්වන ලද පර්යේෂණ වැඩමුළුවෙහිදී " පවුල ගෝලීයකරණය වීම: රාජ්‍යයෙහි කාර්ය භාරය" නමැති මාතෘකාව යටතේ සිදුකරන ලද ඉදිරිපත් කිරීම, කොළඹ, ජූලි 24 - 25 (බිලේෂා වීරරත්න විසිනි)

- සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානය සහ විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සංවිධානයය කරන ලද "රාජ්‍ය නිල නිලධාරීන් සඳහා සංක්‍රමණය පිලිබඳ ගෝලීය ගිවිසුම සංවේදීකරණ වැඩමුළුව" සහ "රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන් සඳහා සංක්‍රමණය පිලිබඳ ගෝලීය ගිවිසුම සංවේදීකරණ වැඩමුළුව" අවස්ථාවලදී "සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම: ශ්‍රී ලංකාව සඳහා ඉදිරි මග" යන මාතෘකාව

යටතේ පවත්වන ලද ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන අධ්‍යයන ආයතනය, අගෝස්තු 08 (බිලේෂා වීරරත්න විසිනි)

- "සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් සංක්‍රමණය පිළිබඳ ගෝලීය ගිවිසුම" පිළිබඳ ජාතික බහුපාර්ශ්වික අදහස් විමසීමේ වැඩසටහනෙහිදී "පාර්ශවකරුවන්ගේ අදහස් පිළිබඳ සාරාංශය" නමැති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම", මූවන්පික් හෝටලය, අගෝස්තු 25 (බිලේෂා වීරරත්න විසිනි)

- ඔඩ1 රූපවාහිනී නාලිකාව මගින් "ජ්ජැ එයැ හ්එසදබ" නැමති මාතෘකාව යටතේ විකාශනය කරන ලද රූපවාහිනී වැඩසටහනෙහි පෙනී සිටීම, සැප්තැම්බර් 4 (බිලේෂා වීරරත්න විසිනි)

- ශ්‍රී ලංකාවේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් සංවිධානයය කරන ලද, "සංක්‍රමණයෙහි අනා අනාගතය වෙනස් කිරීම: ආහාර සුරක්ෂිතතාවය සහ ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි ආයෝජනය කිරීම" නැමති මාතෘකාව යටතේ පැවති ලෝක ආහාර දින විද්වත් මණ්ඩල සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, කිංස්බරි හෝටලය, කොළඹ, ඔක්තෝබර් 17 (බිලේෂා වීරරත්න විසිනි)

- "ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය ක්ෂුද්‍ර රක්ෂණය සඳහා තිබෙන ඉල්ලුම" පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සීමාවාසික සම්මන්ත්‍රණය පැවැත්වීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, අප්‍රේල් 28 (චින්තනී සූරියමුදලි විසිනි)

- "සහශ්‍ර සංවර්ධන ඉලක්ක සහ තිරසර සංවර්ධන ඉලක්ක" පිළිබඳ ආරාධිත දේශනය, සනස එඩ්‍යුකේෂන් කැම්පස් ලිමිටඩ්, අගෝස්තු 14 (ගංගා තිලකරත්න විසිනි)

- තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශයෙහි තිරසර සංවර්ධන ඉලක්ක උපදේශක කමිටුව සඳහා "තිරසර සංවර්ධනය ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියෙහි පාර්ශවකරුවන්ගේ කාර්යභාරය සහ වගකීම්" නැමැති පත්‍රිකා කෙටුම්පත් ඉදිරිපත් කිරීම, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය ශ්‍රවණාගාරය, ඔක්තෝබර් 27 (ගංගා තිලකරත්න විසිනි)

විදේශ රටවලදී සිදු කළ ඉදිරිපත් කිරීම්

"තිරසාර සංවර්ධනය ඉලක්ක: පොරොන්දුව ඵලෙසම පවත්වා ගැනීම" පිළිබඳ ඉදිරිපත් කිරීම, සහ විසි වැනි තිරසර සංවර්ධන සමුළුවේ "ස්වාධීන බුද්ධි මණ්ඩල: හැකිලෙමින් තිබෙන අවකාශවල අභියෝග" පිළිබඳ සැසිවාරයේ සාකච්ඡා මණ්ඩල සාමාජික, සංවිධානය: තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනයේ, ඉස්ලාමාබාද්, පාකිස්තානය, දෙසැම්බර් 5,
(සමන්ති බණ්ඩාර විසිනි)

"දේශගුණික විපර්යාස පිළිබඳ කලාපීය සහයෝගීතාව" පිළිබඳ සැසිවාරයෙහි සාකච්ඡා මණ්ඩල සාමාජික, "10 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව", කත්මණ්ඩු, නේපාලය, නොවැම්බර් 14 - 16
(මනෝජ් තිබ්බොටුවාව විසිනි)

"සංක්‍රමණික සේවකයින් සඳහා බඳවා ගැනීමේ දිර ගැන්වීම් ගිවිස ගැනීම පිළිබඳ බඳවා ගැනීමේ අතරමැදියන්ගේ අවධිමත් තත්වයෙහි ප්‍රතිඵලය" පිළිබඳ ඉදිරිපත් කිරීම, නිව්යෝක් රාජ්‍ය ආර්ථික සංගමයේ වාර්ෂික සමුළුව, ෆාමිංග්ඩේල් කොලෙජ්, නිව් යෝර්ක්, ඔක්තෝබර් 6 - 7
(බෙලීෂා විරරත්න විසිනි)

"ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය සඳහා ප්‍රතිලාභ සහිතව තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ මට්ටමේ දේශපාලන කැපවීම පිළිබඳ උදාහරණයක්" පිළිබඳ ඉදිරිපත් කිරීම, "තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන සහයෝගය කඩිනම් කිරීම පිළිබඳ සමුළුව", සැන්ටියාගෝ, චිලී, ජූලි 25 - 27
(යොලන්තිකා ඇල්ලේපොළ විසිනි)

"තාවකාලික සංක්‍රමණික සේවකයන් බඳවා ගැනීම හා ශ්‍රී ලංකාවේ උප නියෝජිතයින්ගේ වර්ධනය වෙමින් පවතින කාර්යභාරය" පිළිබඳ ඉදිරිපත් කිරීම, 1 වැනි REALM වාර්ෂික වැඩමුළුව, සංවිධානය: අබුඩාබි නිව්යෝර්ක් විශ්වවිද්‍යාලය, අබුඩාබි, මාර්තු 12 - 13, (බෙලීෂා විරරත්න)

"තිරසාර ඉලක්ක ක්‍රියාත්මක කිරීම පිළිබඳ දකුණු හා නිරිත දිග ආසියානු සංසදය" සාකච්ඡා මණ්ඩල සාමාජික, සංවිධානය: එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ESCAP වැඩසටහන, කත්මණ්ඩු, නේපාලය, නොවැම්බර් 1- 2
(ගංගා තිලකරත්න විසිනි)

"දකුණු ආසියානු කලාපයේ තිරසර සංවර්ධන ඉලක්ක සහ අන්තරකරණ වර්ධනය" පිළිබඳ සැසිවාරයේ සාකච්ඡා මණ්ඩල සාමාජික, 10 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව, සම සංවිධානය: වෙළඳ, ආර්ථික හා පරිසරය පිළිබඳ දකුණු ආසියානු සුපරීක්ෂණය, නේපාලය; ප්‍රතිපත්ති සංවාද සඳහා වන මධ්‍යස්ථානය, බංගලාදේශය; සංවර්ධනය වන රටවල් සඳහා වන පර්යේෂණ හා තොරතුරු පද්ධතිය, ඉන්දියාව; තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනය, පකිස්තානය; සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කත්මණ්ඩු,නේපාලය, නොවැම්බර් 14 - 16
(ගංගා තිලකරත්න විසිනි)

"සමාජ අන්තර්කරණය සඳහා වර්ධනය කළමනාකරණය කිරීම" පිළිබඳ සමුළුවෙහි අන්තරකරණය කළ වර්ධනය පිළිබඳ සැසියේ සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, BRAC Centre Inn ශ්‍රවණාගාරය, මොහබාලි, ඩකා, බංග්ලාදේශය, පෙබරවාරි 18 - 19 (සමන් කැලේගම විසිනි)



"දකුණු ආසියාවේ සේවා නියුක්ති අභියෝගවලට මුහුණ දීම" නැමති වැඩසටහනෙහි විද්වත් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම සහ "අවිධිමත්භාවය හා ශ්‍රම වෙළඳපොළ" පිළිබඳ සැසියේ දී සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහභාගී වීම, ශ්‍රම ආර්ථික විද්‍යාව පිළිබඳ ඉන්දියානු සංගමයේ 59 වැනි වාර්ෂික සම්මේලනය, සංවිධානය: RIS" SACEP සහ IHD, කේරල, ඉන්දියාව, දෙසැම්බර් 16 - 18
(ගංගා තිලකරත්න විසිනි)

"පළමු වැනි ඉන්දියා - පොදු රාජ්‍ය මණ්ඩල සු.ම.ක. වෙළඳ සමුළුව" නැමති සමුළුවෙහිදී පොදු රාජ්‍ය මණ්ඩල අභ්‍යන්තර වෙළඳාම සඳහා ඇති අවස්ථා පිළිබඳ ඉහළ මට්ටමේ විද්වත් මණ්ඩලයේදී, "පොදු රාජ්‍ය මණ්ඩල අභ්‍යන්තර වෙළඳාම සඳහා ඇති අවස්ථා" පිළිබඳ ඉදිරිපත් කිරීම, නවදිල්ලිය, ඉන්දියාව, මැයි 30 - මැයි 31
(සමන් කැලේගම විසිනි)

"ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් සඳහා ආදායම් සුරක්ෂිතභාවය" පිළිබඳ ඉදිරිපත් කිරීම, "දකුණු ආසියාවේ වැඩිහිටි වයසේදී ආදායම් සුරක්ෂිතභාවය සහ විශ්ව මූලික ආදායම" පිළිබඳ සම්මන්ත්‍රණය, සංවිධානය: ආසියා සහ පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම, නව දිල්ලිය, ඉන්දියාව, පෙබරවාරි 27
(ගංගා තිලකරත්න විසිනි)

"ආසියා පැසිෆික් කලාපයේ තිරසර සංවර්ධනය වැඩි දියුණු කිරීම උදෙසා කලාපීය ආර්ථික සහයෝගිතාව සහ ඒකාබද්ධතාවය" පිළිබඳ ඉහළ මට්ටමේ සංවාදයක සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටුතු කිරීම, සංවිධානය කිරීම: එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ESCAP, බැංකොක්, තායිලන්තය, අප්‍රේල් 20 - 21 (සමන් කැලේගම විසිනි)

"වරණීය වෙළඳ ගිවිසුම් හා අන්තර්කරණ වෙළඳාම අතර සබඳතා හඳුනා ගැනීම: ලියවිලි නැවත සංශෝධනය කිරීම" පිළිබඳ සැසිවාරයෙහි මුලසුන දැරීම, "අන්තර්කරණ හා සමපාර්ශ්වීය වෙළඳාම සඳහා වරණීය වෙළඳ ගිවිසුම්වල දායකත්වය වැඩිදියුණු කිරීම" පිළිබඳ කලාපීය සංවාදය, UN-ESCAP, බැංකොක්, තායිලන්තය, ජූනි 21 - 22 (සමන් කැලේගම විසිනි)

"ලෝක වෙළඳ සංවිධානයේ 11 වැනි අමාත්‍ය සමුළුව උදෙසා: සංවර්ධන න්‍යාය පත්‍රය පිළිසැකැස්ම" පිළිබඳ ඩකා අපක්‍රමණය සහ ප්‍රසිද්ධ සංවාදය, "ධීවර සහනාධාර" පිළිබඳ ඉදිරිපත් කිරීම, සංවිධානය: පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය; Friedrich-Ebert-Stiftung, ඩකා; තින්ක් ටෑන්ක් ඉනිෂටිව්; සහ LDC IV Monitor, සමග එක්ව ප්‍රතිපත්ති සංවාද සඳහා වන මධ්‍යස්ථානය, ඩකා, බංග්ලාදේශය, නොවැම්බර් 29 - 30.
(මනෝජ් තිබ්බොටුවාව විසිනි)

"එක මාවතක් - එක තීරයක් වැඩසටහන සඳහා රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් ගොඩ නැගීම" පිළිබඳ වැඩමුළුවෙහිදී "එක මාවතක් - එක තීරයක් ක්‍රියාමාර්ගය සඳහා බුද්ධි මණ්ඩලවල කාර්යභාරය" පිළිබඳ දේශණය, බෙයිජිං, ජූනි 9. (ගංගා තිලකරත්න විසිනි)

"ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රතිපත්තිය හා සංවර්ධනය" පිළිබඳ ඉදිරිපත් කිරීම, "ට්‍රාන්ස් හිමාලයන් සංවර්ධන සංසදය", සංවිධානය: සමකාලීන ජාත්‍යන්තර සබඳතා පිළිබඳ චීන ආයතන, මංගෂි, චීනය, ජූලි 9 - 12
(කිත්මිණ හේවගේ විසිනි)

"ආර්ථිකයේ වර්තමාන තත්ත්වය සහ උද්ධමනය, අනුපාතික, වෙළඳාම, මුදල් හා මූල්‍ය පද්ධති පිළිබඳ දැක්ම" පිළිබඳ සැසිවාරයෙහි සාකච්ඡා මණ්ඩල සාමාජික, Finance Asia විසින් සංවිධානය කරන ලද දෙවැනි ශ්‍රී ලංකා ආයෝජන සමුළුව, කාල්ටන් හෝටලය, හොංකොං, මාර්තු 16 - 17,
(සමන් කැලේගම විසිනි).

පර්යේෂණාවලින් ඔබ්බට

දෙසැම්බර් මාසයේ පැවති ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික විනෝද චාරිකාව - කළුතර අවානි හෝටලය

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2017 (රු)	2016 පුනප්‍රකාශිත (රු)
ආදායම			
ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන	2	13,750,000	15,000,000
ආයෝජන භාර අරමුදල මගින් ලැබුණු දායකත්වය	23		23,000,000
ඉඩම් සඳහා රජයේ මූල්‍ය නොවන දායකත්වය	14		151,320,000
ව්‍යාපෘති ආදායම්	3	53,236,038	25,027,771
අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ			
මධ්‍යස්ථානයෙන් ලැබුණු ආදායම, ටී.ටී.අයි. ප්‍රදාන	4	25,986,931	24,065,393
සම්මන්ත්‍රණ/වැඩමුළු ආදියෙන් ලැබුණු ආදායම	5	3,760,013	908,104
පොළී ආදායම්		36,017,937	27,061,179
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය වීමෙන් ලැබුණු ආදායම	20	8,580,945	9,364,140
ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම		1,737,581	859,346
විවිධ ආදායම්	6	679,086	1,936,994
බැහැර කිරීම් මත ලැබුණු ලාභය		41,000	
විනිමය ලාභ		240,927	
සමස්ත ආදායම		144,030,508	278,552,927
වියදම්			
සේවක පිරිවැය	7	62,440,591	59,107,356
දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය	14	11,827,882	18,241,514
පර්යේෂණ පිරිවැය	8	26,944,861	13,605,136
සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිරිවැය		1,207,272	665,840
උපයෝගිතා වියදම්		16,255,686	18,109,225
ගමන් වියදම්		457,437	463,122
වෙනත් මෙහෙයුම් වියදම්	9	9,485,173	13,612,477
ශ්‍රවණාගාරය කුලියට දීම		727,825	325,239
හුවමාරු පාඩු			220,237
සමස්ත වියදම්		129,346,727	124,350,146
බදු පෙර ලාභය		14,683,781	154,202,781
ආදායම් බදු වියදම්	10		
වර්ෂය සඳහා අතිරික්තය		14,683,781	154,202,781

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන්	2017 (රු)	2016 පුනප්‍රකාශිත (රු)
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	11	22,176,135	77,045,881
ආයෝජන	15	184,763,234	87,379,240
ලැබිය යුතු වෙළඳ	16	9,555,164	4,118,021
තොග - ප්‍රකාශන		1,246,995	772,096
තැන්පතු සහ පූර්ව ගෙවීම්	12	4,855,642	13,945,420
ලැබිය යුතු පොළි		9,800,488	4,326,087
වෙනත් ලැබිය යුතු	13	17,819,478	3,102,472
මුළු ජංගම වත්කම්		250,217,136	190,689,217
ජංගම නොවන වත්කම්	14		
දේපළ යන්ත්‍ර සූත්‍ර සහ පිරිවැය	15	455,721,262	460,504,829
දීර්ඝ කාලීන ආයෝජන		176,243,382	165,124,210
මුළු ජංගම නොවන වත්කම්		631,964,644	625,629,039
මුළු වත්කම්		882,181,780	816,318,256
වගකීම්			
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	17	6,608,208	4,272,594
වාපෘති මත අත්තිකාරම් ලැබීම්	18	33,586,149	40,418,819
මුළු ජංගම වගකීම්		**40,194,357**	**44,691,413**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	19	12,615,364	11,567,679
කාර්යයම මණ්ඩල සුබසාධන අරමුදල		2,410,366	2,147,380
විලම්බිත ආදායම් - ප්‍රාග්ධන ප්‍රදාන	20	419,786,540	353,514,579
ව්‍යාපෘති වලට ලැබුණු දීර්ඝකාලීන අත්තිකාරම්	18		11,905,833
මුළු ජංගම නොවන වගකීම්		**434,812,270**	379,135,471
මුළු වගකීම්		**475,006,627**	423,826,884
ශුද්ධ වත්කම්		**407,175,153**	392,491,372
හිමිකම්			
සමුච්චිත අතිරික්තය		**407,175,153**	392,491,372

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව සකස් කර ඇත.

. . . . . .
රධාන මූල්‍ය නිලධාරි

. . . . . .
විධායක අධ්‍යක්ෂ

ආයතනයෙහි පාලක මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමෙහි වගකීම් දරයි.

. . . . . .
සභාප

. . . . . .
අධ්‍යක්ෂ මහා මණ්ඩල සාමාජික

. . . . . .
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

මෙම මූල්‍ය ප්‍රකාශන වලට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ම අත්‍යවශ්‍ය කොටසක් වේ.

. . . . . .
කොළඹ

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2015 දෙසැම්බර් 31 දිනට ශේෂය (පුනප්‍රකාශ කරන ලද)	238,288,591
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය (පුනප්‍රකාශ කරන ලද)	154,202,781
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය (පුනප්‍රකාශ කරන ලද)	392,491,372
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	14,683,781
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**407,175,153**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

මෙහෙයුම් ක්‍රියා ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනය		
බදු ගෙවීමට පෙර අතිරික්තය/(ඌනතාවය)	14,683,781	154,202,781
ගැලපීම්		
සේවක සුභ සුබ සාධක අරමුදලෙහි මාරු කිරීම්	262,986	903,121
දේපල පිරියත හා උපකරණ මත ක්ෂය	11,827,882	18,241,514
ඉඩම් සඳහා මූල්‍ය නොවන රාජ්‍ය ප්‍රදාන මගින් උපයාගත් ආදායම		(151,320,000)
ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රමක්ෂය මගින් ලැබූ ආදායම්	(8,580,945)	(9,364,140)
පාරිතෝෂික ප්‍රතිපාදන / (ප්‍රතිවර්තන)	4,952,911	(645,252)
පොලි ආදායම්	(36,017,937)	(27,051,179)
බොල් ණය සඳහා ප්‍රතිපාදන අඩුවීම	1,079,714	699,209
වත්කම් අලෙවි කිරීම/ කපා හැරීම මත ලාභය / (අලාභය)	(41,000)	195,076
දේපල පිරියත හා උපකරණ නැවත වර්ගීකරණ ගැලපීම්		11,486
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)	11,832,608	(14,127,384)
ලැබිය යුතු වෙළඳ (අඩුවීම)/වැඩිවීම	(6,516,857)	2,759,171
තොග (අඩුවීම)/වැඩිවීම	(474,899)	71,097
තැන්පතු සහ ගෙවීම් (අඩුවීම)/වැඩිවීම	9,089,778	(3,185,523)
ලැබිය යුතු වැට් සහ ජා.ගෙ.බ. (අඩුවීම)/වැඩිවීම		2,305,243
වෙනත් ලැබිය යුතු (අඩුවීම)/වැඩිවීම	(82,641)	(483,912)
අත්තිකාරම් ලැබීම් (අඩුවීම)/වැඩිවීම	(41,890,439)	2,926,010
ගෙවිය යුතු වෙළඳ සහ අනෙකුත් දෑ (අඩුවීම)/වැඩිවීම	2,335,600	(7,136,317)
මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)	(49,372,066)	(17,013,809)
පාරිතෝෂික ගෙවීම්	(3,905,226)	(1,178,190)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)	(53,277,292)	(18,191,999)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් සිදුවූ මුදල් ගලනය		
දේපළ, පිරියත සහ යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම	(7,044,315)	(10,606,983)
ලැබුණු පොළී	33,241,211	22,889,480
දේපළ, පිරියත සහ යන්ත්‍රසූත්‍ර අලෙවි කිරීමෙන් ලැබුණු ආදායම්	41,000	
ආයෝජන මිලදී ගැනීම	(120,214,811)	(51,215,177)
ආයෝජන වික්‍රිමෙන් ලැබුණු ආදායම්	63,932,441	4,514,213
ආයෝජන ක්‍රියාකාරකම්වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)	(30,044,474)	(34,418,467)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් සිදුවූ මුදල් ගලනය		
ලැබුණු ප්‍රදාන	23,151,936	26,399,025
ආයොජන භාර අරමුදලෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන	60,218,541	31,503,513
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)	83,370,477	57,902,538
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ (අඩුවීම) / වැඩිවීම	48,711	5,292,072
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 11)	5,748,865	456,783
3 වැනි කාර්තුව අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	5,797,576	5,748,865
(අ) මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳුම		
බැංකුවේ ඇති මුදල්	5,707,576	5,658,865
අත ඇති මුදල්	90,000	90,000
	5,797,576	5,748,865

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

පිහිටි ස්ථානය සහ නෛතික ස්වරූපය

1. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 1988 අංක 53 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවා ඇති අතර 1990 අප්‍රේල් මාසයේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින් විධිමත්, නීත්‍යානුකූල ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා සැපයුම් ස්ථානය අංකය 100/22, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

ප්‍රතිපත්ති දිශානත කරගත් ආර්ථික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.2. සකස් කිරීමේ පදනම

1.2.1. අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයය සහ මුදල් අමාත්‍යාංශය ඒකාබද්ධව ප්‍රකාශයට පත් කර ඇති රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මෙම ප්‍රකාශන සකස් කර ඇත.

1.2.2. මිනුම් පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස ඓතිහාසික පිරිවැය පදනමෙන් සකස් කර ඇත.

1.2.3. අඛණ්ඩභාවය

1.2.4. ආයතනයට පූර්වේක්ෂ අනාගතයෙහි දී ස්වකීය මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට ආයතනයෙහි පාලක මණ්ඩලය සෑහීමකට පත්වෙති. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි අඛණ්ඩභාවය පදනම් කරගෙන සකස් කර ඇත.

1.3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කරන සෑම වර්ෂයකටම එක සේ අදාළ වන පරිදි යොදා ගෙන ඇත.

(අ) විදේශ මුදල් ගනු ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. විදේශීය මුදල් ඒකක වලින් සිදු කරනු ලබන ගනුදෙනු මූලිකවම ගනුදෙනුව සිදු කරන දිනය වනවිට පවතින ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි අනුපාතයට වාර්තා කරනු ලැබේ. විදේශීය මුදල් ඒකක වලින් නාමනය කර ඇති මුදල්මය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනය වන විට පවතින අදාළ විදේශීය මුදල් ඒකකවල ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි තත්කාලීන අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්කම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගනු ලැබේ.

(ආ) දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභය අඩුකළ පිරිවැයට සඳහන් කරනු ලැබේ.

පසුව කරනු ලබන වියදම්

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ අලුත් වැඩියා වියදම් ද ඇතුළුව වෙනම ම ගණන් ගනු ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනීත කරනු ලැබේ. පසුව සිදු කරනු ලබන අනෙකුත් වියදම් මගින් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයෙහි අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩිදියුණු වූ විට පමණක් එම වියදම් ප්‍රාග්ධනීත කරනු ලැබේ. අනෙකුත් සියලුම වියදම් දරන ලද වියදමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පදනම් කර කර ගෙන වාර්ෂිකව පහත සඳහන් වන අනුපාත යොදා ගනිමින් සරල රේඛීය කමයට ක්ෂය ගණනය කරනු ලැබේ:

පරිගණක උපකරණ	33%
වෙබ් පිටු සැලසුම්	33%
මෝටර් සයිකල්	10%
ලීබඩු	10%
කාර්යාල උපකරණ	10%
මෝටර් වාහන	10%
පුස්තකාල පොත්	25%
ගොඩනැගිලි	2%

වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදීම සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ජීවිත කාලය පෙර වර්ෂයෙහි ඇස්තමේන්තු කරන ලද කාලයට වඩා වෙනස් වී ඇත්නම්, එම වෙනස්කම් පිළිබිඹු වන පරිදි සංශෝධන සිදු කරනු ලැබේ.

වත්කමක් භාවිතය සඳහා සූදානම්ව තිබෙන අවස්ථාවේ සිට එම වත්කම ක්ෂය කිරීම ආරම්භ කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා තිබෙන ලෙස වර්ග කරනු ලබන දිනය හෝ එම වත්කම ඉවත් කරනු ලබන දිනය යන දෙකෙන් පූර්වයෙන් යෙදෙන දිනට එම වත්කම ක්ෂය කිරීම අවසන් කරනු ලැබේ.

හානිකරණය

සිද්ධීන් හෝ වාතාවරණයන්හි වෙනස්වීම් මගින් වත්කමක ධාරණ අගය නැවත අය කර ගත නොහැකි බවට පෙනී යන ඕනෑම අවස්ථාවක හානිකරණය සඳහා එම දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි මුදලට වඩා වැඩි නම්, එම වත්කමෙහි ධාරණ වටිනාකම එකෙනෙහිම එහි නැවත අයකර ගත හැකි අගයට ලියා තබනු ලැබේ.

(ඇ) කල්බදු

වත්කම් කල්බදු දීමක් යටතේ බදු දීමනාකරු විසින් හිමිකාරීත්වයෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සඵල ලෙස රඳවා ගනු ලබන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු යටතේ වන ගෙවීම් කල්බදු කාලපරිච්ඡේදය පුරා සරල රේඛීය ක්‍රමයක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයයෙහි සටහන් කරනු ලැබේ.

කල්බදු කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර මෙහෙයුම් කල්බදු ගිවිසුමක් අවසන් කරන විට, දණ්ඩනයක් ආකාරයෙන් බදු දීමනාකරු වෙත කිසියම් ගෙවීමක් සිදු කිරීමට තිබේ නම්, එම ගෙවීම එකී බදු ගිවිසුම අවසන් වීම සිදු කරන ලද කාල පරිච්ඡේදය තුළ දරන ලද වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඈ) ආයෝජන

ආයෝජන ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් / ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම්, භාණ්ඩාගාර බැඳුම්කර සහ සාංගමික ණයකරවලින් සමන්විත වේ.

i. ස්ථාවර තැන්පතු

ස්ථාවර තැන්පතුවල තිබෙන ආයෝජන ඒවායෙහි පිරිවැයට ගණන් ගනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට උපචිත වන පෙළිය ලැබිය යුතු පොළී ලෙස දක්වනු ලැබේ.

ii.භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්

භාණ්ඩාගාර බිල්පත්වල සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්වල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට පොළිය එකතු කළ පිරිවැයට දක්වනු ලැබේ.

iii. භාණ්ඩාගාර බැඳුම්කර

භාණ්ඩාගාර බැඳුම්කරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ.
ආයතනයට මෙම ආයෝජන කල්පිරීම දක්වා තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජනයන් (ජංගම නොවන) ලෙස වර්ග කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

iv. සාංගමික ණයකර

සාංගමික ණයකරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ.
ආයතනයට මෙම ආයෝජන කල්පිරීම දක්වා තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජනයන් (ජංගම නොවන) ලෙස වර්ග කරනු ලැබේ

(ඉ) ප්‍රාග්ධන ප්‍රදාන

ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (බණී) 20 - රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණය සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශවලට අනුකූලව වාර්තා කරනු ලැබේ. දේපළ, පිරියත සහ යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීමට අදාළ ප්‍රදාන ජංගම නොවන වගකීම් යටතේ විලම්බිත ආදායම් ලෙස ඇතුළත් කර, අදාළ වත්කම් ක්ෂය වීමේ පදනමට අනුකූල වන පදනමක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

මුදල්මය නොවන ස්වරූපයේ රජයේ ප්‍රදාන (ප්‍රදාන සහ වත්කම් යන දෙකම) ඒවායෙහි සාධාරණ වටිනාකමට ගණන් ගනු ලබන අතර, එවැනි ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඊ) තොග

ප්‍රකාශන තොග වලින් තොග සමන්විත වේ. ප්‍රකාශන ඒවායෙහි පිරිවැයට සඳහන් කරනු ලැබේ. වසර දහයකට (10) වැඩි කාලයක් තබා ගෙන තිබෙන ප්‍රකාශන තිබේ නම් ඒවා සෙමින් චලනය වන තොග ලෙස සලකා කපා හැර ඇත.

(උ) අය විය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවායෙහි අපේක්ෂිත උපලබ්ධි අගයට ධාරණය කරනු ලැබේ. ණයගැතියන් අබණ්ඩව සිදු කෙරන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. අයකර ගත නොහැකි යැයි හඳුනාගෙන තිබෙන ණය එසේ හඳුනාගත් වර්ෂය තුළදී කපා හරිනු ලැබේ.

අඩමාන ණය සඳහා වෙන් කළ යුතු ප්‍රතිපාදන හඳුනා ගැනීම පිණිස එක් එක් හානිකරණය තක්සේරු කිරීමේ ක්‍රමය යොදා ගනු ලැබේ. මාස 03 සිට මාස 06 දක්වා පැරණි ශේෂ සඳහා 10% ක් ද, මාස 06 සිට මාස 12 දක්වා පැරණි ශේෂ සඳහා 50% ක් ද, මාස 12 වැඩි ශේෂ සහිත ණය ගැතියන් සඳහා 100% ක් ද වශයෙන් එක් එක් හානිකරණයවූ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

(ඌ) මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් හා සමාන දෑ බැංකුවේ තිබෙන මුදල්, අත ඇති මුදල්, කෙටි කාලීන තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැංකු සමග එළඹ ඇති මාස තුනකට අඩු කල්පිරීමේ කාලයක් සහිත ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම්, සහ බැංකු අයිරා ශුද්ධ අගයෙන් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහිදී බැංකු අයිරා මාස තුනක හෝ එයට අඩු කල්පිරීමේ කාලයක් සහිත ජංගම වගකීම් යටතේ ඇතුළත් කර ඇත.

(එ) බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් ඉල්ලීම මත ගෙවීමට ඇති හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට ඇති වගකීම් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට වර්ෂයක කාලයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන වගකීම් ජංගම නොවන වගකීම්වලට අයත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගණන් ගෙන තිබේ.

අතීත සිද්ධීවල ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් සිදු වීම අවශ්‍ය වීමේ සසම්භාවිතාවක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

බොහෝ දුරට මෙම ආයෝජනවල කෙටි කාලීන කල් පිරීමේ කාලය හේතුවෙන් මුදල් සහ කෙටිකාලීන ආයෝජන, වෙළඳ ලැබිය යුතු දෑ, වෙළඳ ගෙවිය යුතු දෑ සහ අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් ඒවායෙහි ධාරණ අගයට ආසන්න වන බවට කළමනාකරණය විසින් තක්සේරු කර තිබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(ඒ) සේවක ප්‍රතිලාභ

i. නිර්වචිත දායක සැලසුම්

ආයතනයෙහි සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, එම අරමුදල් දෙක සඳහා මෙම ආයතනය සේවකයින්ගේ මූලික වේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවයි.

ii. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම

ආයතනය විසින් ප්‍රක්ෂිප්ත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ආයුගණකයෙකුගේ උපදෙස් මත නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් වන පාරිතෝෂිකයේ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මනිනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභ මෙම සැලසුමට සහභාගීවන සේවකයින්ගේ ඉතිරි සාමාන්‍ය වැඩකරන අපේක්ෂිත ජීවිත කාලය පුරා ආදායම් හෝ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඔ) ආදායම් හඳුනාගැනීමෙ

i. ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය

ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

ii. ව්‍යාපෘති ආදායම්

ව්‍යාපෘති ආදායම් ඉටුකිරීමට භාර ගෙන ඇති ව්‍යාපෘතිවල නිම කර ඇති අදියර පදනමෙන් හඳුනා ගනු ලැබේ. වැඩ නිම කර එහෙත් සේවාදායකයින් වෙත බිල්පත ලබා දී නොමැති ව්‍යාපෘති සකස් කෙරෙමින් පවතින බිල්පත් ගිණුමෙහි වාර්තා කරනු ලැබේ. ව්‍යාපෘතිවලින් ලැබෙන අත්තිකාරම් විලම්බිත ආදායම් ලෙස වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

iii. සම්මන්ත්‍රණ / වැඩමුළු වලින් ලැබෙන ආදායම

සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා අවසන්වූ විට එම සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබෙන ආදායම උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

iv.පොළී ආදායම

පොළී ආදායම උපචිත පදනමකින් ගණන් ගනු ලැබේ.

(ඕ)

i. ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම

ව්‍යාපාර කටයුතු කිරීම සඳහා යොදා ගනු ලබන හෝ ව්‍යාපාරයෙහි ආදායම් ඉපැයීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ii. පුනරාවර්තන වියදම් වර්ගීකරණය කිරීම

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් ආයතනයෙහි කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කෙරෙන බව පාලක මණ්ඩලයෙහි මතය වන බැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගත කරගෙන ඇත.

2. ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන

ආයතනයෙහි උපයෝගීතා සහ නඩත්තු වියදම් සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

3. ව්‍යාපෘති ආදායම

ආයතන වලින් ලැබුණු ආදායම

	2017 (රු)	2016 (රු)
ආයතනවලින් ලැබුණු ආදායම	53,236,088	25,027,771

4. අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ ආයතනයෙන් ලැබුණු ආදායම ඔඔෂ ප්‍රදාන

	2017 (රු)	2016 (රු)
කාලපරිච්ඡේදය සඳහා ඔඔෂ ප්‍රදාන	25,986,931	24,085,393

අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ ආයතනයෙහි ඔඔෂ ප්‍රදාන 2 වැනි අදියර යටතේ හඳුනාගත් ආදායමෙහි කොටස මෙයින් පෙන්නුම් කෙරෙයි. 2014 ඔක්තෝබර් 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර 4ඃ ක කාලයක් සඳහා වන කැනඩා ඩොලර් 950,000 ක් වූ එම ප්‍රදානයෙහි 2 වැනි අදියර ලබා ගැනීම සඳහා ආයතනය සුදුසුකම් ලැබුවේය. පර්යේෂණවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට, ආයතනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට සහ ප්‍රතිපත්ති සබැඳි සහ සංනිවේදන සහ විහිදුම් වැඩි දියුණු කිරීමට මෙම ප්‍රදානයන් යටතේ ලැබෙන අරමුදල් යොදා ගනු ලැබේ.

5.සම්මන්ත්‍රණ සහ වැඩමුළුවලින් ලැබුණු ආදායම

මෙය පරිත්‍යාග ලබා දෙන්නන්ගේ ඉල්ලීම මත, ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ වැඩ පිළිබඳ ප්‍රචාරණය කිරීමේ ක්‍රමයක් ලෙස පවත්වන ලද මෙම සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබුණු ආදායමෙන් සමන්විත වේ.

6.විවිධ ආදායම්

	2017 (රු)	2016 (රු)
ප්‍රකාශන අලෙවි කිරීම	505,396	728,525
වෙනත් ආදායම්	173,680	208,469
පරිත්‍යාග		1,000,000
	679,086	1,936,994

7. සේවක පිරිවැය

	2017 (රු)	2016 (රු)
ප්‍ර.අ.ආ. කාර්ය මණ්ඩල වැටුප්	46,485,828	47,829,936
සේ.අ.අ.	5,269,136	5,260,206
සේ.නි.භා.අ.	1,317,284	1,315,051
සංවේතනය	2,677,086	3,421,302
සෞඛ්‍ය ප්‍රතිලාභ සහ ගාස්තු	1,568,974	1,581,313
වෙනත් ප්‍රතිලාභ	169,373	344,800
පාරිතෝෂික සඳහා වෙන් කිරීම් / ප්‍රතිවර්තන (සටහන 19)	4,952,911	(645,252)
	62,440,592	59,107,356

7.1 සංවේතනය

	2017 (රු)	2016 (රු)
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් ගෙවන ලද දීමනා ඇතුළත් වේ	72,000	60,000

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

8. පර්යේෂණ පිරිවැය

	2017 (රු)	2016 (රු)
මුද්‍රණ සහ පරිගණක යතුරුලියන ප්‍රකාශන ගාස්තු	843,688	1,267,459
අන්තර්ජාල ගාස්තු	3,839,472	2,942,993
උපදේශක ගාස්තු	4,990,970	3,656,293
ක්ෂේත්‍ර චාරික	6,779,776	2,499,537
ව්‍යාපෘති සම්බන්ධ ප්‍රචාරණ වියදම්	2,630,339	1,963,443
ව්‍යාපෘති සම්බන්ධ වත්කම් පරිත්‍යාග	3,976,980	
වෙනත් පර්යේෂණ පිරිවැය	3,883,636	1,275,411
	26,944,861	13,605,136

9. වෙනත් මෙහෙයුම් වියදම්

	2017 (රු)	2016 (රු)
ලියාපදිංචි සහ සාමාජික ගාස්තු	490,620	478,698
කාර්යාල පිරිවැය	4,643,998	4,894,232
දීර්ඝ කාලීනව පැවති අය විය යුතු වැටි බදු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්		2,305,242
පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	218,400	147,546
වෘත්තීයවේදී සහ නීති ගාස්තු	2,516,813	2,317,419
විගණන ගාස්තු	262,200	230,000
වෙළඳ දැන්වීම්	471,572	65,041
බැංකු ගාස්තු / කොමිස්	152,184	143,723
වෙනත් පරිපාලන සම්බන්ධ වියදම්	1,809,100	463,586
බොල් ණය සඳහා වෙන් කිරීම් / (ප්‍රතිවර්තන) (සටහන 9.1)	(1,079,714)	(699,209)
පෙර වර්ෂයේ නිවැරදි කිරීම්		3,266,201
	9,485,173	13,612,479

9.1 රු. 1,147,747 ක ප්‍රතිපාදනය 2014 වර්ෂයේ සිට තරුණ කටයුතු සහ හැකියා සංවර්ධන අමාත්‍යාංශයෙන් අයවිය යුතුව තිබූ දීර්ඝ කාලීන හිග ශේෂය සඳහා වෙන් කරන ලද අතර 2017 වර්ෂයේදී එම මුදල අයකර ගන්නා ලද බැවින් එම ප්‍රතිපාදනය ප්‍රතිවර්තනය කිරීමට සිදු විය. මෙම වර්ෂය තුළදී පවතින වර්ෂයේ දීර්ඝ කාලීන හිග ශේෂ වෙනුවෙන් රු. 68,033 ක ශුද්ධ ප්‍රතිපාදනයක් වෙන් කරන ලදී.

2016

රු.699,209 ක ප්‍රතිපාදනය 2015 වර්ෂයේ පැවති දීර්ඝ කාලීන හිග ශේෂය සඳහා වෙන් කරන ලද අතර, 2016 වර්ෂයේදී එම මුදල අයකර ගන්නා ලද බැවින් සමස්ත ප්‍රතිපාදනය ප්‍රතිවර්තනය කරන ලදී.

10. ආදායම් බදු වියදම

ප්‍රවර්තන බදු වියදම

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ලාභය සහ ආදායම 1958 අංක 53 දරණ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතෙහි 19(4) වගන්තිය ප්‍රකාරව බදු වලින් නිදහස් කර ඇත.

11. මුදල් සහ මුදල් හා සමාන දෑ

	2017 (රු)	2016 (රු)
බැංකුවේ ඇති මුදල්	3,173,051	4,020,240
කෙටි කාලීන තැන්පතු ගිණුමෙහි ඇති මුදල්	2,534,525	1,250,000
සුළු මුදල්	90,000	90,000
සාංගමික ණය කාඩ්පත්		388,625
මාස 03 ට අඩු කාලයක් තබා ගෙන ඇති ආයෝජන		
ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ ඇති ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත්	16,378,559	71,297,016
	22,176,135	77,045,881

සේවක සුභසාධන අරමුදල සඳහා සිදු කරන ලද රු. 1,000,444.00 ක ආයෝජනයක් ද 2016 ආයෝජන වටිනාකමට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

12. තැන්පතු සහ පූර්ව ගෙවීම්

	2017 (රු)	2016 (රු)
පූර්ව ගෙවීම් (සටහන 12.1)	4,220,042	7,158,910
තැන්පතු	278,150	319,750
වෙනත් අත්තිකාරම් (12.2)	357,450	6,466,760
	8,455,642	13,945,420

12.1 පූර්ව ගෙවීම්

	2017 (රු)	2016 (රු)
වෛද්‍ය රක්ෂණය	675,034	549,663
වෙනත් රක්ෂණ	233,812	972,570
වෙනත් පූර්ව ගෙවීම්	3,311,196	5,636,677
	4,220,042	7,158,910

12.2 වෙනත් අත්තිකාරම්

	2017 (රු)	2016 (රු)
දීර්ඝ කාලීන පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධ අත්තිකාරම් ගෙවීම්	350,950	2,755,200
සමීක්ෂණ සම්බන්ධ වියදම් සඳහා අත්තිකාරම් ගෙවීම්		1,988,490
සමුළු සම්බන්ධ අත්තිකාරම් ගෙවීම්	6,500	1,246,944
වෙනත් සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම්		476,124
	357,450	6,466,758

13. වෙනත් අයවිය යුතු මුදල්

	2017 (රු)	2016 (රු)
කාර්ය මණ්ඩල ණයගැතියෝ	3,181,120	2,863,544
අයවිය යුතු වෙනත් (සටහන 13.1)	14,638,358	238,928
	17,819,478	3,102,472

13.1 අයවිය යුතු වෙනත්

	2017 (රු)	2016 (රු)
කාර්ය මණ්ඩලය සඳහා ගුවන් ටිකට්පත් වියදම් ප්‍රතිපූරණය සඳහා පරිත්‍යාගශීලීන්ගෙන් ලැබිය යුතු		202,428
ආයෝජන භාර අරමුදලෙන් ලැබිය යුතු	14,634,365	
වෙනත් ලැබිය යුතු	3,993	36,500
	14,638,358	238,928

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

14. දේපළ, පිරියත උපකරණ

2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම්වල මුළු වටිනාකම රු. 112,991,893/ - (2016: රු. 93,148,650/-)

පිරිවැය	ඉඩම් (රු)	ගොඩනැගිලි (රු)	පරිගණක උපකරණ (රු)	මෝටර් වාහන (රු)	ලීබඩු සහ සවිකිරීම් (රු)	කාර්යාල උපකරණ (රු)	පුස්තකාල පොත් (රු)	එකතුව (රු)
2017 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,168,801	75,963,835	19,014,445	19,344,705	22,928,767	1,717,463	619,138,016
එකතු කිරීම්		259,867	6,744,455			32,141	7,851	7,044,315
අඩුකළා - බැහැර කිරීම්			(1,091,640)			(50,400)		(1,142,040)
අඩුකළ - වත්කම් කපාහැරීම්	-	-	-	-	-	-	-	-
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	156,000,000	324,428,668	81,616,650	19,014,445	19,344,705	22,910,508	1,725,314	625,040,291
සමුච්චිත ක්ෂය								
2017 ජනවාරි 01 දිනට ශේෂය		38,397,579	66,832,204	10,925,403	19,161,649	21,860,433	1,455,919	158,633,187
ක්ෂය ගාස්තු		6,484,093	4,025,999	1,011,648	24,336	136,480	145,325	11,827,882
අඩුකළා - බැහැර කිරීම්			(1,091,640)			(50,400)		(1,142,040)
අඩුකළ - වත්කම් කපාහැරීම්								
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය		44,881,672	69,766,563	11,937,051	19,185,985	21,946,513	1,601,244	169,319,029
2017 දෙසැම්බර් 31 දිනට	156,000,000	279,546,996	11,850,087	7,077,394	158,720	963,995	124,070	455,721,262

දේපළ, පිරියත සහ උපකරණ (ඉතිරි කොටස)

පිරිවැය	ඉඩම් (රු)	ගොඩනැගිලි (රු)	පරිගණක උපකරණ (රු)	මෝටර් වාහන (රු)	ලීබඩු සහ සවිකිරීම් (රු)	කාර්යාල උපකරණ (රු)	පුස්තකාල පොත් (රු)	එකතුව (රු)
2016 ජනවාරි 01 දිනට ශේෂය		323,359,366	75,268,238	19,165,045	19,345,468	22,244,239	1,814,090	461,196,446
එකතු කිරීම් (පුනප්‍රකාශිත)	156,000,000	809,435	9,107,569			684,528	5,450	166,606,982
අඩුකළා: ප්‍රතිවර්ගීකරණ ගැළපුම්			(7,946,972)	(150,630)	(763)		(102,077)	(8,200,412)
අඩුකළා - බැහැර කිරීම්								
අඩුකළ - වත්කම් කපාහැරීම්			(465,000)					(465,000)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය (පුනප්‍රකාශිත)	156,000,000	324,168,801	75,963,835					
සමුච්චිත ක්ෂය								
2016 ජනවාරි 01 දිනට ශේෂය		31,924,622	67,512,911	8,910,663	18,816,246	20,282,621	1,403,460	148,850,523
ක්ෂය ගාස්තු		6,472,957	7,526,189	2,165,340	345,403	1,577,812	143,813	18,241,514
අඩුකළා: ප්‍රතිවර්ගීකරණ ගැළපුම්			(7,946,972)	(150,600)			(91,354)	(8,188,926)
අඩුකළා - බැහැර කිරීම්								
අඩුකළ - වත්කම් කපාහැරීම්			-269924					(269,924)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය		38,397,579	66,822,204	10,925,403	19,161,649	21,860,433	1,455,919	158,633,187
2016 දෙසැම්බර් 31 දිනට	156,000,000	285,771,223	9,141,631	8,089,042	183,057	1,068,334	261,544	460,504,829

සටහන:

1. කපා හරින ලද වත්කම් රු. 465,000/- ක වටිනාකමක් තිබූ පුස්තකාල ස්කැනරයකින් සහ 2016 ජූනි මස වන විට රු. 269,954/- ක් වූ සමුච්චිත ක්ෂය වලින් සමන්විත විය. ස්කැනරය පිළිස්සුණු අතර එයට සිදුවූ හානිය රක්ෂණයෙන් අය කර ගන්නා ලදී.

2. ආයතනයෙහි කාර්යාල ගොඩනැගිල්ල වර්ෂ 2005 සිට 2035 දක්වා වන මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ ලබා ගත් ඉඩමක ඉදිකරන ලදී. ආයතනය ඉඩමෙහි කුලිය ලෙස රුපියල් මිලියන 10.2 ක කල්බදු කුලියක් ගෙවන ලද අතර එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වාර්තා කර ඇත. මෙම ඉඩම සම්පූර්ණ ප්‍රදානයක් ලෙස ලබා ගැනීම සඳහා 2014 වර්ෂයේදී ආයතනය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය මූලික අනුමැතිය ලැබුය. 2014 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රජයට කිසිදු කුලියක් නොගෙවන ලද බැවින් මෙම කුලිය මේ වන විට උපචිත වී තිබේ. 2016 වර්ෂයේදී එම ඉඩම සම්පූර්ණ ප්‍රදානයක් ලෙස ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට අනුමැතිය ලැබුය. තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් කරන ලද තක්සේරුවට අනුව එම ඉඩමෙහි සාධාරණ වටිනාකම රු.මි. 156 ක් විය. එකවර මිලදී ගැනීමෙහි සම්පූර්ණ වටිනාකම සාධාරණ වටිනාකමෙන් 10% ක්, එනම් රු.මි.15.6 ක් වේ. ඒ අනුව ගෙවා ඇති මුදල් අඩු කිරීමෙන් පසුව ගෙවීමට ඇති ශේෂය ආයතනය වෙත දැනුම් දෙන ලදී. එසේ හෙයින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති ඉඩම් සඳහා වන මුදල් නොවන රජයේ මුළු ප්‍රදානවලට මේ වන විටත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වාර්තා කර ඇති රු.මි. 10.92 ක කුලි වියදම ද, ආයතනය වෙත ප්‍රදානයක් ලෙස ලබා ඒ ඇති, සාධාරණ වටිනාකම වන රු.මි. 140.4 ද ඇතුළත් වේ. තවද, එකවර ලබා ඒ ඇති ප්‍රදානය සීමා කිරීම්වලට යටත් වේ. එසේ හෙයින් එය ආයතනයෙහි ක්‍රියාකාරකම් සඳහා පමණක් යොදා ගත හැකි වේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

15. ආයෝජන - කෙටිකාලීන

	2017 (රු)	2016 (රු)
ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ වන භාණ්ඩාගාර බිල්පත් (සෘණද)		10,753,175
ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ වන භාණ්ඩාගාර බිල්පත් (පාරිතෝෂික අරමුදල)		13,601,280
ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ වන භාණ්ඩාගාර බිල්පත් (සේවක සුභසාධක අරමුදල)		1,774,784
ස්ථාවර තැන්පතු - සේවක සුභසාධක අරමුදල	2,910,298	
ස්ථාවර තැන්පතු - පාරිතෝෂික අරමුදල	13,936,856	
ස්ථාවර තැන්පතු	167,916,080	61,250,000
	184,763,234	87,379,240

ආයෝජන - දීර්ඝ කාලීන

දීර්ඝ කාලීන ආයෝජන කල්පිරීම දක්වා රඳවා ගනු ලබන ආයෝජන යටතේ වර්ග කර ඇති පහත සඳහන් ආයෝජන වලින් සමන්විත වේ.

	2017 (රු)	2016 (රු)
භාණ්ඩාගාර බැදුම්කර	99,688,114	99,559,190
සාංගමික ණයකර	76,555,268	65,565,020
	176,243,382	165,124,210

16. ලැබිය යුතු වෙළඳ

	2017 (රු)	2016 (රු)
ලැබිය යුතු වෙළඳ - ව්‍යාපෘති	4,872,973	3,595,547
බොල් ණය සඳහා වෙන් කිරීම්	(733,675)	(1,813,389)
බිල්පත් සකස් කෙරෙමින් පවතින	5,415,866	2,335,901
	9,555,164	4,118,021

17. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු

	2017 (රු)	2016 (රු)
උපචිතයන්	5,363,772	4,236,208
ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු	378	36,386
ණයහිමියෝ	55,200	
සේ.භා.අ. සහ සේ.නි.භා.අ. ගෙවිය යුතු	848,270	
ගෙවිය යුතු උපයන විට බදු	340,588	
	6,608,208	4,272,594

18. ව්‍යාපෘති වලට ලැබුණු අත්තිකාරම්

	2017 (රු)	2016 (රු)
ජනවාරි 01 දිනට ශේෂය	40,418,819	22,999,617
වර්ෂය තුළ ලැබීම්	36,372,118	58,112,792
හඳුනාගත් ආදායම්	(55,110,621)	(28,787,757)
ව්‍යාපෘති වලට ලැබුන දීර්ඝකාලීන අත්තිකාරම්		(11,905,833)
දීර්ඝකාලීන සිට කෙටිකාලීන කාණ්ඩයට මාරු කරන ලද අත්තිකාරම්	11,905,833	
දෙසැම්බර් 31 දිනට ශේෂය	33,586,149	40,418,819

19. සේවක ප්‍රතිලාභ

	2017 (රු)	2016 (රු)
ජනවාරි 01 දිනට ශේෂය	11,567,679	13,903,551
වර්ෂය තුළ හඳුනාගත් වියදම් /ප්‍රතිවර්තනය කරන ලද ප්‍රතිපාදන (සටහන 19.1)	4,952,911	(645,252)
වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	(3,905,226)	(1,178,190)
කාර්ය මණ්ඩලය සඳහා උපචිත ගෙවීම්		(512,430)
දෙසැම්බර් 31 දිනට ශේෂය	12,615,364	11,567,679

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

2017 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක සංඛ්‍යාව 46 ක් වේ.
2017 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන සේවක සංඛ්‍යාව 42 ක් වේ.
මෙම වගකීම් වෘත්තීය ආයුගණක සමාගමක් විසින් තක්සේරු කර ඇත.
මෙම ප්‍රතිලාභ සපයා දීමේ දී ආයතනයට දැරීමට සිදුවන පිරිවැය තීරණය කිරීමේ දී පහත් සඳහන් උපකල්පන යොදා ගෙන ඇත.

වට්ටම් අනුපාතිකය	11% (2016:11%)
වැටුප් අනුපාතිකයෙහි වර්ධනය	7% (2016: 5%)
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය	17% (2016: 7%)

19.1 වර්ෂය තුළ හඳුනාගත් වියදම්

	2017 (රු)	2016 (රු)
වර්තමාන සේවා පිරිවැය	1,171,993	890,030
පොළී පිරිවැය	1,272,444	1,529,391
ආයුගණක (ලාභ) / අලාභ	2,508,474	(3,064,673)
	4,952,911	(645,252)

20. ප්‍රමාද වී ලැබුණු ආදායම් - ප්‍රාග්ධන ප්‍රධාන

	ගොඩනැගිල්ල සඳහා ප්‍රදාන (රු)	භාර අරමුදලින් ලැබුණු ප්‍රදාන 2017 (රු)	එකතුව (රු)
ජනවාරි 01 දිනට ශේෂය	274,648,562	78,866,017	353,514,579
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු ප්‍රදාන		74,852,906	74,852,906
වර්ෂය තුළ ක්‍රමක්ෂය	6,242,013	(2,338,932)	(8,580,945)
දෙසැම්බර් 31 දිනට ශේෂය	268,406,549	151,379,991	419,786,540

	ගොඩනැගිල්ල සඳහා ප්‍රදාන (රු)	භාර අරමුදලින් ලැබුණු ප්‍රදාන 2016 (රු)	එකතුව (රු)
ජනවාරි 01 දිනට ශේෂය	280,890,575	50,484,631	331,375,206
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු ප්‍රදාන		31,503,513	31,503,513
වර්ෂය තුළ ක්‍රමක්ෂය	(6,242,013)	(3,122,127)	(9,364,140)
දෙසැම්බර් 31 දිනට ශේෂය	274,648,562	78,866,017	353,514,579

21. කල් බදු වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට කල් බදු වගකීම් නැත. (2016: නැත)

22. ප්‍රාග්ධන වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට ප්‍රාග්ධන වගකීම් නැත. (2016: නැත)

23. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ආයතනයෙහි ආයෝජන භාර අරමුදලෙහි (භාර අරමුදල) 2017 දෙසැම්බර් 31 දිනට රු. 502,113,792/- ක ශුද්ධ වත්කම් වටිනාකමක් තිබුණි. (2016: රු. 502,635,253/-). වෙනම ම විගණනය කරනු ලබන ආයෝජන භාර අරමුදල සඳහා වෙනම ම ගිණුම පවත්වාගෙන යනු ලැබේ. මෙම භාර අරමුදල භාරකරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් දෙදෙනෙකු නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ (ප්‍රතිපත්ති අධ්‍යාපන ආයතනයෙහි සභාපතිවරයා සහ විධායක අධ්‍යක්ෂ). මෙම වර්ෂය තුළ දී ආයතනයෙහි මෙහෙයුම් සඳහා දායකත්වය වශයෙන් ආයෝජන භාර අරමුදලෙන් ප්‍රදාන ලබා ගෙන නැත (2016: රු.23,000,000/-). තවද ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 60,218,541/- ක් ලැබුණු අතර (2016: රු.31,503,513), රු. 14,634,365/- ක් ලැබිය යුතුව තිබේ.
පුනරාවර්තන වියදම් සඳහා ශ්‍රී ලංකා රජය විසින් රු. 13,750,000/- ක මුදලක් ආයතනයට ප්‍රදානය කරන ලදී. ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, මහ බැංකුවේ අධිපති සහ ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පාලක මණ්ඩලයට නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

24. අවිනිශ්චිත වගකීම්

මූල්‍ය ප්‍රකාශන දිනය වන විට අවිනිශ්චිත වගකීම් නොතිබුණි.

25. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවුණු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවලට හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් වල ගැළපීම් සිදුකිරීම අවශ්‍ය කරන සිදුවීම් සිදුවී නැත.

26. සන්දනාත්මක සංඛ්‍යා

ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය තැන්හිදී සංසන්දනාත්මක සංඛ්‍යා පුනප්‍රකාශ කර ඇත. විස්තර සඳහා සටහන් 28 බලන්න.

27. පාලක මණ්ඩලයේ වගකීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

28. ශේෂ පුනප්‍රකාශනය

මෙම ශේෂ පුනප්‍රකාශනය ඉඩම සඳහා රජයෙන් ලැබුණ මුදල්මය නොවන ප්‍රදානය ගිණුම්ගත කිරීම සහ මූලික දායකත්වය සමුච්චිත අතිරික්තය යටතේ වාර්තා කිරීම හේතුවෙන් සිදු කරන ලදී. එම ගැලපීම් සහ මූල්‍ය ප්‍රකාශන මත එයින් ඇති වන බලපෑම පහත සඳහන් පරිදි වේ:

(1) ඉඩම සඳහා රජයෙන් ලැබුණු මුදල්මය නොවන ප්‍රදානයෙහි මුළු වටිනාකම ගෙවන ලද තක්ෂ්‍ය ගණන වන රු.මි. 15.6 ලෙස ගණන් බලා ඇත. කෙසේ වෙතත්, මේ වන විට එය ඉඩමෙහි සාධාරණ වටිනාකම වන රු. මි. 156.0 පෙන්වීම පිණිස ගැළපීම් කර ඇත. රු. මි. 140.4 ක වෙනස ඉඩම සඳහා රජයෙන් ලැබුණු මුදල්මය නොවන ප්‍රදාන යටතේ ගිණුම්ගත කර ඇත.

(2) මූලික වත්කම් මාරු කිරීම් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි වෙනම ම ලියම අයිතමයක් ලෙස "රජයේ /ප්‍රදායක විසින් සිදුකරන ලද මූලික වත්කම් මාරු කිරීම්" යටතේ පෙර ගිණුම්ගත කර ඇත. මෙය හිමිකරුවන්ගේ දායකත්වයක් නොවන නිසා එම ශේෂය දැනට සමුච්චිත අතිරික්තය යටතේ වර්ග කර ඇත.

2016 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය මත බලපෑම

	පෙර ප්‍රකාශිත	වැඩිවීම/(අඩුවීම)	පුනප්‍රකාශිත ශේෂය
ඉඩම් සඳහා රජයෙන් ලැබුන මූල්‍ය නොවන ප්‍රදාන	10,920,000	140,400,000	151,320,000
සමස්ත ආදායම	138,152,927	140,400,000	278,552,927
වර්ෂය සඳහා අතිරික්තය	13,802,781	140,400,000	154,202,781

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මත බලපෑම

	පෙර ප්‍රකාශිත	වැඩිවීම/(අඩුවීම)	පුනප්‍රකාශිත ශේෂය
රජය /ප්‍රදායකයා විසින් සිදුකරන ලද මූලික වත්කම් මාරු කිරීම්	2,144,144	(2,144,144)	
2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අතිරික්තය	236,144,447	2,144,144	238,288,591
2016 වර්ෂය සඳහා අතිරික්තය	13,802,781	140,400,000	154,202,781

2016 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මත බලපෑම

	පෙර ප්‍රකාශිත	වැඩිවීම/(අඩුවීම)	පුනප්‍රකාශිත ශේෂය
මුළු ජංගම නොවන වත්කම්	485,229,039	140,400,000	625,629,039
ශුද්ධ වත්කම් / හිමිකම්	252,091,372	140,400,000	392,491,372

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

29. නිකුත්කර ඇති එහෙත් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති ප්‍රමිත

නිකුත්කර ඇති එහෙත් 2017.12.31 දිනය වන විට ක්‍රියාත්මක නොමැති "ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 11 - විනිමය නොවන ගනුදෙනු" ප්‍රමිතිය ආයතනය විසින් අදාළ කරගෙන නැත. එම නව ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම මගින් ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන සඳහා පහත සඳහන් බලපෑම් ඇති වනු ඇත.

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය මත බලපෑම

	වැඩිවීම / (අඩුවීම)
සමස්ත ආදායම	74,852,906
වර්ෂය සඳහා අතිරික්තය	74,852,906

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මත බලපෑම

	වැඩිවීම / (අඩුවීම)
ජංගම නොවන වගකීම්	(74,852,906)
ශුද්ධ වත්කම් / හිමිකම්	74,852,906

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/සී/අයිපීඑස් /1/17/01

මගේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 15 දින

සභාපති

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 09 දරන පනතින් සංශෝධිත 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 සැප්තැම්බර් 21 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතයයි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.115,394,076 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.14,683,781 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.154,202,781 ක් ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 139,519,000 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉඩම් සඳහා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය රු.151,320,000 ක් ඉකුත් වර්ෂයේ ආදායම තුල ඇතුළත් වීම ඉහත පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අතිරික්තයක් පැවතිණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.68,837,107 ක් වූ දායකත්වය 2014 වර්ෂයේදී රු.74,018,254 දක්වා වර්ධනය වී 2015 වර්ෂයේ දී රු.73,390,333 ක් දක්වා අඩුවී තිබුණි. එසේවුවද 2016 වර්ෂයේදී රු.220,274,231ක වර්ධනයක් වූ අතර නැවත 2017 වර්ෂයේදී රු.72,997,491 ක් දක්වා අඩුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය ප්‍රකාරව ආයතනයේ කටයුතු කෙටිකාලීන සහ දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කිරීමට අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක කරා ළඟාවීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීම ආයතනයේ පූර්ණ වගකීමවූවද ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඉකුත් වර්ෂය තුළදී අවසන් කිරීමට නොහැකිවූ පර්යේෂණ ව්‍යාපෘති ඇතුළත් කර තිබූ අතර එම කාර්යභාරයන් ඉටුකිරීමට අපේක්ෂිත කාල වකවානු ක්‍රියාකාරී සැළැස්මේ ඇතුළත් කර නොතිබුණි. ඒ හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය මැනීමට නොහැකිවිය.

4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතට අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

(i) පනතේ 5(උ) ඡේදය අනුව ආයතනයේ පරමාර්ථවලට සමාන අරමුණු සහිත පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි පර්යේෂණ ආයතනය සමඟ සම්බන්ධ කමිටු පිහිටුවා පවත්වාගෙන යාම සහ ඒ ආයතනය සමඟ සහයෝගයෙන් හා ඒ සම්බන්ධව ක්‍රියා කිරීම පිණිස පහසුකම් සැලසීම.

(ii) පනතේ 12(1) වගන්තිය අනුව ආයතනයේ ආධාරය හා සහාය ඇතිව භාරගනු ලැබිය යුතු ප්‍රතිපත්ති අධ්‍යයන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම පිණිස පර්යේෂණ උපදේශක කමිටුවක් (Research Advisory committee) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර නොතිබීම.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් පර්යේෂණ ව්‍යාපෘති 37 කින් රු.53,326,088 ක ආදායමක් උපයාගෙන තිබුණි. එසේවුවද ආයතනය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට පර්යේෂණ ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රගතිය දැක්වෙන කාර්යසාධන වාර්තාවක් සකස් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ වැඩ අවසන් නොවූ පර්යේෂණ අංශ 05 කට අයත් වූ පර්යේෂණ ව්‍යාපෘති 14 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු අතර ඒ සඳහා රු.32,122,534 ක ආදායමක් ඇස්තමේන්තු ගත කර තිබුණි. එම පර්යේෂණ ව්‍යාපෘති 14 න් සමාලෝචිත වර්ෂය තුළදී පර්යේෂණ ව්‍යාපෘති 07 ක් අවසන් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ වෙනත් පර්යේෂණ ව්‍යාපෘති 05 ක් සඳහා ප්‍රදානකරුවන්ගෙන් රු.13,592,237 ක අත්තිකාරම් මුදල් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ව්‍යාපෘති නිම කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂයේ ප්‍රකාශනයට පත්කළ පොත් වර්ග 11 ක් වෙනුවෙන් පොත් 3100 ක් මුද්‍රණය කිරීම සඳහා රු.818,400 ක් වියදම් කර තිබුණි. මින් පොත් 1662 ක් අලෙවියෙන් රු.505,393 ක ආදායමක් ලැබී තිබූ අතර වර්ෂය අවසානයට ප්‍රකාශන පොත් 1438 ක් ඉතිරිව පැවතුණි. ඒ අනුව අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගැනීමකින් තොරව පොත් මුද්‍රණය කිරීම නිසා වර්ෂය තුළ මුද්‍රණය කළ ප්‍රකාශන පොත් වලින් සියයට 46 ක ප්‍රමාණයක් අලෙවි කිරීමට හෝ බෙදා දීමට නොහැකිව ඉතිරිව තිබුණු අතර 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.1,246,995 ක් වටිනා පොත් 4005 ක් ප්‍රකාශන අංශයේ ඉතිරිව පැවතිණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති අංක DMA /2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 09 වන ඡේදය ප්‍රකාරව කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කළ යුතුය. කෙසේවුවද 2017 වර්ෂයේදී අභ්‍යන්තර විගණන වාර්තා චක්‍රලේඛයේ දක්වා ඇති ඉලක්ක ගත දිනයන්හිදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

6.2 ප්‍රසම්පාදන සැලැස්ම

ආයතනය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද එය 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශයේ සඳහන් ආකෘතිය අනුව සකස් කර නොතිබුණි. එසේම කාල රාමුව නිර්ණය කිරීම සිදුකර නොතිබුණු අතර එම සැලැස්ම නිරතුරුවම අධීක්ෂණය කිරීමද සහ යාවත්කාලීන කිරීමද සිදුකර නොතිබුණි.

6.3 අයවැය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 6.6 සිට සියයට 102.2 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ස්ථාවර වත්කම් කළමනාකරණය	ස්ථාවර වත්කම්හි ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර ප්‍රත්‍යාගණනය නොකිරීම.
(ආ) සැලසුම් සකස් කිරීම	සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැළැස්මක් සකස්කර නොතිබීම හා ක්‍රියාකාරී සැලැස්ම කාලීනව ඇගයීමට ලක් නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

විගණන විමසුම්වලට පිළිතුරු

එල්ඉඩබ්/සී/අයිපිඑස්/1/17/01

මූල්‍ය වාර්තාව විගණන 2017

2.2.1 ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්

වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය නැවත ඇස්තමේන්තු කිරීම සම්බන්ධ විගණක විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශය අපි අනුගමනය කරමු. එසේම, 2017 වර්ෂය තුලදි, වත්කම් වර්ගවල ප්‍රයෝජනවත් ආයු කාලය ප්‍රතිශෝධනය කර ඇත. ගණකාධිකරණ මෘදුකාංගයේ මෙම ප්‍රතිශෝධන ක්‍රියාත්මක කර ඇත. කෙසේවෙතත්, සම්පූර්ණයෙන් ක්ෂයවීම් කරන ලද වත්කම් සඳහා ක්ෂයවීමේ අනුපාතය පද්ධතියේ සංශෝධනය කිරීමට හැකියාවක් නොමැත. එවැනි ප්‍රතිශෝධනයක් සඳහා ඇමරිකානු ඩොලර් 2000 කට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදුවනු ඇත එබැවින් ප්‍රතිශෝධනය සිදුකර නොමැත. පසු විපරම් කටයුතු සහ ප්‍රගතිය විගණන කමිටුව හා පාලන මණ්ඩලය වෙත දැනුම් දී ඇත.

4.1.1 සැලසුම්

(අ) සංයුක්ත සැලසුම්

සියලුම මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරනය වන පරිදි 2013 – 2017 කාල පරිච්ඡේදයන් ආවරණය කරමින් ආයතනික සැලැස්මක් මෙම ආයතනය සතු වේ. තවද, වාර්ෂිකව යාවත්කාලීන කරන ලද ක්‍රියාකාරකම් සැළසුම් කිරීමට අවුරුදු තුනක පරියේෂණ න්‍යාය පත්‍රයක් සකස් කර ඇත.

4.1.2. ප්‍රගතිය සහ සමාලෝචනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ අපගමනය.

(අ) (i) සම්බන්ධීකරණ කමිටුව

අපගේ අන්තර් සබඳතාව පිළිබඳව නිදසුනක් ලෙස පහත උදාහරණය යොදා ගත හැකිය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය Think-Tank-Initiative (http://www.thinktankinitiative.org/), හි කොටසක් වන අතර මෙය ගෝලීය පර්යේෂන ආයතනවල ජාලයක් ද වේ.

(අ) (ii) පර්යේෂන උපදේශක කමිටුව

ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ විශේෂඥයින් IPS පාලක මණ්ඩලයට පත්කර සිටීම පාලක මණ්ඩලයේ ස්වභාවය පිළිඹිබු කරන අතර මේ අය විසින් පර්යේෂණ උපදේශක කමිටුවේ (RAC) කාර්යභාරය ඉටුකරයි. විශේෂයෙන් පාලක මණ්ඩලය IPS පර්යේෂණ කමිටුව විසින් සකස් කරන ලද පර්යේෂණ න්‍යාය පත්‍රයට ඔවුන්ගේ අදහස් සහ මගපෙන් වීම සපයයි.

(ආ) කාර්යසාධන වාර්තාව

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ වාර්ෂික අයවැය විස්තර කරයි, වාර්ෂික අයවැය කාර්යක්ෂමතාව මැනීමේ මෙවලමක් ලෙස භාවිතා වන අතර කාර්යසාධන සමාලෝචනය කාර්තුමය පදනමකින් සිදු කරන ලදී. තවද, පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්තුමය පදනම මත සිදු කරන ලදි.

(ඇ) කාර්යසාධනය හා සමාලෝචනය (තවදුරටත්) එකඟ වී ඇති කාලපරිච්ඡේදයට අනුව පර්යේෂණ ව්‍යාපෘති කටයුතු සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, අපගේ පාලනයෙන් බාහිර සාධක නිසා ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ විය හැකිය. එවැනි අවස්ථාවක දී අමතර දීර්ඝ කිරීමක් සඳහා අමතර කාල රාමුවක් ලබා ගත හැක. 2017 දී සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ විස්තර, ව්‍යාපෘති දීර්ඝ කිරීමේ ලිපි ලේඛන සහ වියදම් නොකළ ශේෂයන් පිළිබඳ තොරතුරු විගණකවරුන්ගේ අවධානයට ලබා දී ඇත.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතාව

ආයතනයේ ප්‍රකාශන ක්‍රියාකාරකම් දැනුම හුවමාරු කිරීමේ අරමුණින් යොදාගෙන ඇත. මුද්‍රණය කිරීමට පිටපත් ප්‍රමාණය තීරණය කිරීමේදී මුද්‍රණ ශිල්පීන්ගේ අවම මුද්‍රණ ප්‍රමාණය මෙන්ම පිරිමැසුම් දායක මිලක් ලබා ගැනීම සඳහාද අප කටයුතු කළ යුතුය. එබැවින් අපට අවම වශයෙන් පිටපත් 100 සිට 150 දක්වා මුද්‍රණය කිරීමට සිදුවේ.

අවසාන ප්‍රකාශන තොගය වන පොත් 4000ක ප්‍රමාණයට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සතු තොග සහ පොත් සාප්පුවල විකිනීමට ඇති ප්‍රමාණය අයත්වේ. එම තොග කාණ්ඩ කිරීම පහත පරිදි වේ.

ප්‍රතිපත්ති ආයතනය සතු තොග ප්‍රමාණය 2945
පොත් සාප්පු සතු තොග ප්‍රමාණය 1060

තොග ඉවත්කිරීම ප්‍රමාදවීම පිළිබඳව ගන්නා ලද ක්‍රියා මාර්ග :

පොත් විකිනීම ප්‍රමාද වීම කාරණය ප්‍රකාශන කමිටුව වෙත යොමු කරන ලද අතර විධායක අධ්‍යක්ෂකතුමාගේ අනුමැතිය ප්‍රකාරව 2017 මාර්තු මස 31 දින "නොමිලේ පොත් දිනය" පවත්වන ලදි.

පර්යේෂණ ආයතනයක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රධාන නිමැවුම එහි ප්‍රකාශනයන් වේ. එබැවින්, අපගේ ප්‍රතිපත්තිය රජයේ, පෞද්ගලික අංශය හා සංවර්ධන පාර්ශවකරුන් ඉලක්ක කරගත් පාර්ශවකරුවන්ට තාග්‍යයන් ලෙස පිටපත් සැපයීමයි. සමහර වියදම් පිරිවැය පියවා ගැනීම සඳහා ප්‍රකාශන විකිණීම සිදුකර ඇති නමුත්, පර්යේෂණ ආයතනයක් ලෙස ඒවායේ වටිනාකම, විකිණුමට එහා ගිය දෙයකි.

ප්‍රතිපත්තිමය කරුණු රජයේ ප්‍රමුඛතාවට පත්වුවහොත් පැරණි ප්‍රකාශනයක් පවා අදාළ විය හැක. ඒ සඳහා ප්‍රකාශන තොග සංචිතයක් පවත්වාගැනීමට අපේක්ෂා කරනු ලබයි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් කලින් කලට වට්ටම් ලබාදීම, පොත් ප්‍රදර්ශන පැවැත්වීම, සරසවි සිසුන්ට පොත් පරිත්‍යාග ආදිය මගින් වරින් වර මෙම සංචිතය අඩු කිරීමට අපේක්ෂා කරනු ලබයි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු සාර්ථකත්වය

අපගේ රේඛීය අමාත්‍යාංශය වන ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් 2030 තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳව අප දැනුවත් කරන ලද අතර එවැනි තොරතුරු ආයතනය තුළ බෙදා හරින ලදි.

අපගේ ආයතනයේ කාර්යභාරය වන්නේ පර්යේෂණ යෙදවුම් සැපයීම වන අතර අප එම අවශ්‍යතාව පහත පරිදි සපුරා තිබේ:

අපගේ කාර්යභාරය :

- පර්යේෂණ භාරගැනීම
- කමිටු රැස්වීම් සඳහා සහභාගි වීම තුලින් අපගේ දැනුම හුවමාරු කිරීම.
- පර්යේෂණ අවශ්‍යතා හඳුනාගෙන ඒවා අපගේ පරියේෂණ න්‍යාය පත්‍රයට ඇතුල් කිරීම.

අප කළ දේ:

ආහාර සුරක්ෂිතතාව, දේශගුණික විපර්යාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, ස්ත්‍රී පුරුෂ භාවය වැනි ඇතැම් අප කරන පර්යේෂණ කිහිපයක්, තිරසාර සංවර්ධන ඉලක්ක 2030 සඳහා ශ්‍රී ලංකාවේ සුදානම - න්‍යාය පත්‍ර සපුරාලීම සඳහා ප්‍රතිපත්ති යෙදවුම් ලබා දීමට අදාල වේ.

විශේෂයෙන්, නිව් යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2018 ජූලි මාසයේ පැවති උසස් මට්ටමේ දේශපාලන සමුළුවේදී (HLPF) ඉදිරිපත් කළ යුතු තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය සකස් කිරීම තිරසාර සංවර්ධනය හා වනජීවී සංරක්ෂණ අමාත්‍යාංශය සමග සහයෝගයෙන් කටයුතු කරන ලදී.

2018 මාර්තු 16 සහ 19 යන දිනයන්හි රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජය, උගත් ප්‍රජාව හා පෞද්ගලික අංශයන්ගෙන් තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ අදහස් ලබා ගැනීමට ප්‍රතිපත්ති අධ්‍යන ආයතනය විසින් මෙම කාර්යය සඳහා විවිධ පාර්ශ්වකරුවන්ගේ උපදේශන වැඩමුළු දෙකක් සංවිධානය කරන ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක 2030 සම්බන්ධ ව්‍යාපෘතියට සම්බන්ධ සියලු ව්‍යාපෘති විස්තර සහ 2018 මාර්තු මස 21 වන තිරසාර සංවර්ධනය හා වනජීවී අමාත්‍යාංශය සමඟ ව්‍යාපෘති පිළිබඳ නියමයන් "කාර්යසාධන විගණන අංශය" වෙත යවා ඇත.

6. වගවීම සහ යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂන සටහන් කර ඇති අතර අනාගතයේදී ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගෙන ඇත.

6.2 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන සැලැස්ම කාල පරාසයන් සමග වර්ධනය කර ඇති අතර කාර්තුමය පසු විපරම් සිදු කරන ලදි. අනාගතයේදි අපි කාලෝචිත සංශෝධන කරන්නෙමු.

6.3. අයවැය පාලනය

ආයතනයේ අයවැය, අරමුදල් කළමනාකරණ මෙවලම ලෙස භාවිතා කරනු ලැබේ. එවැනි වෙනස්කම් අනුමත කිරීම සඳහා පාලක මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ. 2017 වසරයේදි එවැනි සංශෝධන සිදු කර ඇති අතර පාලක සභාව විසින් අනුමැතිය ලබා ගන්නා ලදි.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

100/20, නිදහස් මාවත,
කොළඹ 7,
ශ්‍රී ලංකාව

Tel: +94 11 2143100 Fax: +94 11 2665065
Email: ips@ips.lk, Website: www.ips.lk
Blog: 'Talking Economics' - http://www.ips.lk/talkingeconomics
Twitter: www.twitter.com/TalkEconomicsSL